


පළාත් සභා ලැයිස්තුවේ 21 වන විෂය යටතේ හැවරී ඇති බලතල පරිදි

# ආදායම් උත්පාදනය සඳහා පළාත් සභාවල දායකත්වය

පිළිබඳ

# පර්යේෂණ අධ්‍යයන වාර්තාව



පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
SRI LANKA INSTITUE OF LOCAL GOVERNANCE (SLILG)
(Ministry of Provincial Councils & Local Government & Sports )
17, Malalasekara Mawatha, Colombo - 10
Office: 011-2586259/011-2580307
Fax: 011-2580316/011-2581971
E-mail: info@slilg.gov.lk
Website: www.slilg.lk

# පෙරවදන

1988 දී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරටට පළාත් සභා ක්‍රමය හඳුන්වාදීමත් සමඟම පළාත් මට්ටමින් අදායම් වර්ධනය කරගැනීම උදෙසා අවශ්‍ය බලතලද පළාත් සභා වෙත ලබාදෙන ලදී. එහෙත් ආරම්භයේ සිට මේ දක්වා පළාත් සභා වෙත පැවරුණු බලතල එක් එක් පළාත් සභාව මගින් ක්‍රියාත්මක කොට ඇත්තේද, ඒවායේ සාර්ථකභාවය කෙබඳුද, ඒවා ප්‍රවර්ධනය කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ මේ දක්වා අධ්‍යයනයක් සිදුකොට නොමැත.

පළාත් සභා සතුකොට ඇති බලතල ප්‍රමාණවත් නැතැයි නිරන්තරයෙන් හඬ නගන පසුබිමක ලබාදී තිබෙන බලතල නිසිලෙස භාවිතාකොට පළාත්වල සංවර්ධනය උදෙසා අවශ්‍ය කටයුතු කිරීමට පළාත් සභා යොමුවී ඇත්තේද, අපේක්ෂිත ප්‍රතිඵල ලභාකරගෙන ඇත්තේද යන්න පිරික්සීමත්, ඒ සඳහා ගතයුතු ඉදිරි පියවර මොනවාද යන්න පිළිබඳ නිර්දේශ ඉදිරිපත්කිරීමත් මෙම අධ්‍යයනය තුළින් සිදුකොට ඇත.

විශේෂයෙන් පළාත් සභා සඳහා බලතල පවරා ඇති ලැයිස්තු තුනෙන් පළාත් සභා ලැයිස්තුවේ 21 වන විෂය යටතේ පළාත් තුළ අදායම් උත්පාදනය කරගැනීමට කටයුතු කිරීම මගින් ජාතික ආර්ථිකයට දායකවීමට පළාත් සභා ක්‍රියාත්මක වී ඇත්තේ කෙසේද යන්න සොයාබැලීම මෙම පර්යේෂණයේ විශේෂිත අරමුණක් වේ.

දිවයිනේ පළාත් සභා නවයම ආවරණය වන පරිදි ප්‍රාථමික දත්ත, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් රැස්කරගන්නා ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණය කොට විග්‍රහ කිරීමෙන් හා පර්යේෂකයාගේ ප්‍රයෝගික සොයාගැනීම් හා නිරීක්ෂණ පදනම් කොටගෙන ඉදිරිපත්කොට ඇති නිගමන හා නිර්දේශ සැළකිල්ලට ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ගවලට ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමුකරවීමටද මෙම අධ්‍යයන මගින් කටයුතු කොට ඇත.

මෙම පර්යේෂණය මගින් අනාවරණය කොටගෙන තිබෙන දුර්වලතාවයන් පිළිබඳ අවධානය යොමුකොට තිබෙන බලතල උපරිම මට්ටමින් භාවිතාකොට ඉදිරි ක්‍රියාමාර්ගවලට යොමුවීම තුළින් පළාත් සභාවල අභිවෘද්ධිය අතිකරගැනීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පී.එස් .ධර්මරත්න

නියෝජ්‍ය අධ්‍යක්ෂ(පර්යේෂණ හා සංවර්ධන)

# විධායක සාරාංශය

පළාත් සභා ක්‍රියාත්මක වී මේ වනවිට වසර තිහකට ආසන්න කාලයක් ගතවී ඇත. සෑම පළාත් සභාවක ස්වාධීන ක්‍රියාකාරීත්වය සඳහා බලපාන ප්‍රධානතම සාධකය වන ප්‍රඥප්ති සම්පාදනය සඳහා පළාත් සභා උත්සුක වී ඇති ආකාරය පිළිබඳ එක්තරා පැතිකඩක් මෙහි විස්තර වෙයි.

පළාත් සභාවක් සිය අනන්‍යතාවය තුළ ගමන් කිරීම සඳහා වන වැදගත්ම සධකයක් වනුයේ එහි මූල්‍ය ස්ථාවරත්වයයි. එසේම එවැනි මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම සඳහා ප්‍රඥප්ති සෑදීමට හැකි විධි විධාන අතරින් පළාත් සභා විසින් ප්‍රමාණවත් අවධානය නොදක්වා ඇති ක්ෂේත්‍රයන් වශයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ නව වන උප ලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවේ 21 වන ඡේදය හැඳින්විය හැකි ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛණයෙහි 21 වන ඡේදය මෙසේ සඳහන් වෙයි.

> " සංවර්ධනය හා ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට යටත්ව, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යවසාය හා ව්‍යාපෘති කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය සංස්ථාවලට ඇති බලයට හැනියක් නොමැතිව, පළාත ඇතුළත ප්‍රවර්ධනය කිරීමට, පිහිටුවීමට හා ඒවායේ නිරත වීමට ඇති බලය (පළාත ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පළාත සඳහා කාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ඒ පිළිබඳ සම්බන්ධීකරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ.) "

මෙම ඡේදය යටතේ සාදන ලද ප්‍රඥප්ති මගින් පළාත් සභා ගොඩනගා ගෙන ඇති ස්ථාවරත්වය කෙබඳු ද යන්න මෙම අධ්‍යයනයෙහි මූලික පදනමයි.

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සභා අදාළ කර ගනිමින් සිදු කරන්නට යෙදුණි. එහිදී උතුරු පළාත් සභාව හා නැගෙනහිර පළාත් සභාව විසින් මෙතෙක් ඉහත සඳහන් කරන්නට යෙදුණ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථායෙහි 9 වන උප ලේඛණයෙහි 21 වන ඡේදයට අදාළ එකදු ප්‍රඥප්තියක් හෝ පනවා නොතිබීම විශේෂත්වයකි.

විශේෂයෙන්ම වයඹ පළාත් සභාව මේ සම්බන්ධයෙන් සාදන ලද ප්‍රඥප්ති මගින් ලබාගෙන ඇති සාර්ථකත්වය අනෙකුත් පළාත් සභාවන්ට සාපේක්ෂව අගය කළ යුතුය. එසේම බස්නාහිර පළාත් සභාව ද මේ යටතේ යම් ප්‍රඥප්ති ප්‍රමාණයක් පනවා ගනිමින් කටයුතු කරන්නට යෙදී ඇත.

මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ඇති කරුණු කෙරෙහි අදාළ පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත් පියවරක් බව ද සඳහන් කළ හැකි ය.

පළාත් සභා විසින් ස්වකීය ආදායම් උත්පාදනයට මෙන්ම විවිධ වූ ව්‍යවසායන්ට යොමු වීමෙන් පළාතේ ආර්ථික වර්ධනයට හේතු වන පරිදි කටයුතු කිරීමට මෙම විෂය යටතේ වූ ප්‍රඥප්ති සෑදීම ඉතා වැදගත් වෙයි.

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උප ලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වැනි විෂය යටතේ පැවරී ඇති බලතල උපයෝගී කර ගනිමින් ආදායම් උත්පාදනය උදෙසා පළාත් සභාවල දායකත්වය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයයි.

**(පළාත් සභා නවය (09) ආශ්‍රයෙන්)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 9 වන උප ලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවට අදාළ විෂය කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ළ ව්‍යවස්ථාවට අනුව ප්‍රඥප්ති සෑදීම සඳහා වන බලතල ඒ ඒ පළාත් සභා විසින් ස්වාධීනව ක්‍රියාත්මක කළ හැකි ය.

එසේම සමගාමී ලැයිස්තුවට අදාළ විෂය කාරණා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විමසා ඊට අදාළ ප්‍රඥප්ති සෑදීමට බලතල පළාත් සභා වෙත ඇත්තේ වුවද; එකී බලතල සාර්ථක ලෙස පළාත් සභා විසින් ක්‍රියාත්මක කර තිබේද යන්න සැලකිය යුතුව ඇත. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ක්‍රියාත්මක වන උප ජාතික මට්ටමේ පාලන ස්වභාවයක් ඇති පළාත් සභා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරමාර්ථය උදෙසා ක්‍රියා කරන්නේ නම්; එහි මූල්‍ය අනන්‍යතාවය සඳහා කටයුතු කර ඇති ආකාරය ඒ සඳහා ඉතා වැදගත් වේ.

මෙහිදී පළාත් සභා විසින් මේතාක් කටයුතු කිරීමේදී පළාත් සභා අරමුදලේ මූල්‍ය අනන්‍යතාවය සඳහා, පළාත් සභාවට ප්‍රඥප්ති සෑදීමට විෂය වී ඇති කාරණා අතරින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදය යටතේ සෑදිය හැකි ප්‍රඥප්ති විශේෂිත වෙයි.

එසේම යම් පළාත් සභාවක ආදායම් උත්පාදනය උදෙසා පළාත් සභා ලැයිස්තුවේම සඳහන් වෙනත් විෂයන් යටතේ ව්‍යවස්ථාපිත ආදායම් වශයෙන් මූල්‍ය උත්පාදනයට අදාළ ප්‍රඥප්ති සෑදිය හැකි විෂය කාරණා වන්නේය. නමුත් එම කරුණු පාර්ලිමේන්තුව විසින් අවසර දෙන ප්‍රමාණයට වීමෙන් එය සීමාකාරී වී ඇ.ත. එසේ වුව ද මෙම පර්යේෂණයෙහි හුදෙක්ම ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම වස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයට අදාළ කර ප්‍රඥප්ති සෑදීමෙන් අපේක්ෂිත ඉලක්කය වන පළාත තුළ කෘෂි කාර්මික, වාණිජ හා වෙළඳ ව්‍යවසායකයන්ට පළාතේ ආර්ථික සංවර්ධනයෙහි ලා පළාත් සභාවන්ට යොමුවිය හැකි පරාසය හඳුනාගැනීමත්, එමගින් ස්වයං ආදායම් පළාත් සභාව තුළ ගොඩනගා ගත හැකි ආකාරයත්, එවැනි අරමුණු යටතේ මෙතෙක් එක් එක් පළාත් සභා ඒ සඳහා ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක තක්සේරුවක් කිරීමත්ය.

ඒ අනුව එය මූලික කරගනිමින් මෙම කරුණට අදාළ පර්යේෂකයාගේ වගකීම් විස්තරයෙහි 2 වන ඡේදය වශයෙන් දක්වා ඇති "අධ්‍යයනයේ අරමුණු" තහවුරු කරනු ලබන අතර, ඊට වැඩිමනත්ව පළාත් සභා විසින් ආදායම් උත්පාදනයෙහිලා දැනටමත් පනවා ඇති ප්‍රඥප්ති ව්‍යවස්ථාවට අනුකූලව බලාත්මක වී

තිබේද යන්න පිළිබඳ පර්යේෂණයෙහි හඳුනාගනු ලබන තොරතුරු මත නීතිමය පැහැදිලි කිරීමක් ද ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

## පර්යේෂකයාගේ වගකීම් විස්තරයට ඇතුළත් වන පරිදි පර්යේෂණ අධ්‍යයනයේ අරමුණු.

අ.) ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීමේ ක්‍රියාවලිය යටතේ කෘෂිකාර්මික, වාණිජ හා වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උත්පාදිත ව්‍යාපෘති පළාත් ඇතුළත පිහිටුවීමට, ප්‍රවර්ධනය කිරීමට හා ඒවායේ නිරත වීමට පළාත් සභාවලට පවරා ඇති බලයේ ප්‍රමාණය හා සීමා හඳුනා ගැනීම.

ආ.) එම බලය උපයෝගී කරගනිමින් දිවයිනේ එක් එක් පළාත් සභාව විසින් පිහිටුවා ගෙන ඇති ආයතන කවරේ දැයි හඳුනා ගැනීම.

ඇ.) පිහිටුවා ගෙන ඇති එක් එක් ආයතනයේ අ. කාර්යභාරය ආ. සංවිධාන ව්‍යුහය ඇ. බලතල ඈ. ලබා ඇති සාර්ථකත්වයේ ප්‍රමාණය ඉ. සාර්ථකත්වය ප්‍රමාණවත් නොවේ නම් එයට හේතු හඳුනාගැනීම.

ඈ.) ප්‍රමාණවත් සාර්ථකත්වයක් නොලැබූ ආයතන එම තත්ත්වයෙන් මුදවාගෙන සාර්ථකත්වය කරා ගෙන යාම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඉ.) මෙම ව්‍යාපෘතිවල/ආයතනවල ක්‍රියාකාරීත්වය මගින් ඒ ඒ පළාතේ පළාත් අරමුදලට ලැබී ඇති දායකත්වයේ ප්‍රමාණය හඳුනා ගැනීම සහ එම දායකත්වය ප්‍රමාණවත් නොවේ නම් එම දායකත්වය වර්ධනය කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

ඊ.) මධ්‍යම රජය විසින් මෙම කාරණය උදෙසා (පළාත් මට්ටමින් ආදායම් වර්ධනය කිරීම) ලබාදී ඇති බලතල හා දායකත්වය ප්‍රමාණවත් දැයි පරීක්ෂා කිරීම සහ එසේ නොවේ යැයි පර්යේෂණය මගින් හෙළි වන්නේ නම් මෙම අධ්‍යයනය පදනම් කර ගනිමින් ඒවා උචිත පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

## පර්යේෂණ අධ්‍යයනයේ ස්වභාවය.

ඉහත අරමුණු ආවරණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා පළාත් නවය අරමුණු කරගනිමින් අධ්‍යයනය සිදුකරන ලදී. තොරතුරු ලබා ගැනීමේදී හුදෙක්ම පැවරුමට අදාල "13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් එහි 9 වන උප ලේඛණයෙහි 21 වන ඡේදයට අදාළ වන ප්‍රඥප්ති" යන අවස්ථාවෙන් ආරම්භ කිරීමට නොහැකි විය. ඊට හේතු වූයේ ප්‍රඥප්ති පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් සතු දැනුම සෑහීමකට පත්විය හැකි මට්ටමක නොතිබීමයි. එබැවින් එක් එක් පළාත් සභා සතු සමස්ථ ප්‍රඥප්ති පිළිබඳ තොරතුරු ලබාගනිමින් ඒ ආශ්‍රයෙන් පැවරුම අදාළ ප්‍රමාණය හඳුනාගන්නා ලදී.

එසේම අදාළ ප්‍රඥප්ති අවශ්‍ය ප්‍රමාණයට ඡායා පිටපත් ලබාගත් අතර ම, අදාළ වෙනත් යම් තොරතුරු වාර්තාවන්, ලිඛිතවත් අවස්ථානුකූලව ලබා ගන්නා ලදී.

තව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ ව්‍යවස්ථාව යටතේ පළාත් සභා වෙත ප්‍රඥප්ති සෑදීමට බලය දී ඇති ආකාරයෙන්ම ක්‍රියාත්මක වීම සිදු වී තිබේ ද යන්න මධ්‍යම රජය මෙම කාරණය උදෙසා ලබාදී ඇති බලතල හා දායකත්වය ප්‍රමාණවත්ව ද යන්න පිළිබඳවත් විග්‍රහයට සමාන්තරව කරුණු ඉදිරිපත් කෙරේ.

එබැවින් මෙම පර්යේෂණ අධ්‍යයනයට අදාළව මෙම වාර්තාවෙහි අන්තර්ගතය හුදෙක්ම සාක්ෂි සහ ලබාගත් තොරතුරු මත පදනම් වන බැවින්, ඊට අතිරේක වනුයේ නීතිමය විග්‍රහයන් පමණක් බවත් සඳහන් කළ හැකි ය.

## ප්‍රඥප්ති සෑදීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ප්‍රඥප්ති සෑදීමට පළාත් සභා වෙත බලය ලබාදී ඇති ආකාරය හා ප්‍රඥප්තියක් බලාත්මක වන ආකාරය ව්‍යවස්ථාවේ විස්තර කර ඇති පරිදි පහත සඳහන් ආකාරයට වෙයි.

## දහතුන්වන (13) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

154 උ (1) සෑම පළාත් සභාවක්ම විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති ප්‍රදේශයට අදාළ වන සේ (මෙහි මින් මතු "පළාත් සභා ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(2) මේ පරිච්ඡේදයේ විධි විධාන හෝ නවවන උපලේඛණය හෝ සංශෝධනය කිරීම සඳහා හෝ ඉවත් කිරීම සඳහා වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව, යොමු කිරීමෙහි නිශ්චය කොට දැක්වෙන කාල සීමාවක් ඇතුළත, අදහස් ප්‍රකාශ කිරීම පිණිස, ජනාධිපතිවරයා විසින්, සෑම පළාත් සභාවක් වෙතම යොමු කරනු ලැබ ඇත්නම් මිස, සහ (අ) ඒ සෑම සභාවක්ම එම සංශෝධනයට හෝ ඉවත් කිරීමට හෝ එකඟවන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිණි නම්; හෝ

(අ) සංශෝධනය හෝ ඉවත් කිරීම හෝ පිළිබඳව එක සභාවක් හෝ සභා වැඩි ගණනක් එකඟ නොවන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත 82 වන ව්‍යවස්ථාවේ නියම කර ඇති විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබුණි නම් මිස, ඒ පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය.

(3) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් පිළිබඳව වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව යොමු කිරීමෙහි නිශ්චය කොට දැක්වෙන කාල සීමාවක් ඇතුළත, අදහස ප්‍රකාශ කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් සෑම පළාත් සභාවක් වෙතම යොමු කරනු ලැබ ඇත්නම් මිස සහ,

(අ) එම සෑම සභාවක්ම එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබුණි නම්

මිස, නීතියක් බවට පත් නොවන්නේ ය:

එසේ වුව ද, එවැනි යොමු කිරීමක් කරන ලදුව සියලුම පළාත් සභා නොව පළාත් සභා සමහරක් පමණක් එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වූ අවස්ථාවක, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් එම පනත් කෙටුම්පත සම්මත කරනු ලැබූ විට, එම පනත් කෙටුම්පත, ඊට එකඟ වූ පළාත් සභා පිහිටුවනු ලැබ ඇත්තේ යම් පළාතක් සඳහා ද ඒ පළාත් සම්බන්ධයෙන් පමණක් අදාළ වන නීතියක් බවට පත් වන්නේ ය.

(4) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නීති සාදන ලෙස පළාත් සභා එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින අවස්ථාවක, ඒ පළාත් සභා පිහිටුවනු ලැබ ඇත්තේ නම් පළාත් සඳහා ද ඒ පළාත්වලට පමණක් අදාළ වන සේ පාර්ලිමේන්තුව විසින් පැමිණ ඡන්දය දෙන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ

බහුතර ඡන්දයෙන්, එම කාරණය සම්බන්ධයෙන් නීති සෑදිය හැක්කේ ය.

(5) (අ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යයි පාර්ලිමේන්තුව අදහස් කාරන ආකාරයට සියලුම පළාත් සභා විමසීමෙන් පසුව (මෙහි මින් මතු "සමගාමී ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නවවන උපලේඛණයේ iii වන ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නීති පැනවිය හැක්කේ ය.

(ආ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යයි පළාත් සභාව අදහස් කරන ආකාරයට පාර්ලිමේන්තුව විමසීමෙන් පසුව, එම පළාත් සභාව පිහිටුවනු ලැබූ පළාතට අදාළ වන සේ සමගාමී ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පළාත් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව, ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(6) පළාත් සභාව විසින් සම්පාදනය කරන ලද යම් ප්‍රඥප්තියක යම් විධි විධානයක් මේ ව්‍යවස්ථාවේ පෙරාතුව වූ විධි විධානවලට අනුකූලව සම්පාදනය කරන ලද යම් නීතියක විධි විධානවලට අනනුකූල වන අවස්ථාවක, එම නීතියේ විධි විධාන බලපැවැත්විය යුතු අතර, එම ප්‍රඥප්තියේ විධිවිධාන, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට බල රහිත වන්නේ ය.

(7) (මෙහි මින් මතු "සංවෘත ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නව වන උපලේඛනයේ iiවන ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමට පළාත් සභාවකට බලය නොමැත්තේ ය.

8) පළාත් සභා ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මේ පරිච්ඡේදය බල පැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව නීතියට අනනුකූල බව දීර්ඝ නාමයේ විස්තර කරනු ලැබ ඇති ප්‍රඥප්තියක් එම කාරණය ම සම්බන්ධනේ සාදන ලැබූ අවස්ථාවක, එම ප්‍රඥප්තියට අනුමතය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බල පවත්වන තාක් කල් පමණක්, එම පළාත ඇතුළත එම නීතියේ විධි විධාන

ක්‍රියාත්මක වීම අත්හිටවනු ලැබ තිබිය යුතු අතර ඒ විධි විධාන අක්‍රියව පැවතිය යුත්තේ ය.

(9) සමගාමී ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මේ පරිච්ඡේදය බල පැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව එම නීතියට අනනුකූල ප්‍රඥප්තියක් එම කාරණයම සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලැබූ අවස්ථාවක, යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුව විසින් පටහැනි තීරණයක් ගනු ලැබුවහොත් මිස, එම ප්‍රඥප්තියට අනුමැතිය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බලපවත්වන තාක් කල් පමණක් එම පළාත් ඇතුළත එම නීතියේ විධි විධාන අත්හිටුවනු ලැබ තිබිය යුතු අතර ඒ විධිවිධාන අක්‍රියව පැවතිය යුත්තේ ය.

(10). මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුකූලව යම් කාරණයක් සම්බන්ධයෙන් මුළු ශ්‍රී ලංකාවම හෝ එහි යම් කොටසක් සඳහා නීති සෑදීමට (පරිච්ඡේදය ඇතුළුව) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරී ඇති බලතල හීන කරන්නාක් සේ කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුත්තේ ය.

(11). මේ ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වී තිබුණ ද පාර්ලිමේන්තුව විසින්, පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් වෙනත් යම් රටක් හෝ රටවල් සමඟ ඇති කරගත් යම් ගිවිසුමක්, එකඟවීමක් හෝ යම් සම්මුතියක් හෝ ක්‍රියාත්මක කිරීමේ හෝ ජාත්‍යන්තර සම්මේලනයකදී, සංගමයකදී හෝ වෙනත් මණ්ඩලයකදී එළඹෙන ලද යම් තීරණ ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය සඳහා, එම අනු ව්‍යවස්ථාවේ දක්වා ඇති කාර්ය පටිපාටිය නොවන වෙනත් ආකාරයකින් නීති සෑදිය හැක්කේ ය.

154. ඖ (1). පළාත් සභාවක් විසින් සාදන ලද යම් ප්‍රඥප්තියකට මෙහි මින් මතු විධි විධාන සලස්වනු ලබන ආකාරයට අනුමතය ලැබුණු විට, එම ප්‍රඥප්තිය බලාත්මක වන්නේය.

(2). පළාත් සභාවක් විසින් සාදන ලද සෑම ප්‍රඥප්තියක්ම එම ප්‍රඥප්තිය සාදන ලද වහාම අනුමතය සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවිට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමැතිය දීම හෝ එම ප්‍රඥප්තිය තමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු හැකි තරම් ඉක්මණින්, එම ප්‍රඥප්තිය හෝ එහි යම් නිශ්චිත විධි විධානයක් නැවත සලකා බලන ලෙස සභාවෙන් ඉල්ලා සිටින සහ විශේෂයෙන් පණිවුඩයේ නිර්දේශ කරනු ලබන සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාව සලකා බලන ලෙස ඉල්ලා සිටින පණිවුඩයක් සමග පළාත් සභාව වෙත ආපසු යැවීම හෝ කළ යුත්තේය.

(3). ආණ්ඩුකාරවරයා විසින් (2) වන අනු ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවක් වෙත ප්‍රඥප්තියක් ආපසු එවනු ලැබූ අවස්ථාවක පළාත් සභාව විසින් ආණ්ඩුකාරවරයාගේ පණිවුඩය කෙරෙහි සැලකිල්ල ඇතිව ප්‍රඥප්තිය නැවත සලකා බැලිය යුතු අත,ර සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර ආණ්ඩුකාරවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ හැකි ය.

(4) ප්‍රඥප්තියක් (2) වන අනු ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ආණ්ඩුකාරවරයා විසින් එයට අනුමතය දීම හෝ එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුකූල නොවන බවට තීරණයක් ලබා ගැනීමට එම ප්‍රඥප්තිය දෙවනවරට සම්මත කරනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කිරීම සඳහා රඳවා ගැනීම හෝ කළ හැක්කේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක, එම අධිකරණ තීන්දුව තමාට ලැබුණු විට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය දිය යුත්තේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට අනනුකූල යයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය නොදිය යුත්තේ ය.

ඉහතින් විස්තර කරන්නට යෙදුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, පළාත් සභාවක් ප්‍රඥප්ති සෑදීමට හැකි විෂය ධාරවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛණයට ඇතුළත්ව පවතියි. එසේ 9 වන උපලේඛණයට ඇතුළත් පළාත් සභා ලැයිස්තුව හෙවත් පළමු ලැයිස්තුවත්, සමාගම් ලැයිස්තුව වන

තුන්වන ලැයිස්තුවත් යටතේ විස්තර විෂයන් පළාත් සභා විසින් ප්‍රඥප්ති සෑදීමට හැකි විෂය සීමාවන් වෙයි. එම ලැයිස්තු අතරින් පළාත් සභා ලැයිස්තුවට අදාළ විෂය කාරණාවන් සංක්ෂිප්ත වශයෙන් පරිශීලනයට පහසුවන පිණිස මෙම වාර්තාවේ උපලේඛණ 1 යටතට ඇතුළත් කර ඇත.

මෙහිදී සැලකිය යුතු එක් වැදගත් කරුණක් වනුයේ පළාත් සභා ලැයිස්තුව යටතේ සඳහන් විෂය කරුණු හා අදාළව, ප්‍රඥප්ති සෑම පළාත් සභාවක් විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව පළාත් සභාව අදහස් කරන පරිදි සෑදිය හැකි ය. එහෙත්, සමගාමී ලැයිස්තුවේ විෂය කාරණා සම්බන්ධයෙන් වන ප්‍රඥප්ති සෑදීමේදී පළාත් සභාව පාර්ලිමේන්තුව විමසා කටයුතු කිරීම ඒ සඳහා පූර්ණ කළ යුතු වෙයි.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූලව එක් එක් පළාත් සභාව විසින් මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන්නට යෙදුණ 2017.06.02 දිනය වන විට පනවන්නට යෙදී ඇති පළාත් සභා ලැයිස්තුවට අදාළ ප්‍රඥප්ති පිළිබඳ නාමාවලියක් මෙම වාර්තාවේ උප ලේඛණ අංක 02 යටතේ ඇතුළත් කරන්නට යෙදී ඇත.

<u>පළාත් සභා සඳහා ප්‍රඥප්ති සම්පාදනයේ අවශ්‍යතාවය.</u>

පළාත් සභාවක ව්‍යවස්ථාදායක බලය ප්‍රඥප්ති මඟින් ක්‍රියාත්මක වෙයි. පළාත් සභාවකට ප්‍රඥප්ති සෑදීමට ලැබී ඇති බලය එහි සීමාවන් යටතේ ක්‍රියාත්මක වීමට සැලැස්වීම ව්‍යවස්ථාදායකයේ පරමාර්ථයයි. පෙර විස්තර කරන්නට යෙදී ඇති පරිදි පළාත් සභාවක කැමැත්ත මතම ප්‍රඥප්ති සෑදීමට හැකි විෂය සීමාවන් මෙන්ම, පළාත් සභාවේ කැමැත්ත මෙන්ම පාර්ලිමේන්තුවේ ඊට අදාළ අදහස ද සැලකිල්ලට ගෙන ප්‍රඥප්ති සෑදීමේ විෂය සීමාවන් වෙයි. කෙසේ වෙතත් පළාත් සභාවේ කැමැත්ත පරිදි ප්‍රඥප්ති සෑදීමට පළාත් සභාවට බලය දුන් කාරණා සම්බන්ධයෙන් යම් පළාත් සභාවක් ප්‍රඥප්ති සෑදීමට උදාසීන වේ නම්, එම පළාත් සභාවට ව්‍යවස්ථාවෙන් බලය දුන් කාරණා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේදී වුව ද ඇත්තේ අවිනිශ්චිත තත්ත්වයකි. එහෙත් පළාත් සභා ක්‍රියාත්මක වීම ආරම්භ වී වසර තිහකට ආසන්න කාලයක් ගතවී තිබියදීත්, යම් යම් පළාත් සභා සම්බන්ධයෙන් එම උදාසීන තත්ත්වය ප්‍රකට වන බව මෙම අධ්‍යයනයේදී සනාථ විය. පළාත් සභා විසින් ප්‍රඥප්ති සම්පාදනයේ ප්‍රබල අවශ්‍යතාවය ද එලෙසින්ම හඳුනාගත් බවත් මෙම අවස්ථාවේ දී තහවුරු නොවූණි. ඒ බව ඉදිරියට සඳහන් කරන කරුණු මත තවදුරටත් තහවුරු වනු ඇත.

පළාත් සභා තුළ නිසැකව වර්ෂය තුළ මුදල් විසර්ජන සඳහා විසර්ජන ප්‍රඥප්ති සම්පාදනය සිදු වෙද්දී සෙසු කරුණු සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමේදී ප්‍රමුඛතාවය හඳුනාගැනීම හුදෙක්ම අවස්ථානුකූල අවශ්‍යතා පෙරදැරිව සිදුව ඇත. දූරදර්ශී අධ්‍යයනයක ප්‍රතිඵල වශයෙන් ප්‍රඥප්ති සම්පාදනයෙහි නිසැක වැඩ පිළිවෙලක් පළාත් සභා විසින් අනුගමනය නොකරන්නේ එහි වැදගත්කම එපමණටම තේරුම් නොගත් නිසා විය හැක.

එසේම, පළාත් සභා යටතේ ප්‍රධාන තනතුරු දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ තනතුරු වෙයි. ඒ තුළින් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධාරීන් පළාත් සභාවක යම් තනතුරකට පැමිණීමෙන් පසු පළාත් සභාවක අනන්‍යතාවයට අනුකූල නීති සම්පාදනයට වඩා ප්‍රමුඛත්වය ප්‍රතිපත්ති කාරණා සහ පරිපාලන යාන්ත්‍රණය සඳහා යෙදිය යුතු වෙයි. එසේම දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ පළාත් සභා තනතුරු බොහොමයක් පුරප්පාඩු වශයෙන් පවතින තත්ත්වය යන කරුණු හේතු කොට ගෙන ප්‍රඥප්ති සම්බන්ධ අවධානය යොමු වීම සඳහා ද පළාත් සභාවල සැලකිය යුතු කාලයක් ගත කළ යුතු ය. ඒ අවධානය යොමුවන අවස්ථාව වනවිට බොහෝවිට එම නිලධාරියා ඒ වන විට එම පළාත් සභාවේ ස්ථාන මාරු විය යුතු කාල සීමාවට ආසන්න වී සිටිය හැක.

කෙසේ වෙතත් කුමන තත්ත්වයක් යටතේ හෝ ප්‍රඥප්ති සෑදීමට උකටලී වුවහොත්, එම පළාත් සභාවට එම විෂයට අදාළ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම රජයේ නීති අදාළ කරගත යුතු වෙයි.

විශේෂයෙන් 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධි විධාන පනතේ විධි විධාන අදාළ කරගනිමින් පළාත් සභා 1987 ඔක්තෝබර් මස 17 වන දිනට පූර්වයෙන් වූ පළාත් සභා ලැයිස්තුවට අදාළ විෂය කරුණු සම්බන්ධව ව්‍යවස්ථාදායකය සම්මත කළ නීති පළාත් සභාවට, එහි ධුරයන්ට හා නිලයන්ට අදාළ කරගනියි. එහෙත් පළාත් සභා නිශ්චිතවම මේකාක් නොසිතා ඇති කරුණකි. එනම්, 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධි විධාන පනත මඟින් මධ්‍යම රජයට ද අදාළ නීතිය යටතේ වන බලතල උපයෝජනය කරගැනීමට ඇති අයිතිය ද සුරක්ෂණය වී ඇති බවයි.

එබැවින්, පළාත් සභා විසින් ප්‍රඥප්ති සම්පාදනය දැනට පවත්නා තත්ත්වයකට වඩා, වඩාත් උත්සුක වී ප්‍රබල අවශ්‍යතාවයක් නිරීක්ෂණය වූ අතර, ඒ නිසාම එය ප්‍රමුඛව සඳහන් කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛණය පළාත් සභා ලැයිස්තුවේ හෙවත් පළමු ලැයිස්තුවේ සඳහන් විෂය කාරණා අතුරින් විශේෂිත විෂය කාරණාවක් මෙම පර්යේෂණ අධ්‍යයනයට මූලික වී ඇත. එනම්,

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම වස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21වන ඡේදයයි. පර්යේෂණ අධ්‍යයනයේ මූලික අරමුණ පළාත් සභා විසින් ඉහත සඳහන් 21 ඡේදය යටතේ දී ඇති බලතල පළාත් සභා විසින් තම පළාත් සභාවේ උන්නතිය උදෙසා යොදාගෙන ඇත්තේද යන්න හා එසේ නම් එය කවර ප්‍රමාණයකට ද යන්න හඳුනා ගැනීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උප ලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවෙහි 21 වන ඡේදය පහත ආකාරයට වෙයි.

" 21. සංවර්ධනය හා ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට යටත්ව, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යවසාය හා ව්‍යාපෘති කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය සංස්ථාවලට ඇති බලයට හානියක් නොමැතිව, පළාත ඇතුළත ප්‍රවර්ධනය කිරීමට පිහිටුවීමට හා ඒවායේ නිරත වීමට ඇති බලය (පළාත ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ කටයුතු

ප්‍රවර්ධනය කිරීම සහ පළාත සඳහා කාර්මික සංවර්ධන සැළසුම් සකස් කිරීම, ඒ පිළිබඳ සම්බන්ධීකරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ.) "

ඉහත සඳහන් ව්‍යවස්ථාමය විධි විධාන සැලකීමේදී එහි පරමාර්ථය පළාත් සභාවක් විසින් පළාත් සභාව අදහස් කරන පරිදි කෘෂිකාර්මික කාර්මික වාණිජ හා වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා පළාත් සභාවට බලය දීමයි.

එම බලය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බලපා ඇති එකම සීමා කිරීම සංවර්ධනය සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් වේ නම් ඊට අනුකූලව අදාළ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යාම පමණි. එසේම ව්‍යවස්ථාව පිරිනමන බලතල ව්‍යාප්ත කර ගැනීම සඳහා ව්‍යතිරේකයක් යටතේ පළාත ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමටද කාර්මික සංවර්ධන සැළසුම් සකස් කිරීමටද හැකිවන පරිදි බලතල පුළුල් කරන්නට යෙදී ඇත.

තව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛණයේ පළාත් සභා ලැයිස්තුවේ 21 වන ඡේදය යටතේ සඳහන් සංවර්ධනය සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධව ජාතික ප්‍රතිපත්තිය නව වන උපලේඛණයෙහි සංවෘත ලැයිස්තුවේ සඳහන් ආකාරයට පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතුය. එහෙත් එමගින් පළාත් සභාවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 21 වන ඡේදය යටතේ කටයුතු කිරීම සඳහා පිරිනමා ඇති බලතල මේ තාක් සීමා වී නොමැත.

පළාත් සභා ලැයිස්තුවේ සඳහන් ප්‍රඥප්තියක් සෑදීම සඳහා බලය දී ඇති සෙසු කාරණා හා සැසඳීමේදී ද මෙය සුවිශේෂී කාරණාවකි. මන්ද යත් පළාත් සභා අරමුදලට අදාළ ආදායම් කෙරෙහි අදාළවන පළාත් සභා ලැයිස්තුවෙහි 36.1 සිට 36.20 දක්වා වන කරුණු සමඟ සැසඳීමේදී පළාත් ආර්ථික සංවර්ධනයක් සඳහා ද ක්‍රියාත්මක වෙමින් ව්‍යවස්ථාදායකයේ දායකත්වයකින් තොරව ස්ව උත්සාහයෙන්ම ආදායම් උත්පාදනයට ක්‍රියාත්මක විය හැකි නෛතික පරාසය මෙය වීමයි. මෙම කරුණ හා සම්බන්ධයෙන් පළාත් සභාවක් සාදන ප්‍රඥප්තියකදී බලතල එලෙසින් වන අතර ඊට අදාළ වන්නාවූ සීමාව ජාතික ප්‍රඥප්තියක් වේ නම්, ප්‍රඥප්තිය ඊට අනුකූල කරගැනීමක්, එවැනි හා ඒ හා සම්බන්ධ කාර්යයන් සඳහා රජයට නිරත වීමට ඇති අයිතියට හානියක් නොවීමට වගබලා ගැනීමක් යන කරුණු පමණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවෙහි 21 වන ඡේදය යටතට ගැනිය හැකි එක් එක් පළාත් සභා විසින් පනවන්නට යෙදී ඇති ප්‍රඥප්ති හා ඒ යටතේ පිහිටුවා ඇති අධිකාරී හඳුනා ගැනීම.

<u>බස්නාහිර පළාත</u>

| | |
|---|---|
| ප්‍රඥප්තියෙහි නාමය: | බස්නාහිර පළාතේ 2010 අංක 09 දරණ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය. |
| පිහිටුවන ලද ආයතනය : | බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය |

වයඹ පළාත

ප්‍රඥප්තියෙහි නාමය: වයඹ පළාත් 1992 අංක 9 දරණ වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය: වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය

ප්‍රඥප්තියෙහි නාමය: වයඹ පළාත් 1994 අංක 6 දරණ වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය

ප්‍රඥප්තියෙහි නාමය: වයඹ පළාත් 1993 අංක 1 දරණ වයඹ සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : වයඹ සංවර්ධන අධිකාරිය

ප්‍රඥප්ති නාමය: වයඹ පළාත් 1990 අංක 11 දරණ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තිය

පිහිටුවා ඇති ආයතනය : වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය

සබරගමුව පළාත

ප්‍රඥප්තියෙහි නාමය: සබරගමුව පළාත් 2009 අංක 2 දරණ සබරගමුව පළාත් සභාවේ නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරි ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : සබරගමුව පළාත් නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය

උතුරුමැද පළාත

ප්‍රඥප්තියෙහි නාමය: උතුරුමැද පළාත් 1990 අංක 11 දරණ උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

දකුණු පළාත

ප්‍රඥප්තියෙහි නාමය: දකුණු පළාත් 1995 අංක 1 දරණ දකුණු පළාත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය

පිහිටුවන ලද ආයතනය : දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

ප්‍රඥප්තියෙහි නාමය: දකුණු පළාත් 2002 අංක 21 දරණ කාර්මික සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය

පිහිටුවන ලද ආයතනය : දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය

ඌව පළාත

ප්‍රඥප්තියෙහි නාමය: ඌව පළාත් 2011 අංක 11 දරණ ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය

ප්‍රඥප්තියෙහි නාමය : ඌව පළාත් 2017 අංක 2 දරණ ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : ඌව පළාත් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

මධ්‍යම පළාත

ප්‍රඥප්තියෙහි නාමය: 2008 අංක 1 දරන මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය ප්‍රඥප්තිය.

පිහිටුවන ලද ආයතනය : මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයට අනුකූලව පළාත් සභා පනවා ඇති ප්‍රඥප්ති යටතේ ඒ ඒ පළාත් සභා පිහිටුවා ඇති එක් එක් ආයතන සම්බන්ධයෙන් කාර්යභාරය, සංවිධාන ව්‍යුහය, බලතල, ලබා ඇති සාර්ථකත්වයේ ප්‍රමාණය, සාර්ථකත්වය ප්‍රමාණවත් නොවේ නම් එයට බලපා ඇති හේතූන් පිළිබඳ විග්‍රහය පහත සඳහන් වේ.

## බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය.

බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය 2010 අංක 09 දරණ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය වී ඇත. මෙය බස්නාහිර පළාත තුළ කෘෂිකාර්මික, කාර්මික, වානිජ්‍ය

හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම යන ඒවායේ නිරතවීම සඳහා ද, කාර්මික හා ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ද, විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා ද ක්‍රියාත්මක වන ආයතනයකි.

බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයෙහි කාර්යයභාරය.

අ) බස්නාහිර පළාතේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය හා පුළුල් කිරීම, නිෂ්පාදන ප්‍රවර්ධනයට දායකවීම සහ සියලුම සේවාවන් සැපයීම, රැකීරක්ෂා සම්පාදනයට අනුබලදීම සහ වැඩිදියුණු කිරීමට සහාය වීම.

ආ) දේශීය හා විදේශීය ආයෝජකයන් බස්නාහිර පළාතේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට අවශ්‍ය ක්‍රම උපායන් සකස් කිරීම සහ දේශීය ආයෝජන දිරිමත් කිරීම.

ඇ) ආයෝජන දිරිමත් කිරීමට යෝග්‍ය පහසුකම් සහ ආයෝජනයට හිතකර වාතාවරණයක් ඇති කිරීම.

ඈ) බස්නාහිර පළාතේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ආදායම් ඉහළ නැංවීමට ඉවහල් වන ව්‍යාපෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ විෂය භාර පළාත් අමාත්‍යාංශ වෙත මාර්ගෝපදේශ ලබා දීම.

ඉ) ශ්‍රී ලංකාව තුළ වෙනත් ආයතන සඳහා වෘත්තීය උපදේශන සේවා සැපයීම.

ඊ) ආර්ථික ප්‍රවර්ධනයට අදාළ පර්යේෂණ සහ පුහුණු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම හා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

උ) බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන ආයෝජන අවස්ථා ඇති කිරීම, දේශීය හා විදේශීය ප්‍රතිපාදන ලබා ගැනීම, විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම.

ඌ) බස්නාහිර පළාතේ සංවර්ධනය සඳහා කෙටිකාලීන, මධ්‍යකාලීන සැලසුම් සකස් කිරීම.

එ) අවශ්‍ය අවස්ථාවලදී පළාත් සභාවේ අදාළ අමාත්‍යාංශවල සහභාගීත්වය ඇතිව පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව ව්‍යාපාර/ව්‍යාපෘති ආරම්භ කිරීම.

ඒ) මධ්‍යම ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.

## බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ සංවිධාන ව්‍යුහය.

බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලය සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත වේ. එය පහත ආකාරයටය.

අ) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් නම් කරන තැනැත්තෙක්

ආ) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

ඇ) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

ඇ) කාර්යාංශය සඳහා පළාත් විෂයභාර අමාත්‍යවරයා පත් කරන ලද සාමාජිකයන් සිව්දෙනෙක්

මෙහිදී අමාත්‍යවරයා පත්කරන සාමාජිකයන් කෘෂිකාර්මික, කාර්මික, වාණිජ්‍ය හා වෙළෙඳ ව්‍යවසාය හා නීතිය යන ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි සැලසුම් සම්පාදනය, රාජ්‍ය පෞද්ගලික අංශවල ආයෝජන කටයුතු විදේශ ආධාර ආයතන සමඟ කටයුතු කිරීමේ හැකියාව හා පළපුරුද්ද ඇති තැනැත්තන් විය යුතුය.

තව ද, එසේ අමාත්‍යවරයා පත් කරනු ලබන සාමාජිකයන් අතරින් එක් අයෙකු කාර්යාංශයේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේ ය.

එසේම, කාර්යාංශයෙහි පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා කාර්යාංශයට සාමාන්‍යාධිකාරීවරයෙක් වන අතර, ඔහු කාර්යාංශයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා මෙන්ම ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේය.

## බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයෙහි බලතල.

අ) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය හෝ හිතකර නැතහොත් ඊට ආනුෂාංගික කටයුතු කිරීම.

ආ) කාර්යාංශයේ මුදල්වලින් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයන්, පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව සුදුසු යයි මණ්ඩලය සලකන, සුරැකුම්පත් හෝ තැන්පතු විෂයෙහි ආයෝජනය කිරීම.

ඇ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස් කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

ඇ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙලින්ම හෝ පළාත් අමාත්‍යාංශය මාර්ගයෙන් හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මඟින් හෝ ඇතුළත්වීමට සහ ඒවා ඉටු කිරීමට.

ඉ) ස්වකීය නිලධරයන්, සේවකයන් සහ සේවා සපයන්නන් පත්කිරීමට, ඔවුන්ගේ සේවය අවසන් කිරීමට, පාරිශ්‍රමික ගෙවීමට සහ පාලනය කිරීමට සහ එහි කටයුතු පරිපාලනය කිරීම හා සම්බන්ධ සියලු කාරණා මෙහෙයවීමට සහ තීරණය කිරීමට.

ඊ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට.

උ) කාර්යාංශයේ පරමාර්ථ එල ගැන්වීම පිණිස ක්‍රම සකස් කිරීමට.

ඌ) පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය සහ ජාතික හා පළාත් සභා ප්‍රතිපත්තිවලට අනුකූලව අරමුදල්, තාක්ෂණය, විශේෂඥ ඥානය හෝ වෙනත් ආධාර ලබා ගැනීම.

එ)කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා පළාත් භාණ්ඩාගාරයේ අනුමැතියට සහ ජාතික හා පළාත් සභා ප්‍රතිපත්තිවලට අනුකූලව, සේවා ව්‍යවස්ථා, විනය කාර්ය පටිපාටීන් හා බඳවා ගැනීම් පටිපාටීන් නියම කිරීම.

## බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය දැනට ලබා ගෙන ඇති සාර්ථකත්වය.

බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය විසින් දැනට වෙස්පෝ ආරක්ෂක සේවය, වෙස්පෝ මුද්‍රණාලය සහ වෙස්පෝ කාර්යාල පරිශ්‍ර ආරක්ෂණ සේවාව වශයෙන් මූල්‍ය උත්පාදන ව්‍යාපෘති තුනක් පවත්වාගෙන යනු ලබයි. මෙයින් වෙස්පෝ ආරක්ෂණ සේවාව යටතේ බස්නාහිර පළාත් සභාව යටතේ පවතින සියලුම ආයතන කාර්යාල වෙනුවෙන් ආරක්ෂක සේවාව පවත්වාගෙන යනු ලබයි. එසේම පළාත් සභාවෙන් පරිබාහිරව බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන හා පාසල් වෙනුවෙන් ද ආරක්ෂක සේවාවන් ව්‍යාප්ත කර ඇති අතර, මෙම ආරක්ෂක සේවාව යටතේ පසුගිය ආසන්න වර්ෂය තුළ මිලියන 11 ක ලාභ උපයා ඇත. එසේම වෙස්පෝ මුද්‍රණාලය යටතේ මුද්‍රණාල සේවාවක් පවත්වාගෙන යන අතර, එමඟින් පසුගිය ආසන්න වසර තුළ උපයා ඇති ලාභය මිලියන 2.9 කි. එසේම මුද්‍රණාලය හේතුවෙන් මුද්‍රණ කටයුතු උදෙසා බාහිර ආයතනයක් වෙනුවෙන් පළාත් සභා අරමුදලින් වැය කළ යුතු මුදල් පළාත් සභා අරමුදලට ඉතිරිවීමෙන් එමඟින් ද වක්‍ර ලාභයකට කරුණු යෙදී පවතී. වෙස්පෝ කාර්යාල පරිශ්‍ර ආරක්ෂණ සේවාව මීට ආසන්න කාලයක ආරම්භ කරන්නට යෙදී ඇති ව්‍යාපෘතියක් වන අතර, එය මෙතෙක් ප්‍රාථමික තත්ත්වයක පවතී.

2011 වර්ෂයේදී පමණ ආරම්භ වී ඇති මෙම ආයතනය යම් මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගනිමින් යම් සාර්ථකත්වයක් ලබා ඇත.

එසේ වුව ද, ප්‍රඥප්තිය යටතේ තවදුරටත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයෙහි පරමාර්ථය වෙනුවෙන් කරුණු අවශ්‍ය පමණට යෙදී ඇතැයි යන්න සැලකිය නොහැක. ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය නිසි පරමාර්ථයට කරුණු යෙදී තිබුණද, ඊට අනුකූලව ආයතනික අරමුණු හා බලතල ප්‍රඥප්තියට ඇතුළත් වී නැත.

එසේම අදාළ අරමුදල පිහිටුවීමේදී එහි ආදායම් හා වියදම් නිසි නීතිමය විග්‍රහයකට යටත් වී නොමැත. ආයතනයෙහි පරිපාලන ව්‍යූහය ද නිසි පරිදි විග්‍රහ වී නොමැති බව අදාළ ප්‍රඥප්තිය අධ්‍යයනයේදී නිරීක්ෂණය වේ.

<u>බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය තවදුරටත් සාර්ථකත්වයට පත් කරලීම උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.</u>

අ) බස්නාහිර පළාතේ 2010 අංක 09 දරණ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය පරිච්ඡින්න කරමින් නව ප්‍රඥප්තියක් පැනවීමට ක්‍රියා කිරීම හා එසේ පනවන ප්‍රඥප්තිය යටතේ පැන නගින කරුණු පිළිබඳව විධිවිධාන ඇතුළත් කිරීම.

ආ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයට අදාළ පරමාර්ථයන් උදෙසා සාර්ථක ආයතනයක් වීමට කාර්යාංශ බලතල තවදුරටත් පුළුල් විය යුතුය. විශේෂයෙන් කාර්යාංශයට පෞද්ගලික ව්‍යවසායන් සහසම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි බලතල ඇතුළත් කිරීම.

ඇ) කාර්යාංශයෙහි අරමුණු පුළුල් කරගනිමින් ඊට අනුකූලව බලතල ව්‍යාප්ත කරගැනීම.

ඈ) කාර්යාංශයෙහි අරමුදල සම්බන්ධයෙන් විධි විධාන ඇතුළත් කිරීමේදී කාර්යාංශයේ අරමුදලින් පළාත් සභා අරමුදලට මුදල් මාරු කිරීමට හැකි වන පරිදි විධි විධාන ඇතුළත් කිරීම.

## <u>වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය.</u>

වයඹ පළාතේ, පළාත් සභාව සතු යන්ත්‍රෝපකරණවලින් උපරිම මට්ටමින් ප්‍රයෝජන ගැනීමට, එම යන්ත්‍රෝපකරණ ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සහ ගුණාත්මකභාවයෙන් සේවා ඉටු කිරීම සඳහා වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවා ඇත. මෙය වයඹ පළාත් 1992 අංක 9 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය වූවකි.

## වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියෙහි කාර්ය භාරය.

(අ) රජය විසින් පළාත් සභාව වෙත පවරා දෙන ලද ඉඩ කඩම් , ගොඩනැගිලි, වාහන යන්ත්‍රෝපකරණ හා අන් සියළු නිශ්චල වූත්, චංචල වූත් දේපල අයිතිය භාර ගැනීම හා පරිහරණය කිරීම හා ප්‍රඥප්තියෙහි කාර්යය සඳහා උපයෝගී කර ගැනිම.

(ආ) අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ වාහන හෝ වෙනයම් උපකරණ අළුත් වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම සඳහා ද යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් හෝ පෞද්ගලික අංශය සතු යන්ත්‍රෝපකරණ, වාහන හෝ වෙනයම් උපකරණ අලුත් වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම භාර ගැනිම ද අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ හා වාහන අනුමත නඩත්තු ගාස්තු යටතේ දෙපාර්තමේන්තු සංස්ථා හා පෞද්ගලික ආයතනවලට ලබාදීම.

## වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරියේ සංයුතිය.

වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය වයඹ පළාත් විෂය භාර අමාත්‍යවරයා පත්කරන නිල සාමාජිකයින් තිදෙනෙකුගෙන් හා පත්කරන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වෙයි.

**නිල සාමාජිකයන්,**

(අ) වයඹ පළාතේ ප්‍රධාන ලේකම්ගේ නියෝජිතයෙක්

(ආ) විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්

(ඇ) වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක් පත්කරන

**සාමාජිකයින්,**

යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ අවුරුදු දහයකට නොඅඩු පළපුරුද්දක් ඇති අයෙකු ද ඇතුළත් වන පරිදි පළාතේ විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පත් කරන දෙදෙනෙකු.

අමාත්‍යතවරයා විසින් ඉහත සඳහන් සාමාජිකයන් අතරින් එක් අයකු අධිකාරියෙහි සභාපතිවරයා වශයෙන් පත් කරනු ලබයි. අධිකාරියෙහි කළමනාකරණ කටයුතු කළමනාකරණ අධ්‍යක්ෂවරයකු යටතේ සිදුවෙයි.

## වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ බලතල

(අ) පළාත් සභාවේ යම් සංවර්ධන වැඩසටහනක අඩංගු නිර්මාණ හෝ යාන්ත්‍රික කාර්යයක් සැලසුම් කිරීම, උපදෙස් හා තාක්ෂණ සහාය ලබාදීම.

(ආ) එම නිර්මාණ හෝ යාන්ත්‍රික කාර්යයන් සඳහන් පිළියෙල කරන ලද සැලැස්මක් හෝ සැලසුම්කරණය පිළිබඳ උපදෙස් දීම.

(ඇ) අධිකාරිය වෙත භාරදෙන ලද කාර්යයක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ ඇස්තමේන්තු පිළියෙල කරවීම.

(ඈ) අධිකාරියට අවශ්‍ය චංචල හා නිශ්චල දේපළ අත්පත් කර ගැනීම කුලියට ගැනීම බද්දට ගැනීම හා මිලට ගැනීම හා නඩත්තු කිරීම.

(ඉ) අධිකාරිය සතු අධිකාරියේ කාර්යය සඳහා උපයෝගී කර ගත නොහැකි දේපල , ගොඩනැගිලි අබලි ද්‍රව්‍ය හා ගර්හිත යන්ත්‍ර හා වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(ඊ) අවශ්‍ය පරිදි රක්ෂණ ගිවිසුම් වලට බැඳීම.

(උ) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විශේෂ අවස්ථාවලදී රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පොදු කාර්යයන් නඩත්තු ගාස්තු වලින් තොරව ඉටුකරදීම ද, අධිකාරියේ කාර්යය මණ්ඩලයේ සුබ සාධක කටයුතු සඳහා වියදම් දැරීම.

## වයඹ පළාත් යන්ත්‍රෝපකරණ සංවර්ධන අධිකාරිය දැනට ලබා ඇති සාර්ථකත්වය.

වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වයඹ පළාත් සභාව යටතේ පවතින වාහන හා යන්ත්‍රෝපකරණ, අලුත්වැඩියාවන් සිදුකරමින් ඒ වෙනුවෙන් පළාත් සභා අරමුදලින් බැහැර විය හැකි වියදම් අවම කර ගැනීම, ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමයෙහි සඳහන් පරමාර්ථයන් එම සීමාව යටතේ පවතී. එහෙත් අධිකාරියට අදාළ බලතල යටතේ බාහිර පාර්ශවයන්ට සේවා සැපයීම සඳහා ව්‍යාප්ත වීමට බලතල සකසා ගෙන ඇත. කෙසේ වෙතත් ආයතනයෙහි වර්තමාන ක්‍රියාත්මක වීම ප්‍රඥප්තියෙහි පරමාර්ථ හා සැසඳීමේදී එසේම විවිධ බාහිර ආයතන සඳහා ද ස්වකීය සේවාවන් දැනටමත් ව්‍යාප්ත කර ඇත. ඒ අනුව බලතල තුළ ක්‍රියාත්මක වෙමින් ආයතනික අරමුදල් යහපත්ව පවත්වා ගෙන යාමට ද වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය සමත්වී ඇත.

එසේ වුව ද වයඹ පළාතේ 1992 අංක 05 දරන වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීමට අදාළ ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයේ සඳහන් නීතිමය ප්‍රතිපාදන යටතේ සම්මතවී ඇති ප්‍රඥප්තියක් වන හෙයින් අධිකාරියෙහි අරමුණු තවදුරටත් පුළුල්ව සැලසිය යුතුව තිබුණි. තව ද අධිකාරියෙහි බලතල තවදුරටත් ව්‍යාප්ත කරගනිමින් පෞද්ගලික අංශයට සහසම්බන්ධ, ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පළාත තුළ සැබෑ ව්‍යවසායකයෙකු වශයෙන් ක්‍රියාත්මක වීමේ හැකියාව ගොඩනගා ගතහැකි වුවත් වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය ප්‍රඥප්තිය යටතේ එපමණට ශක්තිමත් වී නොමැත.

එසේම අධිකාරිය විසින් අධිකාරිය නමින් අරමුදලක් පවත්වාගෙන යන අතර එම අරමුදලට රැස්කරන මුදල් අධිකාරියෙහි බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී වන වියදම් සඳහා යෙදවීම හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා යෙදවීමට විධිවිධාන සලසාගත නොහැක. අවම වශයෙන් අධිකාරිය කෙතරම් ලාබ ඉපයිය වුව ද ඉන් කොටසක් පළාත් සභා අරමුදලට මාරු කිරීමට හැකි මට්ටමක විධි විධාන ප්‍රඥප්තියට ඇතුළත්වී නොමැත.

## වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය තවදුරටත් සාර්ථකත්වය උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.

(අ) වයඹ පළාතේ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීමට අදාළ 1992 අංක 09 දරණ ප්‍රඥප්තිය පරිච්චින්න කර දීර්ඝ නාමය යටතේ පුළුල් පරමාර්ථයක් සහ වඩාත් පුළුල් බලතල සහිත වයඹ

පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරියක් හෝ ඒ හා සමාන ආයතනයක් බිහි කිරීමට අදාළ ප්‍රඥප්තියක් සම්මත කිරීම.

(ආ) එසේ බිහිවන ප්‍රඥප්තියක් යටතේ අධිකාරිය වෙනුවෙන් බිහි කරන අරමුදලෙහි මුදල් ව්‍යවස්ථාවේ පරමාර්ථයන්ට යෙදවිය හැකි පරිදි විධි විධාන ඇතුළත් කිරීම.

## වයඹ සංවර්ධන අධිකාරිය.

වයඹ පළාතේ, කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, ධීවර කර්මාන්තය, වන වගාව සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයකි. වයඹ පළාතේ 1993 අංක 1 දරණ වයඹ සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය යටතේ සංස්ථාපිතය.

### වයඹ පළාත් සංවර්ධන අධිකාරියෙහි කාර්ය භාරය.

(අ) වයඹ පළාතේ කෘෂි කර්මාන්තයට, සත්ත්ව පාලනයට, ධීවර කර්මාන්තයට, වන වගාවට සහ ඉහත ක්ෂේත්‍ර පදනම් වූ කර්මාන්තවලට අනුබල දීම හා ඒවා දියුණු කිරීමට සහාය වීම.

(ආ) දේශීය හා විදේශීය ආයෝජකයින් වයඹ පළාතට ආකර්ෂණය කරගැනීම හා ඵලදායි ව්‍යාපෘති හඳුන්වාදීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් එවැනි ආයෝජකයින්ට සහාය වීම

(ඇ) පෙළඹවීමේ ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම්වලින් හෙබි හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම.

(ඈ) ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනික කටයුතු කරගෙන යාම, පුහුණු වැඩ සටහන් සම්මන්ත්‍රණ, සම්මේලන වැඩමුළු හා අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම, දැනුම හා තොරතුරු පතුරවාලීම සහ වෙනත් වැඩ සටහන් ඇති කිරීම.

(ඉ) වයඹ පළාත තුළ නිෂ්පාදිත භාණ්ඩ සඳහා වෙළඳපොළවල් ඇති කිරීම හා ඒ සඳහා අනුබල දීම සහ ගිවිසුම් හෝ සම්බන්ධතා ඇති කිරීම

(ඊ) අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන දේශීය නිෂ්පාදිකයින්ගෙන් ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියා කිරීම හා අලෙවි අවශ්‍යතා ඇති අංශයන්හි නිෂ්පාදනයන් දිරි ගැන්වීම

(උ) කෘෂි කර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය හා වන වගා යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවලට ගැලපෙන ආකාරයේ ශිල්ප ඥාණය ඇති කර ගැනීම, හැඩ ගස්වාගැනීම හා නවීකරණය පිළිබඳ උපදෙස් දීම හා මග පෙන්වීම සහ එවැනි ශිල්ප ඥානය සංවර්ධනය කිරීමට හා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මූල්‍යාධාර ලබාදීම හා වයඹ පළාතේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂි කාර්මික, සත්ත්ව පාලන, ධීවර හා වනවගා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතු වලට අනුග්‍රහය දැක්වීම හා භාර ගැනීම.

(ඌ) ගුණාත්මක සංවර්ධනය හා කාර්ය සාධකතාව වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණය, නිෂ්පාදනය හා බෙදා හැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබල දීම.

(එ) එක් එක් කර්මාන්ත අංශ උදෙසා නිශ්චිත කෙටි කාලීන හා දිගුකාලීන ක්‍රියාත්මක සැලසුම් වර්ධනය කිරීම භාර ගැනීම.

(ඒ) වයඹ පළාතේ කෘෂි කර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර හා වන වගා ආශ්‍රිත කර්මාන්ත සඳහා බුද්ධි මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම.

## වයඹ පළාත් සංවර්ධන අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය.

අධිකාරිය, අමාත්‍යවරයා පත් කරන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයකින් සමන්විතය.(ප්‍රඥප්තිය යටතේ සාමාජිකයින් කවුරුන් විය යුතුද යන්න පිළිබඳ කිසිදු නිර්ණයක් නොමැත.)

එසේ අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයකු වශයෙන් අධ්‍යක්ෂක ජනරාල් යන නාමය යටතේ පත්වන අතර ඔහු කාර්ය මණ්ඩල පාලනයට අදාළ කටයුතු ද සිදු කරනු ලබයි.

## වයඹ සංවර්ධනය අධිකාරියේ බලතල.

(අ) අධිකාරියෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් බලතල

(ආ) නිශ්චල දේපල අත්පත් කර ගැනීමේ බලය

(ඇ) කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, ධීවර හා වන වගාවන් දිරි ගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

(ඈ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා හවුල් ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත් ගිවිසම් වලට හෝ සහ යෝජිත ගිවිසුම්වලට හෝ ඇතුල් වීම

(ඉ) කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, ධීවර හා වන වගා අංශයන්හි සංවර්ධනයේ සියළුම අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය වීම, සම්බන්ධීකරණය හා අනුබල දීම

(ඊ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම

(උ) අධිකාරියට කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම

(ඌ) නව සේවකයින් පත් කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන්ගේ විනය පාලනය කිරීම

(එ) සිය සේවකයින් පත් කරගැනීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය හැසිරීම සහ ඔවුන්ට නිවාඩු ලබාදීම පිළිබඳ රීති සම්පාදනය කිරීම

(එ) සිය සේවකයින් සඳහා කාර්යය නියමයක් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයුම සහ අවශ්‍ය පිළියම් යෙදීම.

(ඒ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම හා කාර්යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි උපකරණ අරමුදල් කාර්යය මණ්ඩලය හා වෙනත් ආධාර පිළිගැනීම

(ඔ) සිය කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම

## වයඹ පළාත් සංවර්ධන අධිකාරිය දැනට ලබා ඇති සාර්ථකත්වය

ප්‍රඥප්තියෙහි සඳහන් ආකාරයට ආයතනික පරමාර්ථය කෘෂි කර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, වන වගාව ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනයයි.

එමගින් සමස්ථයක් වශයෙන් උපයන ආදායම් වයඹ පළාතට ප්‍රතිලාභ වශයෙන් යෙදවීමක් සිදුවේ.

ආයතනික අරමුදලක් පිහිටුවීම ප්‍රඥප්තිය යටතේ සිදු කර ඇතත්, අරමුදලට වියදම් සම්බන්ධයෙන් වන සීමාවන් සැලකීමද මෙහිදී වැදගත් වේ. විධි විධාන සලසා ඇති ආකාරයට ආයතනික අරමුදල කොතරම් ලාභ ලැබුව ද, එම අරමුදලින් කිසිදු මුදලක් පළාත් සභා අරමුදලට බැර කළ නොහැකි ය. එවැනි තත්වයකට ප්‍රඥප්තිය තුළ විධි විධාන සැලසී නොමැත.

ආයතනික ව්‍යුහය තීරණය කිරීම බොහෝ දුරට පළාතේ විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ තුළ ආයතනික පරමාර්ථයන්ට අනුකූල පරිදි සංයුතිය තීරණය වන්නේ ද යන්න ගැටලුසහගතය.

<u>වයඹ පළාතේ සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් තවදුරටත් සාර්ථකත්වය උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.</u>

(අ) වයඹ පළාතේ සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය පරිච්ඡින්න කරමින් පනවන ප්‍රඥප්තියක් යටතේ අධිකාරියෙහි පරමාර්ථයන් නිශ්චිත කර, එම නිශ්චිත පරමාර්ථය (ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය යටතේ සඳහන්) උදෙසා බලතල පුළුල්ව විස්තර කිරීම.

(ආ) නව ප්‍රඥප්තියක් පැනවීමේදී අධිකාරියට ව්‍යවසායන්හි යෙදවීමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී පෞද්ගලික ව්‍යවසායන් සමග බද්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විධි විධාන සැලසීම.

(ඇ) නව ප්‍රඥප්තියක් පැනවීමේදී ප්‍රඥප්තියෙහි අරමුණු උදෙසා කටයුතු කිරීමට 100%ක කොටස් අයිතියක් අධිකාරියට අයත් වන පරිදි සමාගමක් පිහිටුවීම වැනි මට්ටමට ප්‍රඥප්තිය යටතේ විධි විධාන සැලැස්වීමෙන්, අරමුණු යටතේ අදායම් උපදවාලිය හැකි ස්වභාවයකට අධිකාරිය පත්කරලීමට පහසු වන බව.

(ඈ) අධිකාරිය සඳහා සුදුසු සංයුතියක් යෝජිත ප්‍රඥප්තිය යටතේ සඳහන් කිරීම.

(ඉ) අධිකාරියෙහි අරමුදලෙහි මුදල් පළාත් සභා අරමුදලට බැර කිරීමට හැකි වන පරිදි හා වෙනත් ආයෝජන ස්වභාවයක් යටතේ වාසිදායක අයුරින් ආයෝජනය කිරීම සඳහා විධි විධාන නව ප්‍රඥප්තියක් යටතේ සකස් කරදීම.

<u>වයඹ පළාතේ මානව සම්පත් සංවර්ධන අධිකාරිය</u>

වයඹ පළාතේ මනව සම්පත් සංවර්ධනය උදෙසා පිහිටුවන ලද අධිකාරියකි. වයඹ පළාත් 1994 අංක 06 දරණ වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය වී ඇත.

<u>වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරියෙහි කාර්යයභාරය</u>

අ) වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ දැනට පවත්නා හා අනාගතය සඳහා ප්‍රක්ෂේපිත මිනිස් බල අවශ්‍යතා හඳුනාගැනීම සහ එම අවශ්‍යතාවය අනුකූලව මානව සම්පත් සංවර්ධනය සඳහා සැලසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ආ) දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළෙහි දැනට පවත්නා හා ප්‍රක්ෂේපිත මිනිස් බල අවශ්‍යතා සපුරාලන පරිදි පළාතේ මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ඇ) පළාතේ පවත්නා සම්පත් තුළින් උපරිම ඵලදායීතාවයක් ලබාගත හැකිවන පරිදි, කඩිනම් සංවර්ධනයට ඉවහල් වන පරිදි, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායයන් ඇරඹීමේ විභව්‍යතාවය ඇති තරුණ තරුණියන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ඈ) පළාතේ සම්පත්වලට හා ආර්ථිකයට ගැළපෙන පරිදි ස්වයං රැකියා ලෙස පවත්වාගෙන යා හැකි සුළු ව්‍යාපාර සැලසුම් කර ඒ සඳහා තරුණ තරුණියන්ට අවශ්‍ය පුහුණුව හා ඔවුන්ව එම ව්‍යාපාරයන්හි යෙදවීමට අවශ්‍ය අරමුදල් සපයා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉ) පළාත තුළ දැනට විවිධ ව්‍යාපාරයන්හි යෙදී සිටින, ස්වකීය ව්‍යාපාරයන් වැඩිදියුණු කර ගැනීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුවක් අපේක්ෂා කරන්නවුන් සඳහා උචිත ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

ඊ) වසරක් පාසා විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් විවිධ අවස්ථාවන්හිදී ගිලිහී යන පළාතේ තරුණ පිරිස ජීවන මාර්ග සඳහා යොමු කිරීම පිණිස රාජ්‍ය, පෞද්ගලික හා විවිධ වෘත්තීය ආයතනයන්ගේ ද සහාය ඇතිව වෘත්තීය පාඨමාලා සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම.

උ) පළාතේ පිහිටි වාණිජ, කාර්මික හෝ රාජ්‍ය ආයතනයන්හි කාර්යය මණ්ඩලවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා නූතන හා විද්‍යාත්මක කළමනාකරණ ක්‍රම උපයෝගී කරගනිමින් කාර්යය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ඌ) පළාතේ වාණිජ, කාර්මික හා රාජ්‍ය ආයතනයන්හි කාර්යක්ෂමතාවය, ඵලදායිතාව හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමත්, නාස්තිය වැළැක්වීමත් සඳහා අවශ්‍ය කළමනාකරණ උපදේශක සේවාවන් සැපයීම.

එ) පළාත තුළ මධ්‍යගතව හා ප්‍රාදේශීය මට්ටමින් මිනිස් බල සේවා මධ්‍යස්ථාන පිහිටුවීම මඟින් වෘත්තීය මාර්ගෝපදේශක සේවාවන්, රැකියා ස්ථාපන සේවාවන් හා මිනිස් බල දත්ත රැස්කිරීමේ සේවාවන් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම.

ඒ) වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ මානව සම්පත් සංවර්ධන කාර්යයෙහි නියුතු සියළුම ආයතන සමඟ සහයෝගීතාවයෙන් ප්‍රදේශයේ කඩිනම් සංවර්ධනයට ඉවහල් වන පාඨමාලා සංවර්ධනය කිරීම, ප්‍රමිතිය නියම කිරීම හා ඒවා හදාරන්නවුන් සඳහා පොදු ඇගයීම පිළිවෙත් නියම කිරීම.

ඔ) පළාතේ නිෂ්පාදන කර්තව්‍යයන් සඳහා යොමුකරන අභ්‍යාසලාභීන් විසින් නිෂ්පාදනය කරන භාණ්ඩ වලට දේශීය හා විදේශීය වෙළඳපළ පහසුකම් සලසාලීමට අවශ්‍ය අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඕ) අධිකාරියට සමාන අරමුණු ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගීතාවය පැවැත්වීම මඟින් අධිකාරිය විසින් පිරිනමනු ලබන සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් එකී ආයතනය මඟින් පිරිනමනු ලබන සුදුසුකම්වලට සමාන හා වලංගු ලෙස පිළිගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

ක) පළාතේ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පුහුණු ආයතන වල පුහුණු ධාරිතාවය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් හා ආධාර ලබාදීම.

ග) පළාතේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පර්යේෂණ හා ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම.

ච) කුසලතා වර්ධනය පිණිස තරඟ පැවැත්වීම සහ සම්මාන පිරිනැමීම.

## වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය

වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය හත් දෙනෙකුගෙන් යුත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ සමන්විතය. එය පහත ආකාරයට වෙයි.

අ) වයඹ පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු

ආ) වයඹ පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂක හෝ ඔහුගේ නියෝජිතයෙකු

ඇ) වයඹ පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරයා පත්කරන සාමාජිකයන් පස් දෙනෙකු

ඉහත අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් අතරින් එක් අයෙකු අමාත්‍යවරයා විසින් අධිකාරී සභාපතිවරයා වශයෙන් පත් කරනු ලබයි. එසේම තවත් සාමාජිකයෙකු අධිකාරියෙහි නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් පත් කරනු ලබයි.

එසේම සාමාජිකයින් අතරින් පත්වන විධායක අධ්‍යක්ෂකවරයෙකුගේ පරිපාලනය යටතේ ආයතනික පරිපාලන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

## වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරියෙහි බලතල

අ) අධිකාරියෙහි අරමුණු සියල්ලම හෝ ඉන් කොටමක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පරිදි ක්‍රියා කිරීමට හා සියලු පියවර ගැනීමට අධිකාරියට බලය තිබිය යුතුය.

ආ) (අ) උප වගන්තියේ පැවරී ඇති බලතල වලට අගතියක් නොවන පරිද්දෙන් පහත දැක්වෙන කටයුතු කිරීමට අධිකාරියට බලය තිබිය යුතුය.

ඇ) මානව සම්පත් සංවර්ධන කාර්යය උදෙසා පළාත තුළ සියළු ආකාරයේ පුහුණු හා කළමනාකරණ ආයතන, නියෝජ්‍යායතන ආදිය පිහිටුවීම හා කළමනාකරණය කිරීම.

ඈ) පුහුණු වැඩසටහන් ව්‍යාපෘති, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පළාත තුළ සංවිධානය කිරීම හා මෙහෙයවීම.

ඉ) වයඹ පළාත තුළ දැනට පිහිටුවා ඇති හා අනාගතයේ දී පිහිටුවනු ලබන මානව සම්පත් සංවර්ධන කාර්යයෙහි නිරතවන සියළුම ආයතන ලියාපදිංචිකර පළාතේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ඒවායේ කටයුතු පාලනය කිරීම, පාඨමාලා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා මූල්‍යමය හෝ වෙනත් ආකාරයකින් අධාර කිරීම.

ඊ) වෙනත් ලිඛිත නීතියක සඳහන් වගන්තීන්ට යටත්ව අධිකාරියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්පත් කර ගැනීම, මිලට ගැනීම, තබා ගැනීම, බද්දට උගසට හෝ කුළියට ගැනීම හෝ දීම, ඇපයට තැබීම, උගස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

උ) අධිකාරියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ අමුද්‍රව්‍ය හෝ වෙනත් දේ දේශීය වශයෙන් මිලට ගැනීම හෝ ආනයනය කිරීම.

ඌ) අධිකාරියෙහි කාර්යයන් සඳහා විවිධ පුද්ගලයන් හා ආයතනයන්ගේ සේවාවන් හා භාණ්ඩ ලබා ගැනීම හා ඒ වෙනුවෙන් ගෙවිම් ගාස්තු හෝ කුලී ගෙවිම.

එ) අධිකාරියෙහි අරමුණු වලින් ඕනෑම එකක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍යවන සියළුම වියදම් සඳහා ගෙවීම් කිරීම.

ඒ) අධිකාරිය විසින් පළාත තුළ මානව සම්පත් සංවර්ධනය සඳහා ඉටුකරන සේවා හෝ සපයන පහසුකම් හෝ උපකරණ වෙනුවෙන් සේවා හා පහසුකම් ගාස්තු හෝ පාඨමාලා ගාස්තු වෙනත් අයකිරීම් නියමකර ඒවා අයකර ගැනිම.

ඔ) අධිකාරියෙහි අරමුණු, කාර්යයන් හා සේවාවන් සපුරා ගැනීම සඳහා විවිධ දේශීය, විදේශීය හා අන්තර්ජාතික ආයතන මඟින් සපයනු ලබන මූල්‍ය ආධාර, ද්‍රව්‍යමය ආධාර, උපදේශන සේවා වෙනත් කිසියම් ආකාරයක ආධාර පිළිගැනීම.

ඕ) මෙම අධිකාරියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ඕනෑම දේශීය හා රජයේ එකඟතාවය ඇතිව, වෙනත් ලිඛිත නීතීන්ටද යටත්ව අනෙකුත් විදේශීය හා ජාත්‍යන්තර ආයතනකින් දීමනා, ප්‍රධාන, ආයෝජන, විශේෂඥ සේවා, උපකරණ හා යන්ත්‍රසූත්‍ර යනාදිය ලබාගැනීම එවැනි ආයතන සමඟ පළාත තුළ හවුල් ඇරඹීමටත්, ඒ සම්බන්ධව සහයෝගීතා ගිවිසුම් හා කොන්ත්‍රාත්තු ආදියට එළඹීම.

ක) අධිකාරයේ අරමුණු ඉටුකරගැනිම සඳහා දේශීය හා විදේශීය ආයතනයන් හෝ පුද්ගලයන් සමඟ හෝ ජාත්‍යන්තර ආයතනයන් සමඟ ඒකාබද්ධව හවුල් ව්‍යාපාර, ඒකාබද්ධ ව්‍යාපෘති ආදිය සැළසුම් කිරිම, පිහිටුවීම හා පවත්වාගෙන යාම.

ග) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කර ගැනීමටත්, එහිදී අවශ්‍ය වූවහොත් බැංකු, මූල්‍ය ආයතන හෝ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයන්ගෙන් ණය මුදල්, අයිරා පහසුකම් ආදිය ලබා ගැනීමට අදාළ කොන්දේසි තීරණය කිරීමට හෝ මුදල්, අයිරා පහසුකම් ලබාගැනීමටත් අධිකාරියට බලය තිබේ.

ච) අධිකාරියේ අරමුණු ඉටුකරගැනිම සඳහා විවිධ ව්‍යාපාර ආරම්භ කිරීම හා අධිකාරියේ මෙහෙයවීම යටතේ ආරම්භ කරන රැකියා උත්පාදන ව්‍යාපෘති, ස්වයං රැකියා ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීම, ප්‍රාග්ධනය සඳහා දායකවීම, උපකරණ හා වෙනත් පහසුකම් ලබාදීම හා එබඳු මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී ඇපකරුවන් ලෙස කටයුතු කිරීම

ජ) අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම සඳහා යම් ගොඩනැගිල්ලක් ඉදිකිරිම, මිලට ගැනීම හෝ අළුත්වැඩියා කිරිම හෝ පවත්වාගෙන යාම, කිසියම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

ට) අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍යවන සියළුම ආකාරයේ ගිවිසුම් වලට හා එකඟවීම්වලට කෙලින්ම හෝ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙනු ලබන යම් නිලධාරියෙකු හෝ අනුයෝජිතයෙකු මඟින් එළඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

ඩ) අධිකාරියේ අරමුණු නිසිආකාරව ඉටුකරගැනීම සඳහා අවශ්‍යයැයි සැලකෙන විවිධ වෘත්තීමය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන, නියෝජ්‍යායතන යම් සංඛ්‍යාවක් අධිකාරි විසින් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

ත) අධිකාරියෙහි කාර්යයන් මනාව පවත්වාගෙන යාම හා මෙහෙයවීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන අංශ හා දෙපාර්තමේන්තු ඇතුළු සංවිධාන ව්‍යුහයක් ගොඩනැඟීම හා අධිකාරිය සඳහා සේවකයින්, නිලධාරීන්, නියෝජිතයින් පත්කිරීම, පාරිශ්‍රමික ගෙවීම, කාර්යය නියමයන් තීරණය කිරීම, සේවක මණ්ඩල පුහුණු කිරීම, කාර්යය සාධන ඇගයීම, උසස් කිරීම, විනය පාලනය, සේවයෙන් ඉවත් කිරීම, සුභසාධන කටයුතු හා අනෙකුත් පිරිස් කළමනාකරණ කටයුතු ඉටුකිරීම හා එයට අදාළ රීති පැනවීම.

ද) අධිකාරිය මඟින් සංවිධානය කරනු ලබන පාඨමාලා පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන හා වැඩමුළු ආදියට සහභාගීවන්නන් සඳහා ඇගයීමේ පරීක්ෂණ පැවැත්වීම හා ඔවුන් වෙත සුදුසු සහතික නිකුත් කිරීම.

<u>වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය දැනට ලබා ඇති සාර්ථකත්වය</u>

වයඹ පළාත් මනව සම්පත් සංවර්ධන අධිකාරිය යන නාමයෙන් විස්තර වන මෙම ආයතනයෙහි ප්‍රධාන කාර්යය වී ඇත්තේ පළාත තුළ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම, උපාධිධාරී රැකියා සඳහා ලියාපදිංචි කිරීම, පළාත තුළ තරුණයින් වෘත්තීය පුහුණු කටයුතුවල යෙදවීම සහ සියලුම රැකියා සඳහා යොමු කිරීම වෙයි. එසේම, ආයතනයෙහි ආදායම් උත්පාදන ව්‍යාපෘති වශයෙන් ආරක්ෂක සේවාවන් සහ පවිත්‍රතා කිරීමේ සේවාවන් පවත්වාගනිමින්, එම සේවාවන් පළාත තුළ රාජ්‍ය ආයතන වෙත ලබාදෙමින් ආදායම් උත්පාදන කටයුතු වල නියැලීමයි.

එසේ වුවද, ආයතනය පවත්වාගෙන යාමේ දී පළාත් සභා අරමුදලින් වාර්ෂිකව විසර්ජනය කරන මුදල් ද ආයතනයට වැදගත් වී ඇත්තේ ආයතනයෙහි සේවා සම්බන්ධයෙන් වන ව්‍යාප්තිය පුළුල් වීම හේතු කොටගෙනයි.

එය එක්තරා ආකාරයකින් ව්‍යවස්ථාවේ මුඛ්‍ය පරමාර්ථයට අනනුකූල වුවත්, පළාත් සභාවේ කාර්යය භාරයට එමඟින් යම් ව්‍යංගදායකත්වයක් ලැබීමෙන් පළාත් සභා අරමුදලට පහසුවක් සැලසෙනු ඇත.

කෙසේ වෙතත් අදාළ 1994 අංක 01 දරණ ප්‍රඥප්තියෙහි කෙටුම්පත් කරන දෝෂයන්ගෙන් හා ව්‍යවස්ථාව සමඟ සැසඳීමේදී නෛතික දෝශයන්ගෙන් යුක්ත බව ද සැලකිය යුතුය.

<u>වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය පිළිබඳ තවදුරටත් සාර්ථකත්වය සඳහා යෝජනා හා නිර්දේශ</u>

අ) වයඹ පළාත් 1994 අංක 01 දරණ වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය යටතේ ද, පරමාර්ථ නිශ්චිත කරමින්, ප්‍රඥප්තියෙහි ලුහුඩු නාමය යටතේ ක්‍රියාත්මක වන දිනය විස්තරවීම ද නීත්‍යානුකූල කරමින් සහ නිරීක්ෂණය කර ඇති ව්‍යවස්ථානුකූල වීම සඳහා අනෙකුත් නෛතික දෝෂ නිවැරදි වන පරිදි නව ප්‍රඥප්තියක් පැනවීම.

ආ) විශේෂයෙන්ම ආයතනික සංයුතියට විෂයානුබද්ධ දැනුම ඇති පාර්ශවයන් ඇතුළත් වී තිබීම මෙවැනි ස්වභාවයකින් යුත් ප්‍රඥප්තියක අත්‍යවශ්‍ය වෙයි. නැතහොත් ආයතනික අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීමේදී හා විෂය පථය හඳුනාගැනීමේ දී ගැටළු මතුකරයි.

ඇ) ආයතනික අරමුදලක් පිහිටුවීම වෙනුවට, ප්‍රඥප්තිය යටතේ ගිණුමක් පිහිටුවීම යන්නෙන්, සංස්ථාපිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවයට ඇති වී ඇති බලපෑම ඉවත්වීම සඳහා නව ප්‍රඥප්තියක් යටතේ ආයතනයට අනන්‍ය වන අරමුදලක් පිහිටුවීමට ක්‍රියාකිරීම හා එහි ආදායම් වියදම් නිෂ්චය කිරීම

ඈ) ඉදිරියට පනවනු ලබන ප්‍රඥප්තියක් යටතේ ආයතනික පරමාර්ථය හා අරමුණු සමඟ සැලකීමේදී මානව සම්පත් සංවර්ධන අධිකාරිය යන නාමය උචිත ද යන්න නැවත සමාලෝචනය කිරීම.

<u>වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය</u>

වයඹ පළාතේ 1990 අංක 11 දරණ කාර්මාන්ත සේවා කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනයකි.

<u>වයඹ පළාත් කාර්මාන්ත සේවා කාර්යාංශයෙහි කාර්යභාරය</u>

(අ). වයඹ පළාතේ කර්මාන්තවලට අනුබල දීමට හා ඒවා දියුණු කිරීමට සහය වීම.

(ආ). දේශීය හා විදේශීය ආයෝජකයින් වයඹ පළාතට ආකර්ෂණය කරගැනීමට හා පුරෝගාමී ශක්තියෙන් යුත් ව්‍යාපෘති හඳුන්වාදීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් එවැනි ආයෝජකයින්ට සහාය වීම.

(ඇ). පෙළඹවීම් ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම්වලින් හෙබි හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම.

(ඈ). ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනික කටයුතු කරගෙන යෑම පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ, සම්මේලන හා වැඩමුළු, අධ්‍යයන චාරිකා සහ දැනුම හා තොරතුරු පතුරුවාලීම සඳහා වෙනත් වැඩසටහන් ඇති කිරීම.

<u>වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශයෙහි සංයුතිය.</u>

මෙය වයඹ පළාත් කාර්යාංශ සේවා සාමාජිකයින්ගෙන් සහ පත්කළ සාමාජිකයින්ගෙන් සමන්විත වෙයි.

සම්පූර්ණ සාමාජිකයින් ගණන හතකි.

<u>නිල සාමාජිකයින්</u>

- වයඹ පළාත් ප්‍රධාන ලේකම්
- කර්මාන්ත විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්
- කෘෂිකර්ම විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්
- ප්‍රධාන අමාත්‍යවරයා පත්කරන ලද සාමාජිකයින්
- බැංකු ක්ෂේත්‍රයේ නියෝජිතයින්
- පෞද්ගලික කර්මාන්තකරුවන් දෙදෙනෙකු
- වාණිජ මණ්ඩල සාමාජිකයෙකු

ප්‍රධාන අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පත් කරන සාමාජිකයන් දෙදෙනකු වශයෙන් සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව හතකි.

එසේම කාර්යාංශයෙහි සභාපතිවරයා වනුයේ වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාය.

තව ද කාර්යාංශයෙහි පරිපාලනය සහ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කිරීම සඳහා සුදුසුකම් ඇති අයෙකු පත්වන අතර ඔහු ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ප්‍රධාන පරිපාලන නිලධාරියා ද වන්නේය.

**වයඹ පළාතේ කර්මාන්ත සේවා කාර්යාංශයෙහි බලතල.**

(අ). යම් චංචල හෝ නිශ්චල දේපලක් සන්තකයට ගැනීම නැතහොත් දැරීම, බදු ගැනීම හෝ දීම, කුලියට ගැනීම, උකස් කිරීම, අඩපණ කිරීම හෝ අන්‍යාකාරයකට අන්සතු කිරීම.

(ආ). කර්මාන්ත දිරි ගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම.

(ඇ). කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා හවුල් ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත් ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම්වලට හෝ ඇතුළත් විය හැකි ය.

(ඈ). කර්මාන්ත සංවර්ධනයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය වීම, සම්බන්ධීකරණය හා අනුබල දීම.

(ඉ). කාර්යාංශය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම.

(ඊ). කාර්යාංශයට කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම.

(උ). තම සේවකයින් පත්කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන්ගේ විනය පාලනය කිරීම.

(ඌ). සිය සේවකයන් පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, හැසිරීම හා ඔවුන්ට නිවාඩු ලබාදීම පිළිබඳව රීති සම්පාදනය.

(එ). සිය සේවකයින් සඳහා කාර්යය නියමයන් ඇති කිරීම ඔවුන්ගේ කාර්යය සාධනය ඇගයීම සහ අවශ්‍ය පිළියම් යෙදීම.

(ඒ). කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ කාර්යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි උපකරණ අරමුදල් කාර්ය මණ්ඩල සහ වෙනත් ආධාර පිළිගැනීම.

**වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශයේ දැනට ලබා ඇති සාර්ථකත්වය.**

වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය ස්ථාපනය කිරීමේ මූලික අරමුණ වයඹ පළාත් කර්මාන්ත ව්‍යාපෘතියකට අවශ්‍ය පසුබිමක් වයඹ පළාත නිර්මාණය කිරීම බව ප්‍රඥප්තියෙහි අන්තර්ගතය අනුව පෙනී යයි. ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සහ හිතකර ආයෝජන වාතාවරණයක් පළාත තුළ ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වීමකට ප්‍රඥප්තිය තුළින් කාර්යාංශයට හැකියාව උදා වී ඇත.

විශේෂයෙන්ම මෙම ආයතනය කරුණු ගණනාවක් යටතේ ව්‍යාප්ත වෙමින් ආයතනික අරමුණු කරා ළඟා වූ ආයතනයක් බවට පත් වී ඇත. බලශක්ති කළමනාකරණය, පරිසර කළමනාකරණය යන ක්ෂේත්‍ර උදෙසා වන වැඩසටහන් මෙන්ම පළාත තුළ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනයට හේතු වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උනන්දු වී ඇත. ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් වීම සහ සංචාරක සේවාවන් පවත්වාගෙන යන වැනි වෙනත් ආයතන අවධානයට ලබා නොදුන් කරුණු කෙරෙහි යොමු වී ඇත.

එසේම කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති කළමනාකරණය, සනීපාරක්ෂක සේවා, උපදේශන සේවා, ආදිය ඉතා පුළුල් පරාසයක ව්‍යාප්ත වී ඇති මෙම ආයතනය තම ව්‍යවස්ථාවේ පරමාර්ථයන්ට ළඟා වෙමින් පවතී.

වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය ආසන්න මුදල් වර්ෂය මත අත්කර ඇති ස්ථාවර වත්කම් ප්‍රමාණය රුපියල් 75,106,196,336.59 කි.

වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය තවදුරටත් සාර්ථකත්වය සඳහා කරනු ලබන යෝජනා හා නිර්දේශ.

වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ සැලකිය යුතු පරිචයක් දැනටමත් ගොඩනගාගෙන ඇත. මෙම තත්ත්වය යටතේ තවදුරටත් ආයතනික ව්‍යාප්තිය උදෙසා ප්‍රඥප්තිය යටතේ විධි විධාන වඩාත් ශක්තිමත් කරගැනීම වැදගත්ය. විශේෂයෙන් කාර්යාංශයෙහි අරමුදල භාවිතයේදී ආයතනයෙහි අරමුදලෙහි මුදල භාවිතයෙහිලා පළාත් සභා අරමුදලට මුදල් බැහැර කිරීම සඳහා විධි විධාන ඇතුළත් කරගැනීම වැදගත්ය. තව ද ප්‍රඥප්තිය යටතේ රීති සෑදීමේ බලය හා රෙගුලාසි සෑදීමේ බලය යන ආකාර දෙකකින් විස්තර වී තිබීම නිවැරදි කරගැනීම වැදගත් වන අතර, මේ සියලු කාර්යයන් අරමුණු කරගනිමින් ප්‍රඥප්තිය සංශෝධනය කරගැනීම ප්‍රමාණවත් වනු ඇත.

## සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය.

සබරගමුව පළාත තුළ මාර්ග සහ වෙනත් ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහාත්, යන්ත්‍රෝපකරණ වාහන අලුත්වැඩියා කිරීම, කුළියට දීම, වාහන පැදවීම පුහුණු කිරීම හා වාහන යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහාත්, ක්‍රියාත්මක වන අධිකාරියකි. සබරගමුව පළාතේ 2009 අංක 2 දරන සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කර ඇත.

සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියෙහි කාර්යභාරය.

ඇ) රජය විසින් සබරගමුව පළාත් සභාව වෙත පවරාදෙන ලද යන්ත්‍රෝපකරණ උපකරණ, වාහන සහ අනෙකුත් සියළු චංචල වූත්, නිශ්චල වූත් දේපලවල අයිතිය භාරගැනීම හා පරිහරණය කිරීම හා ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා එකී දේපල උපයෝගී කරගැනීම.

ආ) අධිකාරිය සතු කරනු ලබන යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන හෝ වෙනයම් කාර්මික උපකරණ කට්ටල අලුත්වැඩියා කිරීම, සහ අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ, උපකරණ වාහන හෝ වෙනයම් කාර්මික උපකරණ කට්ටල අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ සේවා කිරීම භාරගැනීම සඳහා ද වැඩපොළවල් කර්මාන්තශාලා සහ ගරාජ් පිහිටුවීම සහ නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම

ඇ) කර්මාන්ත සංවර්ධන ව්‍යාප්තිකරණය වැඩි දියුණු කිරීම ද, ගෙවී යන හෝ අපතේ යන ද්‍රව්‍යවලින් වැඩි උපයෝගීතාවයක් ලබා ගැනීම ද අරමුණු කරගත් ක්‍රම සහ ක්‍රියා විධි සොයා ගැනීම ද, කර්මාන්තයේ භාවිතා කෙරෙන තාක්ෂණික ක්‍රියාමාර්ග සහ ක්‍රම දියුණු කිරීම ද අභිමතාර්ථ කරගත් යම් ආකාරයක් අධිකාරියට යෝග්‍ය වේ යැයි හැඟේ නම් එබඳු ආකාරයකින් අත්හදාබැලීම්, විමර්ශනය කිරීම හා පර්යේෂණ කිරීම.

ඈ) සබරගමුව පළාතේ පළාත් සභාවට අයිති හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පෞද්ගලික අංශයට හෝ අයිති බර යන්ත්‍රෝපකරණ ද්‍රව්‍ය හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම.

ඉ) අධිකාරිය විසින් භාරගන්නා ලද යම් කාර්යක නිමාවේ ගුණාත්මක ප්‍රමිතිය සහතික කිරීම.

ඊ) පර්යේෂණ සේවකයන්ගේ පුහුණු කටයුතු නගා සිටුවීම.

උ) කර්මාන්ත පර්යේෂණ කටයුතු සහ තාක්ෂණික පුහුණු කිරීම් අභිවර්ධනය කිරීමට ආධාර කිරීම.

ඌ) කාර්මික සහ තාක්ෂණික දැනුම පිළිබඳ පුහුණු කිරීම් කටයුතු.

<u>සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය.</u>

සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් යුත් අධ්‍යක්ෂක මණ්ඩලයකින් සමන්විතය. එය නිලබලයෙන් හා පත්කළ සාමාජිකයන් වශයෙන් වෙයි.

එහි සංයුතිය පහත පරිදි වෙයි,

අ) සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය අයත් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් පත්කරනු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

ආ) සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය අයත් විෂය භාර අමාත්‍යවරයා නම් කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ඉංජිනේරුවරයෙකු

ඇ) සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය අයත් විෂයභාර අමාත්‍යවරයා නම් කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ ගණකාධිකාරීවරයෙකු

ඈ) ප්‍රවාහනය, ආර්ථික විද්‍යාව පරිපාලනය හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එකක හෝ වැඩි ගණනක පුළුල් පළපුරුද්දක්, සුදුසුකම් හෝ හැකියාවක් දක්වා ඇත්තා වූ බවට සබරගමුව පළාතේ විෂයභාර අමාත්‍යවරයා සෑහීමට පත්වන පුද්ගලයන් තුන්දෙනෙකුගෙන්

ඉහත සංයුතියට ඇතුළත් වන අමාත්‍ය මණ්ඩල සාමාජිකයන් අතරින් එක් අයෙකු අධිකාරියෙහි සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා පත්කළ යුතුය.

එසේම අධිකාරියෙහි කළමනාකරණය සඳහා අධිකාරිය විසින් අධිකාරියට විධායක අධ්‍යක්ෂකවරයෙකු පත්කළ යුතු අතර, ඔහු අධිකාරියෙහි ලේකම්වරයා ද වෙයි.

<u>සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියෙහි බලතල.</u>

(1). සබරගමුව පළාත් සභාවේ යම් සංවර්ධන වැඩසටහනක ඇතුළත් යම් නිර්මාණ කටයුත්තක් සම්බන්ධයෙන් ක්‍රම සම්පාදනය කිරීම සැලසුම් කිරීම සහ එබඳු කටයුත්තක් කිරීම සහ උපදෙස් දීම හෝ තාක්ෂණ සහාය ලබාදීම,

(2). යම් සංවර්ධන කටයුත්තක භෞතික පිහිටීම, අවශ්‍යතාව හෝ එකී සංවර්ධන කටයුත්ත පිහිටි ප්‍රදේශය යන කරුණු සලකා බැලීමෙන් එකී කරුණුවල ඇති විශේෂ ගුණාගුණ මත පිහිටා වඩා විධිමත් විද්‍යාත්මක සිද්ධාන්ත හෝ ප්‍රායෝගික සත්‍යතා සලකා බලා අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාරදෙන ලද සංවර්ධන කටයුත්තක් හෝ එබඳු සංවර්ධන කටයුත්තක

කොටසක් සම්බන්ධයෙන් පිළියෙල කරන ලද යම් සැලැස්මක් හෝ සැලසුම්කරණය පිළිබඳ තාක්ෂණික උපදේශ ලබාදීම.

(3). අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාරදෙන ලද නිර්මාණ කටයුත්තක් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ ඇස්තමේන්තු පිළියෙළ කරවීම.

(4). අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාරදෙන ලද යම් නිර්මාණ කටයුත්තක් පිළිබඳ පිළියෙල කරන ලද ඇස්තමේන්තුවක් ඌණ ඇගයීමකින් හෝ අධික ඇගයීමකින් යුක්ත වන බව අධිකාරියට පෙනී ගිය විට එබඳු ඇස්තමේන්තුවක් පරීක්ෂා කිරීම, වෙනස් කිරීම සංශෝධනය කිරීම පුනරීක්ෂණය කිරීම හෝ යළි අලුතින් ඇස්තමේන්තු කිරීම.

(5). අධිකාරිය විසින් භාර ගන්නා ලද යම් නිර්මාණ කටයුත්තක් හෝ යම් ව්‍යාපාර කටයුත්තක් පිළිබඳව වන අනුමත ඇස්තමේන්තු මුදල අධිකාරිය විසින් භාරගන්නා ලද එබඳු කටයුත්ත ඉටුකර සම්පූර්ණ කිරීම වෙනුවෙන් ලද අධිකාරිය අය විය යුතු පිරිවැය ලෙස අය කර ගත යුතුය.

(6). සියලූ වර්ගවල ගොඩනැගිලි කර්මාන්තශාලා, පට්ටල් අංගන සහ වෙනත් පහසුකම් හා ලෙහෙසිකම් තැනීමෙන්, පිහිටුවීමෙන්, මිලදී ගැනීමෙන් හෝ අන්‍ය විධියකින් සන්තකයට ගැනීම අභිවෘධිමත් කිරීම හා ක්‍රියාත්මකව පවත්වා ගැනීම.

(7). ඒජන්සියේ අභිමතාර්ථ මුදුන්පත් කරගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වී ඇත්තා වූ යන්ත්‍රෝපකරණ උපකරණ නිර්මාණ හෝ යාන්ත්‍රික උපකරණ කට්ටල, වාහන, යන්ත්‍ර කොටස්, අමතර කොටස්, අන්‍ය සම්පත් යම් ලෙසකින් විස්තර කර ඇති දේපල සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් මිලදී ගැනීම, පවරා ගැනීම දීර්ඝකාලීනව කුලියට ගැනීම කෙටිකාලීනව කුලියට ගැනීම බද්දට ගැනීම හෝ සන්තකයට ගැනීම.

(8). සන්තකය අධිකාරිය වෙත මුළුමනින් හා තිර වශයෙන් පැවරී ඇත්තා වූ ද, ඒජන්සියේ කාර්යය සඳහා උපයෝගී කරනොගත හැකි වන්නාවූ ද, කිසි දේපලක්, ගොඩනැගිල්ලක් යන්ත්‍රයක් වාහනයක් උපකරණයක්, අමතර කොටසක් උපකරණ කට්ටලයක් හෝ වෙන යම් ද්‍රව්‍යයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත ප්‍රසිද්ධියේ විකිණීම

(9). නිර්මාණ කටයුත්තක් යම් වර්ගයක් යන්ත්‍රෝපකරණයක හා වාහනවල නඩත්තු කිරීමක් සහ අලුත්වැඩියා කිරීමක් සඳහා හෝ සම්බන්ධයෙන් කටයුතු කිරීම භාරගැනීම සහ කොන්ත්‍රාත්තුවලට හා ගිවිසුම්වලට බැඳීම සහ ඉටු කර දෙන ලද සේවය සඳහා ගාස්තු අය කරගැනීම හෝ ලැබීම් ලබාගැනීම.

(10). යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක්, උපකරණ කට්ටලයක් හෝ වාහනයක් දීර්ඝකාලීන කුලියට දීම, කෙටි කාලීන කුලියට දීම හෝ බද්දට දීම සහ ඊට ගාස්තු අය කිරීම සහ වෙනත් ගෙවීම් ලබාගැනීම.

(11). මාර්ග හෝ වෙනත් නිර්මාණ කටයුතුවලදී උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත පොළවල් පිහිටුවීමටත් ගල් කඩන යන්ත්‍ර සවි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන කිනම් වර්ගයක හෝ ඉඩම් දේපොල හෝ කාර්ය ස්ථාන බද්දට, දීර්ඝ කාලීන කුලියට හෝ කෙටි කාලීන කුලියට ලබා ගැනීම.

(12). සබරගමුව පළාත තුළ කිසියම් ස්ථානයක යාන්ත්‍රික කම්හල් පිහිටුවීමට, එබඳු කම්හල් පිහිටුවීමට, ඉඩකඩ ලබාගැනීමට සහ එබඳු කම්හල් පවත්වාගෙනයාමට අවශ්‍ය වන්නා වූත් ප්‍රයෝජනවත් වන්නා වූත්, ඉඩම් ගොඩනැගිලි, කාර්යාල භූමි, අංගන සහ සෑම වර්ගයක දේපල, තැනීම් උපකරණ සහ කුමන ආකාරයේ හෝ දෙයක් මිලදීගැනීම හෝ අන් ආකාරයකින් බද්දට ගැනීමෙන් අත්පත් කර ගැනීම, නිර්මාණය කිරීම, අභිවෘද්ධිමත් කිරීම සහ උපයෝගීකර ගැනීම.

(13). යම් අවශ්‍ය යන්ත්‍ර කට්ටලයක් ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට ද යන්ත්‍රෝපකරණ සහ වාහන අලුත්වැඩියා කිරීමේ ව්‍යවසාය කරගෙන යාමට ද අවශ්‍යවන්නාවූ නිසි ඝන ද්‍රව්‍යයක්, ද්‍රවයක් ඉමල්ෂන් ද්‍රව්‍යයක් ලිහිසි තෙල් ඉන්ධන තෙල්, වායු සහ වෙන යම් ද්‍රව්‍යයක් ද ගොඩනැගිලි, ඉඩම් උපකරණ, මෙවලම් සහ සේවා ව්‍යූහ ඉදි කිරීම් ඇතුළු උපකරණ මිලදීගැනීම බද්දට ගැනීම සහ පවරා ගැනීම අත්පත් කර ගැනීම.

(14). අධිකාරියට බලපාන සියලු ආකාරයේ පාඩු, හානි අනතුරු අවධානම් සහ ණය බැරකම් ආවරණය වන සේ කිසි සමාගමකින් හෝ පුද්ගලයකු සමඟ රක්ෂණ ගිවිසුම් වලට ඇතුලු වීම.

(15). ජලය, විදුලිය, වායු, ඉන්ධන තෙල්, යන්ත්‍ර කොටස් සහ වෙනත් සේවා පහසුකම් සපයා ගැනීම සඳහා පෞද්ගලික අංශය ඇතුලු යම් සංවිධානයක් සමග කොන්ත්‍රාත්තු ඇති කිරීම සහ ගිවිසුම්වලට ඇතුලුවීම.

(16). අධිකාරිය පිහිටුවීම අනුදන්නා ලද දිනයේ සිට ගණන් ගනු ලබන මාසික වාරික මගින් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලය තුළදී නිම කළ යුතු පොලියෙන් නිදහස් කරන ලද ණය පදනමක් මත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇති අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සාමුහික මූල්‍ය ප්‍රතිපාදනයක් ආරම්භක ක්‍රියාකාරී ප්‍රාග්ධනය ලෙස ලබාගැනීම සහ එකී ප්‍රාග්ධනයෙන් වැය දැරීම.

(17). අධිකාරිය විසින් ඉටුකරන ලද කටයුත්තක් හෝ සේවයක් වෙනුවෙන් එකී කටයුත්ත හෝ සේවය සඳහා ගෙවිය යුතු බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇස්තමේන්තු මුදල අයවිය යුතු ගෙවීම් ලෙස අව කිරීම සහාය ලබා ගැනීම.

(18). යම් කටයුත්තක් හෝ සේවයක් පිළිබඳව අනුමතය වූ ඇස්මේන්තුවකින් වැය නොවී ඉතිරි වන යම් මුදලක් තිබේ නම් එබඳු මුදල අධිකාරිය විසින් නීත්‍යානුකූලව උපයන ලද මුදලක් සේ ලාභයක් වශයෙන් එක් රැස් විය යුතුය.

(19). වත්කම් ක්ෂය වීම, වෙන් කළ මුදල්, රක්ෂණ වාරික ණය පියවීම හෝ ඒජන්සියේ යහපතට උපස්ථම්භක වන වෙන යම් කාර්යයක් සඳහා මුදල් ලබා ගැනීම සඳහා අරමුදලක් ඇති කිරීම.

(20). පාරිතෝෂික වන්දි, ප්‍රදාන, දායකවීම හෝ අන් ආකාරයකින්ද, ජාතික, රාජ්‍යමය, අධ්‍යාපනික, සංස්කෘතික, පුණ්‍ය, සුභ සාධක, දේශපාලනික හෝ ආගමික, අභිමතාර්ථ සඳහා ද ඒජන්සිය යෝග්‍ය යැයි සිතෙන ආයතන සඳහා ද මුදලින් ප්‍රදානය කිරීම.

(21). චෙක් පත්, බැංකු අණකර, ණයකර, මුදල් ඇනවුම් හෝ මුදල් අණ කිරීම, භාර ගැනීම, පිටපත් කිරීම, හෝ ගනුදෙනු කිරීම.

(22). සබරගමුව පළාත තුළ යම් ස්ථානයකදී හෝ අමාත්‍යවරයා විසින් නියම කළ විට ශ්‍රී ලංකා ජන රජයේ යම් ප්‍රදේශයකදී ඉහත කී සියලු දේ හෝ ඉන් යම් එකක් හෝ කිරීම.

**<u>සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය ලබා ඇති සාර්ථකත්වය.</u>**

2009 වර්ෂයේ ප්‍රඥප්තිය බලාත්මක වී ඇතත් ආයතනය 2011 වර්ෂයේදී පමණ ආරම්භ වී ඇති අතර, ඉන් වසර දෙකක් ගත වන අවස්ථාව වනවිට ආයතනය ලාභ උපයන මට්ටමට පත්ව ඇත.

අධිකාරියෙහි බලතල ඒ වන විට බලාත්මකව පැවති උතුරු මැද පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ප්‍රඥප්තිය යටතේ සඳහන් බලතල හා බොහෝ දුරට සමාන වන පරිදි ඇතුළත් කරන්නට යෙදී ඇත. ඒ යටතේ බලතල ව්‍යාප්ත වූ ආකාරයක් තිබුණ ද ක්‍රියාත්මක යාන්ත්‍රණය තුළ උපරිම වශයෙන් බලතල සඳහා ව්‍යාප්ත වී නොමැත.

අධිකාරිය නමින් අධිකාරියෙහි අරමුදලක් පවත්වාගෙන යන අතර පළාත් සභා අරමුදලින් වාර්ෂික විසර්ජනය කරන මුදල් හා අධිකාරියෙහි බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා අධිකාරිය නමින් උපචිත වන මුදල් අධිකාරියෙහි අරමුදල ලැබිය යුතු ආදායම් වශයෙන් දක්වා ඇත.

අරමුදලට රැස්කරන මුදලින් ආයතනය විසින් වියදම් කළ හැකි පරාසය සේවා නියුක්තියට පාරිශ්‍රමික ගෙවීම සහ අධිකාරියෙහි කළ යුතු වෙනත් වියදම් සඳහා සීමා වී පවතියි.

අධිකාරියට උපයන මුදල් ආයෝජනය කිරීම සඳහා හෝ අධිකාරියෙහි උපයන මුදලින් කොටසක් පළාත් සභා අරමුදලට බැර කිරීම සඳහා ප්‍රඥප්තිය යටතේ විධිවිධාන සැලසී නොමැත.

පළාත් සභාව තුළින් බැහැර වීමේ හැකියාව ඇති මුදල් ප්‍රමාණයන් එසේ නොවී පළාත් සභාව තුළට සංසරණය වීමට අධිකාරිය හේතු වී තිබීම එහි යම් සාර්ථකත්වයකි. එසේම බාහිර ආයතනයන්ට සේවා සම්පාදනය තුළින් අමතර මුදලක් රැස්කරන්නට හැකිවීම ආයතන පවත්වාගෙන යාමේදී දරන්නට වන පිරිවැය සමඟ සැසඳීමේදී එය වඩාත් වාසිදායක වෙයි.

සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සම්බන්ධයෙන් තවදුරටත් සාර්ථකත්වය උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.

ආ) දැනට ක්‍රියාත්මක වන ප්‍රඥප්ති වෙනුවට එම ප්‍රඥප්තිය පරිච්චින්න කර, නව ප්‍රඥප්තියක් පැනවීම. වඩාත් උචිත අතර, නැතහොත් අවම වශයෙන් පවතින ප්‍රඥප්තිය පරිච්චින්න කිරීම.

ආ) පනවන නව ප්‍රඥප්තියක දීර්ඝ නාමය යටතේ ආයතන පරමාර්ථය විස්තර කිරීම, ඊට සාපේක්ෂ අරමුණු හා බලතල විස්තර කිරීම වැදගත් වෙයි. නැතහොත් ආයතනය ක්‍රියාත්මක වීමේදී, පරිපාලනය පවත්වාගෙන යාමේදී ගැටළුසහගත වේ.

ඇ) අධිකාරියට ලාභ උපදවා ලීමට හැකි වෙනත් ක්‍රියාමාර්ග හඳුනාගැනීම සහ ඊට අනුකූල වන බලතල යෝජිත ප්‍රඥප්තියට ඇතුළත් කිරීම විශේෂයෙන්ම මූල්‍ය ආයෝජන සඳහා අරමුදලෙහි මුදල් යෙදවිය හැකි පරිදි බලතල ඇතුළත් කිරීම වැදගත් වෙයි.

ඈ) අරමුදලට පළාත් සභාවෙන් මුදල් විසර්ජනය කිරීමට ලබාදී ඇති විධි විධානයකට සමාන්තරව අරමුදලින් පළාත් සභා අරමුදලට මුදල් බැර කිරීමට හැකි විධි විධානය ඉදිරියේදී පනවා ගනු ලබන ප්‍රඥප්තියට හෝ සංශෝධන ප්‍රඥප්තියට ඇතුළත් කිරීමට ක්‍රියා කිරීම.

ඉ) ප්‍රඥප්තිය පරිච්චින්න කර, නව ප්‍රඥප්තියක් පනවන තෙක් අධිකාරියට පිරිනමා ඇති බලතල අතර උපරිම වශයෙන් ව්‍යාප්ත වීමට කටයුතු කිරීම.

උතුරුමැද පළාතේ සංවර්ධන නිර්මාණකරණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය.

ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත් සභාවේ වාහන යන්ත්‍රෝපකරණ අයිතිය පවත්වාගැනීම, නඩත්තුව හා නඩත්තු වැඩපලවල් පවත්වාගෙන යෑම කර්මාන්ත සංවර්ධනයට අදාළ තාක්ෂණික පර්යේෂණ සිදු කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශය උදෙසා භාණ්ඩ ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම තාක්ෂණික පුහුණු කිරීම් භාරවූ ආයතනයකි.

උතුරුමැද පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ කාර්යභාරය.

අ). රජය විසින් උතුරුමැද පළාත් සභාව වෙත පවරා දෙන ලද යන්ත්‍රෝපකරණ, උපකරණ වාහන සහ අන් සියළුම චංචල අචංචල වූත් දේපලවල අයිතිය භාරගැනීම හා පරිහරණය කිරීම ද ප්‍රඥප්තියේ කාරයය සඳහා එකී දේපල උපයෝගී කර ගැනීම.

ආ). ඒජන්සිය සතු යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන හෝ වෙනයම් කාර්මික උපකරණ කට්ටල අළුත්වැඩියා කිරීම නඩත්තු කිරීම සහ සේවා කිරීම සඳහා ද, යම් දෙපාර්තමේන්තුවක්,

සංස්ථාවක් හෝ පෞද්ගලික අංශය සතු යන්ත්‍රෝපකරණ උපකරණ, වාහන හෝ වෙන යම් කාර්මික උපකරණ කට්ටල අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ සේවා කිරීම භාර ගැනීම සඳහා ද වැඩපොළවල්, කර්මාන්ත ශාල සහ ගරාජ් පිහිටුවීම සහ නඩත්තු කිරීම.

ඈ). කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිකරණය වැඩි දියුණු කිරීම ද ගෙවීයන හෝ අපතේ යන ද්‍රව්‍යවලින් වැඩි උපයෝගීතාවයක් ලබා ගැනීම ද අරමුණු කරගත් ක්‍රම හා ක්‍රියා විධි සොයා ගැනී මද කර්මාන්තයේදී භාවිතා කොරෙන තාක්ෂණික ක්‍රියා මාර්ග සහ ක්‍රම දියුණු කිරීම ද අභිමතාර්ථ කරගත් යම් බඳු ආකාරයක් ඒජන්සියට යෝග්‍යා යැයි හැඟේ නම් එබඳු ආකාරයකින් අත් හදාබැලීම්, විමර්ශනය කිරීම හා පර්යේෂණ කිරීම.

ඇ). උතුරුමැද පළාතට අයිති හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පෞද්ගලික අංශයට හෝ අයිති බර යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය හෝ වෙන යම් බඩු ප්‍රවාහනය කිරීම භාර ගැනීම

ඉ). ඒජන්සිය විසින් භාරගන්නා ලද යම් කාර්යක නිමාවේ ගුණාත්මක ප්‍රමිතිය සහතික කිරීම ද,

ඊ). පර්යේෂක සේවකයින්ගේ පුහුණු කටයුතු නභාලීම,

උ). කර්මාන්ත පර්යේෂණ කටයුතු සහ තාක්ෂණික පුහුණු කිරීම් අභිවර්ධනය කිරීමට ආධාර කිරීම.

<u>උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සංවිධාන ව්‍යුහය.</u>

උතුරු මැද පළාතේ විෂයභාර අමාත්‍යවරයා ස්වාභිමතානුකූලව පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් අධ්‍යක්ෂක මණ්ඩලයකින් සමන්විතය. ඉන් එක් සාමාජිකයකු කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි.

<u>උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ බලතල.</u>

(1). උතුරුමැද පළාත් සභාවේ යම් සංවර්ධන වැඩසටහනක ඇතුලත් යම් නිර්මාණ කටයුත්තක් සම්බන්ධයෙන් ක්‍රම සම්පාදනය කිරීම, සැලසුම් කිරීම සහ එබඳු කටයුත්තක් කිරීම සහ උපදෙස්දීම හෝ තාක්ෂණ සහාය ලබාදීම,

(2). යම් සංවර්ධන කටයුත්තක භෞතික පිහිටීම, අවශ්‍යතාව හෝ එකී සංවර්ධන කටයුත්ත පිහිටි ප්‍රදේශය යන කරුණු සලකා බැලීමෙන් එකී කරුණුවල ඇති විශේෂ ගුණාගුණ මත පිහිටා වඩා විධිමත් විද්‍යාත්මක සිද්ධාන්ත හෝ ප්‍රායෝගික සත්‍යතා සළකා බලා ඒජන්සිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා බාරදෙනලද සංවර්ධන කටයුත්තක් හෝ එබඳු සංවර්ධන කටයුත්තක කොටසක් සම්බන්ධයෙන් පිළියෙල කරන ලද යම් සැලැස්මක් හෝ සැලසුම්කරණය පිළිබඳ තාක්ෂණික උපදේශ ලබාදීම.

(3). ඒජන්සිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාරදෙන ලද නිර්මාණ කටයුත්තක් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ ඇස්තමේන්තු පිළියෙළ කරවීම.

(4). ඒජන්සිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා බාරදෙන ලද යම් නිර්මාණ කටයුත්තක් පිළිබඳ පිළියෙල කරන ලද ඇස්තමේන්තුවක් ඌණ ඇගයීමකින් හෝ අධික අගැයීමකින් යුක්ත වන බව ඒජන්සියට පෙනී ගිය විට එබඳු ඇස්තමේන්තුවක් පරීක්ෂා කිරීම, වෙනස් කිරීම සංශෝධනය කිරීම පුනරීක්ෂණය කිරීම හෝ යළි අළුතින් ඇස්තමේන්තු කිරීම.

(5). ඒජන්සිය විසින් භාර ගන්නා ලද යම් නිර්මාණ කටයුත්තක් හෝ යම් ව්‍යාපාර කටයුත්තක් පිළිබඳව වන අනුමත ඇස්තමේන්තු මුදල ඒජන්සිය විසින් භාරගන්නා ලද එබඳු කටයුත්ත ඉටුකර සම්පූර්ණ කිරීම වෙනුවෙන් ඒජන්සියට අය විය යුතු පිරිවැය ලෙස අය කර ගත යුතුය.

(6). සියළු වර්ගවල ගොඩනැගිලි කර්මාන්තශාලා, පට්ටල් අංගන සහ වෙනත් පහසුකම් හා ලෙහෙසිකම් තැනීමෙන්, පිහිටුවීමෙන්, මිලදී ගැනීමෙන් හෝ අන්‍ය විධියකින් සන්තකයට ගැනීම අභිවෘධිමත් කිරීම හා ක්‍රියාත්මකව පවත්වා ගැනීම.

(7). ඒජන්සියේ අභිමතාර්ථ මුදුන්පත් කරගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වී ඇත්තා වූ යන්ත්‍රෝපකරණ උපකරණ නිර්මාණ හෝ යාන්ත්‍රික උපකරණ කට්ටල, වාහන, යන්ත්‍ර කොටස්, අමතර කොටස්, අන්‍ය සම්පත් යම් ලෙසකින් විස්තර කර ඇති දේපල සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් මිලදී ගැනීම, පවරා ගැනීම දිර්ඝකාලීනව කුලියට ගැනීම කෙටිකාලීනව කුලියට ගැනීම බද්දට ගැනීම හෝ සන්තකයට ගැනීම.

(8). සන්තකය ඒජන්සිය වෙත මුළුමනින් හා තිර වශයෙන් පැවරී ඇත්තා වූද, ඒජන්සියේ කාර්යය සඳහා උපයෝගී කර නොගත හැකි වන්නාවූද , කිසි දේපළක්, ගොඩනැගිල්ලක් යන්ත්‍රයක් වාහනයක් උපකරණයක්, අමතර කොටසක් උපකරණ කට්ටලයක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත ප්‍රසිද්ධියේ විකිණීම

(9). නිර්මාණ කටයුත්තක් යම් වර්ගයක් යන්ත්‍රෝපකරණයක හා වාහනවල නඩත්තු කිරීමක් සහ අළුත්වැඩියා කිරීමක් සඳහා හෝ සම්බන්ධයෙන් කටයුතු කිරීම භාර ගැනීම සහ කොන්ත්‍රාත්තු වලට හා ගිවිසුම්වලට බැඳීම සහ ඉටු කර දෙන ලද සේවය සඳහා ගාස්තු අය කර ගැනීම හෝ ලැබීම් ලබා ගැනීම.

(10). යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක්, උපකරණ කට්ටලයක් හෝ වාහනයක් දීර්ඝකාලීන කුලියට දීම, කෙටි කාලීන කුලියට දීම හෝ බද්දට දීම සහ ඊට ගාස්තු අය කිරීම සහ වෙනත් ගෙවීම් ලබා ගැනීම.

(11). මාර්ග හෝ වෙනත් නිර්මාණ කටටයුතු වලදී උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත පොලවල් පිහිටුවීමටත් ගල් කඩන යන්ත්‍ර සවි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය

වන කිනම් වර්ගයක හෝ ඉඩම් දේපොල හෝ කාර්යය ස්ථාන බද්දට, දීර්ඝ කාලීන කුලියට හෝ කෙටි කාලීන කුලියට ලබා ගැනීම.

(12). උතුරු මැද පළාත තුළ කිසියම් ස්ථානයක යාන්ත්‍රික කම්හල් පිහිටුවීමට, එබඳු කම්හල් පිහිටුවීමට, ඉඩකඩ ලබා ගැනීමට සහ එබඳු කම්හල් පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූත් ප්‍රයෝජනවත් වන්නා වූත්, ඉඩම් ගොඩනැගිලි, කාර්යාල භූමි, අංගන සහ සෑම වර්ගයක දේපල. තැනීම් උපකරණ සහ කුමන ආකාරයේ හෝ දෙයක් මිලදී ගැනීම හෝ අන් ආකාරයකින් බද්දට ගැනීමෙන් අත්පත් කර ගැනීම, නිර්මාණය කිරීම, අභිවෘද්ධිමත් කිරීම සහ උපයෝගීකර ගැනීම.

(13). යම් අවශ්‍ය යන්ත්‍ර කට්ටලයක් ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමටද යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කිරීමේ ව්‍යවසාය කරගෙන යාමටද අවශ්‍යවන්නාවූ කිසියම් ඝන ද්‍රව්‍යයක්, ද්‍රවයක් ඉමල්ෂන් ද්‍රව්‍යයක් ලිහිසි තෙල් ඉන්ධන තෙල්, වායු සහ වෙන යම් ද්‍රව්‍යයක්ද ගොඩනැගිලි, ඉඩම් උපකරණ, මෙවලම් සහ සේවා ව්‍යුහ ඉදි කිරීම් ඇතුළු උපකරණ මිලදී ගැනීම බද්දට ගැනීම සහ පවරා ගැනීම අත්පත් කර ගැනීම.

(14). ඒජන්සියට බලපාන සියළු ආකාරයේ පාඩු හා හානි අනතුරු අවධානම් සහ ණය බැරකම් ආවරණය වන සේ කිසි සමාගමකින් හෝ පුද්ගලයකු සමග රක්ෂණ ගිවිසුම්වලට ඇතුළුවීම.

(15). ජලය, විදුලිය, වායු, ඉන්ධනතෙල්, යන්ත්‍ර කොටස් සහ වෙනත් සේවා පහසුකම් සපයා ගැනීම සඳහා පෞද්ගලික අංශය ඇතුළු යම් සංවිධානයක් සමග කොන්ත්‍රාත්තු ඇති කිරීම සහ ගිවිසුම් වලට ඇතුලුවීම.

(16). ඒජන්සිය පිහිටුවීම අනුදන්නා ලද දිනයේ සිට ගණන් ගනු ලබන මාසික වාරික මගින් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලය තුළදී නිම කළ යුතු පොලියෙන් නිදහස් කරන ලද ණය පදනමක් මත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇති අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සාමුහික මූල්‍ය ප්‍රතිපාදනයක් ආරම්භක ක්‍රියාකාරී ප්‍රාග්ධනය ලෙස ලබාගැනීම සහ එකී ප්‍රාග්ධනයෙන් වැය දැරීම.

(17). ඒජන්සිය විසින් ඉටුකරන ලද කටයුත්තක් හෝ සේවයක් වෙනුවෙන් එකී කටයුත්ත හෝ සේවය සඳහා ගෙවිය යුතු බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇස්තමේන්තු මුදල අය විය යුතු ගෙවීම් ලෙස අය කිරීම සහ ලබා ගැනීම.

(18). යම් කටයුත්තක් හෝ සේවයක් පිළිබඳව අනුමතය වූ ඇස්මේන්තුවකින් වැය නොවී ඉතිරිවන යම් මුදලක් තිබේ නම් එබඳු මුදල ඒජන්සිය විසින් නීත්‍යානුකූලව උපයන ලද මුදලක් සේ ලාභයක් වශයෙන් එක් රැස් විය යුතුය.

(19). වත්කම් ක්ෂය වීම, වෙන් කළ මුදල්, රක්ෂණ වාරික ණය පියවීම හෝ ඒජන්සියේ යහපතට උපස්ථම්භක වන වෙන යම් කාර්යයක් සඳහා මුදල් ලබා ගැනීම සඳහා අරමුදලක් ඇති කිරීම.

(20). පාරිතෝෂික වන්දි, ප්‍රදාන, දායකවීම හෝ අන් ආකාරයකින්ද, ජාතික, රාජ්‍යමය, අධ්‍යාපනික, සංස්කෘතික, පූණ්‍ය, සුභ සාධක, දේශපාලනික හෝ ආගමික, අභිමතාර්ථ සඳහාද ඒජන්සිය යෝග්‍ය යැයි සිතෙන ආයතන සඳහාද මුදලින් ප්‍රදානය කිරීම.

(21). චෙක් පත්, බැංකු අණකර, ණයකර, මුදල් ඇනවුම් හෝ මුදල් අණ කිරීම, භාර ගැනීම, පිටපත් කිරීම, හෝ ගනුදෙනු කිරීම.

(22). උතුරු මැද පළාත තුළ යම් ස්ථානයකදී හෝ අමාත්‍යවරයා විසින් නියම කළ විට ශ්‍රී ලංකා ජනරජයේ යම් ප්‍රදේශයකදී ඉහත කී සියළු දේ හෝ ඉන් යම් එකක් හෝ කිරීම.

<u>උතුරු මැද පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය ලබා ඇති සාර්ථකත්වය.</u>

උතුරු මැද පළාතේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය මීට අවුරුදු කිහිපයකට පූර්වයෙන් පළාත් සභාව විසින් නඩත්තු කරන ආයතනයක් වශයෙන් පැවති ඇත. මේ වන විට යම් ලාභ උපද්දවමින් පවත්වාගෙන යනු ලබයි.

අදාළ ප්‍රඥප්තියෙහි දීර්ඝතාවය යටතේ නිශ්චිතතාවයක් දක්වා නොමැති අතර, අධිකාරිය පිහිටුවීම පමණක් පරමාර්ථය වශයෙන් දක්වා ඇත. එසේ වුව ද අරමුණු හා බලතල යටතේ පුළුල් ව්‍යාපෘතියකට කරුණු යෙදී ඇත.

එසේම අනුරාධපුර හා පොලොන්නරු දිස්ත්‍රික් පදනම් කරගනිමින් නියෝජන ආයතන වශයෙන් උප ඒකක පවත්වාගෙන යාමටද කරුණු යෙදී ඇත.

ආයනයෙහි බලතල තුළ කෙතරම් ව්‍යාප්තියක් තිබුනද වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව යන කරුණු සම්බන්ධයෙන් අධිකාරියෙහි කටයුතු යම්තාක් සීමා වී ඇත.

අධිකාරිය සංස්ථාපනය වී ඇති ආකාරය, එහි ව්‍යුහය අධිකාරියෙහි අරමුදල පිහිටුවීම එහි ආදායම් හා වියදම් කළමනාකරණ විධිවිධාන පොදු කරුණු සහ ප්‍රඥප්තියෙහි සියළුම ක්ෂේත්‍රයන්හි නෛතික වශයෙන් දෝෂ පවතියි. එසේම මෙවැනි අධිකාරියක් ක්‍රියාත්මක වීමේදී, ආයතන තනිව කටයුතු කිරීමට සීමා නොවී, පෞද්ගලික ව්‍යවසායන් සමඟ බද්ධ වී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විධි විධාන සලසා ගනිමින්
ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදය යටතේ වන පරමාර්ථයන්ට හේතුවන පරිදි ක්‍රියාත්මක විය හැකි ය. නමුත් ඊට ප්‍රමාණවත් විධි විධාන බලතල ප්‍රඥප්තිය යටතට ඇතුළත් වී නැත.

විශේෂයෙන්ම මෙවැනි අධිකාරියක් වෙනුවෙන් සංයුතිය තීරණය කිරීමේදී විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය රැඳවීමට විධි විධාන සැලසීම වෙනුවට ආයතනික පරමාර්ථයන්ට අනුකූල වන පරිදි සංයුතිය තීරණය කිරීමට හැකිවන පරිදි නිර්ණායක ඇතුලත් වීමත් ආයතනික සාර්ථකත්වයට හේතු වනු ඇත.

## උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය තවදුරටත් සාර්ථකත්වයට ගෙන ඒම උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.

අ). උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීමට අදාළ 1990 අංක 15 දරණ සංශෝධිත ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 11 දරණ උතුරුමැද පළාතේ සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම සඳහා වූ ප්‍රඥප්තිය පරිවර්ජන්න කරමින්, ඒ සඳහා නව ප්‍රඥප්තියක් පැනවීම.

ආ). ඉහත ' අ' යටතේ නිර්දේශිත පරිදි නව ප්‍රඥප්තියක් පැනවීමේදී පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව ගිවිසුම් ක්‍රියාවලියක් යටතේ අධිකාරියට ක්‍රියාත්මක වීමට හා 100% ක කොටස් අයිතිය සමාගම් පිහිටුවීමට වැනි බලතල අධිකාරියට පිරිනැමෙන පරිද විධිවිධාන ඇතුලත් කිරීම.

ඇ). අධිකාරියෙහි අරමුදලට අයකරන මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට සහ පළාත් සභා අරමුදලට බැහැර කිරීමටද හැකි වන පරිද යෝජිත ප්‍රඥප්තියට විධිවිධාන ඇතුලත් කිරීම.

ඈ). අධිකාරිය සඳහා නිශ්චිත හා යෝග්‍ය සංයුතියක් පනවනු ලබන නව ප්‍රඥප්තියක් යටතේ ඇතුළත් කිරීම.

ඉ). පෞද්ගලික පාර්ශවයන් වෙත සේවා සැපයීම හා ඔවුන් හා ඒකාබද්ධව සේවාවන් සැපයීම ප්‍රඥප්තියෙහි දැනට ඇති විධිවිධාන වලට සාපේක්ෂව වඩා ශක්තිමත් විධි

විධාන යටතේ ඇතුලත් කිරීම.

ඊ). ඉදිකිරීම් ක්ෂේත්‍රයට ව්‍යාප්ත වීමෙදී නිර්මාණය, සැළසුම් කිරීම, ඉදි කිරීම මෙන්ම උපදේශක සේවා වෙනුවෙන්ද ක්‍රියාත්මක විය හැකි පරාසයකින්ම අවශ්‍ය විධි විධාන යෝජිත ප්‍රඥප්තියක් යටතේ ඇතුළත් කිරීම.

## දකුණු පළාත් සංවර්ධන අධිකාරිය.

දකුණු පළාත් සංවර්ධන අධිකාරය දකුණු පළාතෙහි 1995 අංක 1 දරණ දකුණු පළාත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කර ඇත.

### දකුණු පළාත් සංවර්ධන අධිකාරියෙහි කාර්යයභාරය.

දකුණු පළාත් සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත, කෘෂි කර්මාන්ත සහ සත්ත්ව පාලනය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම යන්න මෙම අධිකාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වී ඇත. ඒ යටතේ අදාළ ආයතනයෙහි කාර්යයභාරය පහත ආකාරයට දැක්විය හැක.

අ) දකුණු පළාත් තුළ සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්තවලට කෘෂිකර්මාන්තයට හා සත්ත්ව පාලනයට සහ ඒ ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම සඳහා අවස්ථා සලසා දීම.

ආ) දේශීය හා විදේශීය ආයෝජකයන් දකුණු පළාත තුළ ආයෝජනය සඳහා දිරිගැන්වීමෙන් හා ඵලදායී ව්‍යාපෘති හඳුන්වාදීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් එවැනි ආයෝජකයන්ට සහාය වීම.

ඇ) පෙළඹවීම් ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම්වලින් හෙබි හිතකර වාතාවරණයක් දකුණු පළාත තුළ ඇති කිරීම.

ඈ) දකුණු පළාත තුළ ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යයනීය කටයුතු කරගෙන යාම, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම, දැනුම හා තොරතුරු පතුරුවාලීම සහ වෙනත් වැඩසටහන් ඇතිකිරීමට සහ පර්යේෂණ සහ සහ සංවර්ධනාත්මක කටයුතු මෙහෙයවීම.

ඉ) දකුණු පළාත තුළ නිෂ්පාදන භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපළවල් ඇති කිරීම සහ දේශීය හා විදේශීය වෙළඳපොළ පහසුකම් සළසා දීමට අවශ්‍ය අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඊ) දකුණු පළාත් අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන දේශීය නිෂ්පාදකයින්ගෙන් ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියාකිරීම යන දේශීය හා විදේශීය අලෙවි අවශ්‍යතා ඇති අංශවල නිෂ්පාදකයින් දිරිගැන්වීම.

උ) දකුණු පළාතේ සුළු, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂි කර්මාන්තය සහ සත්ත්ව පාලනය යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයේ ශිල්ප ඥානය ඇති කරගැනීම, නවීකරණය පිළිබඳ උපදෙස් දීම හා මඟපෙන්වීම යන එවැනි ශිල්ප ඥාණය සංවර්ධනය කිරීමට හා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මූල්‍යාධාර ලබාදීම හා දකුණු පළාතේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත හා කෘෂි කර්මාන්ත සහ සත්ත්ව පාලන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වීම සහ ඒවා භාර ගැනීම.

ඌ) දකුණු පළාතේ ක්‍රියාත්මක සංවර්ධන හා කාර්යය සාධකතාව වැඩිදියුණු කිරීම යන කළමනාකරණය සහ නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබලය දීම.

එ) දකුණු පළාතේ ඉහත එක් එක් කර්මාන්ත අංශ උදෙසා නිශ්චිත කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාත්මක සැළසුම් සංවර්ධනය කිරීම.

<u>දකුණු පළාත් සංවර්ධන අධිකාරියෙහි සංවිධාන ව්‍යූහය.</u>

ආයතනික සංවිධාන ව්‍යුහය නිල සාමාජිකයින් හා පත් කළ සාමාජිකයින් පහළොස් දෙනෙකුගෙන් සමන්විතය. එය පහත ආකාරයට වෙයි.

**නිල සාමාජිකයින්,**

අ) දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම ලේකම්

ආ) දකුණු පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්

ඇ) දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම්)

ඈ) කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකාරවරයා

ඉ) අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්

ඊ) ගාල්ලේ වෙළඳ මණ්ඩලයේ සභාපති

උ) මාතර වෙළඳ මණ්ඩලයේ සභාපති

ඌ) හම්බන්තොට වෙළඳ මණ්ඩලයේ සභාපති

පත්කළ සාමාජිකයින් වශයෙන් මෙම අධිකාරියේ විෂයට අදාළ අංශයන්හි නිපුණතාවයන්හි හා ක්‍රියාශීලීව නියැලෙන තැනැත්තන් ලෙස අත්‍යාවශ්‍යයෙන් සලකන සාමාජිකයින් හත් දෙනෙකු අමාත්‍යවරයා පත්කරන අතර, ඉහත සාමාජිකයන් අතරින් එක් අයෙකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති වශයෙන් පත්කරනු ලබයි. එසේ පත්වන සභාපතිවරයා අධිකාරියෙහි සභාපතිවරයා වශයෙන් සැළකේ.

<u>දකුණු පළාත් සංවර්ධන අධිකාරයෙහි බලතල.</u>

(අ) අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපලක් අවශ්‍ය වුවහොත් වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට යටත්ව ඒ දේපල අත්කර ගැනීම.

(ආ) සුළු, මධ්‍යම හා මහ පරිමාණ කර්මාන්ත හා කෘෂි කර්මාන්තය සහ සත්ත්ව පාලනය දිරි ගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම.

(ඇ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා, වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට යටත්ව, දේශීය හා විදේශී වශයෙන් ගිවිසුම්වලට හෝ සහයෝගීතා ගිවිසුම්වලට හෝ ඇතුළත්වීම.

(ඈ) සුළු, මධ්‍යම හා මහ පරිමාණ කර්මාන්ත හා කෘෂි කර්මාන්තය සහ සත්ත්ව පාලනය යන අංශ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය වීම, සම්බන්ධීකරණය කිරීම හා අනුබල දීම.

(ඉ) ඉහත දැක්වෙන මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍යවන පුහුණු වැඩසටහන්, ව්‍යාපෘති, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය සංවිධානය කිරීම හා මෙහෙයවීම.

(ඊ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීම, තබාගැනීම, බද්දට, උගසට හෝ කුලියට ගැනීම හෝ දීම, ඇපයට තැබීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(උ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, උපකරණ, අමුද්‍රව්‍ය හෝ වෙනත් දේශීය වශයෙන් මිලට ගැනීම හෝ ආනයනය කිරීම.

(ඌ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වියදම් ගෙවීම.

(එ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ දේශීය, විදේශීය හා අන්තර් ජාතික ආයතන මඟින් සපයනු ලබන මූල්‍ය ආධාර, ද්‍රව්‍යමය ආධාර, උපදේශක සේවා හෝ වෙනත් යම් ආධාරකයක ආධාර ලබා ගැනීම.

(ඒ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයතන හෝ පුද්ගලයන් සමඟ ඒකාබද්ධ හවුල් ව්‍යාපාර, ඒකාබද්ධ ව්‍යාපෘති ආදිය සැළසුම් කිරීම, පිහිටුවීම සහ පවත්වාගෙන යාම.

(ඔ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කර ගැනීම සහ අවශ්‍ය වූවහොත් බැංකු, මූල්‍ය ආයතන හෝ වෙනත් පෞද්ගලික ආයතන වලින් ණය මුදල්, අයිරා පහසුකම් ආදිය ලබා ගැනීම.

(ඕ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ව්‍යාපාර ආරම්භ කිරීම හා අධිකාරියේ මෙහෙයවීම යටතේ ආරම්භ කෙරෙන රැකියා උත්පාදන ව්‍යාපෘති, ස්වයං රැකියා ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීම් ප්‍රාග්ධනය සඳහා දායකවීම, උපකරණ හා වෙනත් පහසුකම් ලබාදීම හා එබඳු මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී ඇපකරුවන් ලෙස කටයුතු කිරීම.

(ක) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යම් ගොඩනැඟිලි ඉදිකිරීම, මිලට ගැනීම හෝ අළුත්වැඩියා කිරීම හෝ පවත්වාගෙන යාම සහ යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, රැස්කිරීම සහ අලෙවි කිරීම.

(ග) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යැයි අධිකාරිය සලකන විවිධ වෘත්තිමය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන යම් සංඛ්‍යාවක් අධිකාරිය විසින් ස්ථාපනය කර, පවත්වාගෙන යාම.

(ච) අධිකාරිය විසින් සපයනු ලබන, සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම.

(ජ) අධිකාරිය ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම.

(ට) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කරන නිලධාරීන්, සේවා නියුක්තයන් සහ සේවකයන් පත් කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම, ඔවුන් පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුනට පරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ නිවාඩු.

(ඩ) අධිකාරියේ, නිලධාරයන් සේවා නියුක්තයන් හා සෙසු සේවකයන් සඳහා සේවක අර්ථසාධක යෝජනා ක්‍රම ඇති කිරීම.

<u>දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ලබා ඇති සාර්ථකත්වය.</u>

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මේ වන විට යම් සාර්ථකත්වයන් යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. විශේෂයෙන්ම ප්‍රඥප්තියෙහි 4(ඇ) උප වගන්තියෙහි සඳහන් විධිවිධානයන්ට එනම් විශේෂයෙන්ම ස්වයං රැකියා වැඩසටහන් සහ දිළිඳු ජනයාට සේවය සැලසෙන වැනි පුහුණු වැඩසටහන් පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට යොමු වෙමින් ක්‍රියාත්මක වීමක් සිදු වේ. ආයතනික ඉපැයීම් ආයතනයෙහි පවත්වාගෙන යාම පිණිස වන අතරම, පළාත් සභාවේ වාර්ෂික අයවැය ලේඛණය යටතේ වෙන් වන මූල්‍ය ප්‍රතිපාදන ද ආයතනයෙහි පරමාර්ථ සඳහා යෙදවේ. ආයතනයට ස්වාධීන අරමුදලක් නොවන අතර පළාත් සභා අරමුදලට අදාල මුදල් රැස්කර ආයතනික ගිණුමට හර කිරීම වෙනුවෙන් විධි විධාන සලසා ඇත.

එහෙත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම වස්ථාවේ 9 වැනි උපලේඛණයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදයෙහි පරමාර්ථයන්ට ඒ ආකාරයෙන්ම ලඟා වී ඇතැයි යන්න සැලකිය නොහැක. ඊට ප්‍රඥප්තිය යටතේ වන පහත සඳහන් අඩු පාඩු ද හේතු වශයෙන් සැලකිය හැක.

ඇ) මෙවැනි වූ ආයතනයක් නෛතික පුද්ගලභාවයක් සහිතව ගොඩනැගීමේ මූලික පරමාර්ථය ස්වාධීන ආයතනයක් වශයෙන් තමන්ම ස්වාධීන අරමුදලක් පවත්වාගෙන යමින් රාජ්‍ය දෙපාර්තමේන්තු ව්‍යුහයට වඩා නිදහසක් සහිතව පරමාර්ථ කරා ළඟා වීමයි. එහෙත් ඒ වෙනුවෙන් විශේෂිත වන අරමුදලක් මෙම ආයතනයට පවත්වාගෙන යාමට ප්‍රඥප්තිය යටතේ විධි විධාන නොමැත.

ආ) ආයතනයෙහි ආදායම් උත්පාදනය සඳහා විස්තර වන බලතලවලට සාපේක්ෂව සේවා සඳහා ව්‍යාප්ත විය හැති බලතල පරාසය පුළුල් වීම.

ඇ) ආයතනික ව්‍යුහය ප්‍රායෝගිකව පහසු ක්‍රියාකාරීත්වයට උචිත නොවීම හා අධිකාරියෙහි සභාපතිවරයෙකු පත්වීමට අදාළ විධිවිධාන නීත්‍යානුකූලව සකස් වී නොතිබීම.

<u>තුවදුරටත් සාර්ථකත්වය සඳහා සැලකිය කරුණු සම්බන්ධයෙන් කරුණු පිළිබඳ යෝජනා සහ නිර්දේශ.</u>

අ) දකුණු පළාතේ සංවර්ධන අධිකාරිය ව්‍යවස්ථාව යටතේ සිය ප්‍රවේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 9 වන උපලේඛණයෙහි පළාත් යන ලැයිස්තුව 21 ඡේදය යටතේ ලබා ගැනීමෙන් පසු එහි මූලාා පරමාර්ථය ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් යන ස්වභාවයට පත්විය යුතුය. එසේ වුව ද ආදායම්

උත්පාදනයට සාපේක්ෂව වියදම් සඳහා හේතු වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමක් ප්‍රායෝගික වශයෙන් සිදුවන තත්ත්වය යටතේ ඒ වෙනුවෙන් ආයතන බලතල තුළ තවදුරටත් ක්‍රියාකාරීව ව්‍යාප්ත වීමේ අවශ්‍යතාවය පවතී.

ආ) ඉහත "අ" හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ද ඊට පරිබාහිරව වුව ද මෙවැනි ආයතනයක ක්‍රියාත්මක වීම උදෙසා ඒ වෙනුවෙන් මහපෙන්විය හැකි උපදේශක සභාව ක් සිටීම වැදගත් වෙයි. එහෙත් එවැනි තත්ත්වයකට ප්‍රඥප්තිය තුළ විධිවිධාන සැලසී නොමැති තත්ත්වය සැලකිය යුතු කරුණකි.

ඇ) ආයතනයෙහි අරමුදල ස්වාධීන නොවීමෙන් පළාත් සභාවේ අය-වැය ලේඛනය යටතේ පාලනය වන ආයතනයක් වීමෙන් ආයතනයෙහි ස්වාධීන ක්‍රියාකාරීත්වයට සීමාවන් පවතියි. එමගින් පළාත් සභා අරමුදලට ආයතනික දායකත්වය විසඳා ගැනීමට වුව ද ගැටලුවක්ව පවතියි. එබැවින් ඒ සඳහා ස්වාධීන අරමුදලක් පවත්වාගෙන යාම සඳහා කරුණු සැලකිම වැදගත් වෙයි.

ඇ) අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක 1995 අංක 1 දරණ දකුණු පළාත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පවතින බැවින් ඒ සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය නිර්දේශ කෙරේ.

## <u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය.</u>

දකුණු පළාතේ කාර්මික ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ප්‍රධාන පරමාර්ථය වශයෙන් සළකා පිහිටුවන ලද අධිකාරියකි. දකුණු පළාතේ 2002 අංක 21 දරණ දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කර ඇත.

### <u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියෙහි කාර්යයභාරය.</u>

(අ) දකුණු පළාතේ කර්මාන්ත පිහිටුවීම හා සංවර්ධනය දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(ආ) කාර්මික ව්‍යාපෘති පිහිටුවීමේ කාර්යය සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් දකුණු පළාතට ආකර්ෂණය කර ගැනීම සහ අවශ්‍ය උපදෙස් දීමෙන් ඒ ආයෝජකයන්ට සහාය වීම.

(ඇ) මූලික පහසුකම් සුලභව ලබාගත හැකි ස්ථාවර ආර්ථිකයක් හා ආයෝජනය සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම.

(ඇ) අභ්‍යාස වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, වැඩසටහන්, සම්මේලන, අධ්‍යාපනික චාරිකා සහ කාර්මික පර්යේෂණ පැවැත්වීම මඟින් ව්‍යාපාරික නිපුණතා වැඩිදියුණු කිරීමට අදාළ අභ්‍යාස සහ අධ්‍යාපනික කටයුතු භාර ගැනීම.

(ඉ) කාර්මික සංවර්ධනයට අදාළ තොරතුරු හා දැනුම පතළ කිරීම.

(ඊ) පළාතේ කර්මාන්තකරුවන් අතර සුහඳ සබඳතා ඇති කිරීමෙහිලා ඔවුන් දිරිමත් කිරීම සහ සියලු කාර්මික ව්‍යාපාර නියමාකාරයෙන් සම්බන්ධීකරණය කිරීම හා ඒවායේ වර්ධනය අන්තර් සබඳතා ගොඩනැගීම මඟින් ප්‍රවර්ධනය කිරීම.

(උ) පළාත ඇතුළත නිෂ්පාදන සඳහා වෙළෙඳපොලවල් ඇති කිරීම සහ පළාතෙන් පිටත වෙළෙඳපොලවල් හඳුනාගැනීම.

(ඌ) අලෙවියට අදාළ ආධාර ලබාගැනීමට අදහස් කරන කර්මාන්තකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

(එ) කර්මාන්ත නවීකරණය සඳහා අවශ්‍ය කාර්මික දැනුම ලබාගැනීම පහසු කිරීම හා කාර්මික නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා මූලාධාර දීම.

(ඒ) කළමනාකරණය, නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ නවීන ක්‍රම ඇති කිරීමෙහිලා ධෛර්යමත් කිරීම සහ කාර්ය ඵලය පිළිබඳ තත්ත්ව වර්ධනය හා දියුණුව ප්‍රවර්ධනය කිරීම, සහ

(ඔ) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අධිකාරියේ පරමාර්ථවලට අදාළ වෙනත් සංවර්ධන කටයුතු භාර ගැනීම.

<u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය.</u>

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය පහත සඳහන් නිල සාමාජිකයන්ගෙන් හා පත් කළ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් අධ්‍යක්ෂක මණ්ඩලයකින් සමන්විතය.

නිල සාමාජිකයින් ;

අ) දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

ආ) දකුණු පළාත් සභාවේ කර්මාන්ත නියෝජ්‍ය ලේකම්

ඇ) දකුණු පළාත් සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්

ඈ) දකුණු පළාත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ කළමනාකරු

ඉ) දකුණු පළාත් හස්ත කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ

ඊ) 1979 අංක 40 දරණ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආනයන සංවර්ධන මණ්ඩලය විසින් නම් කරන ලද ඒ මණ්ඩලයේ නියෝජිතයෙක්

උ) 1982 අංක 35 දරණ පනත යටතේ පිහිටුවන ලද ජාතික ශිල්ප සභාව විසින් නම් කරනු ලැබූ ඒ සභාවේ නියෝජිතයෙක්

ඌ) 1996 අංක 18 දරණ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලැබූ ඒ අධිකාරියේ නියෝජිතයෙක්

<u>පත් කළ සාමාජිකයින්,</u>

අ) දකුණු පළාතේ බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයක් ලැබූ තැනැත්තෙක්

ආ) දකුණු පළාතේ පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවෙක්

ඇ) කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍රයේ ඔප්පු කළ හැකි පළපුරුද්දක් ඇති සාමාජිකයන් දෙදෙනෙක්

ඈ) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ඔප්පු කළ හැකි පළපුරුද්දක් ඇති නැතැත්තෙක්

සමස්ත අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 13ක් වන අතර, ඒ අතරින් එක් අයෙකු සභාපති වශයෙන් පත්කරනු ලබයි.

<u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරී බලතල.</u>

අ). යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, ඇරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාමනය කිරීම.

ආ). අධිකාරිය වෙත පවරන ලද හෝ අධිකාරිය විසින් අත්කර ගන්නා ලද යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම.

ඇ). යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘතකර පවත්වාගෙන යාම.

ඈ). මේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර, පෙළඹවීම් සහිත නිෂ්පාදන දිරි ගැන්වීම.

ඉ). මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු හවුල් ගිවිසුම්, කොන්ත්‍රාත්තු හෝ සාමූහික ගිවිසුම්වලට කෙලින්ම හෝ ඒ සඳහා බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයෙකු මඟින් ඇතුළත් වීමේ හා ඒ කටයුතු ඉටු කිරීම.

ඊ). සෑම කාර්මික සංවර්ධන ක්ෂේත්‍රයකම පර්යේෂණ පවත්වාගෙන යාම හා ඒ කටයුතුවලට සහාය වීම සහ ඒ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

උ). අධිකාරිය විසින් ඉටු කරන ලද සේවාවන් සහ අධිකාරිය විසින් කුලියට දෙන ලද හෝ බදු දෙන ලද ගොඩනැගිලි, පරිශ්‍ර හෝ උපකරණ සම්බන්ධයෙන් ගාස්තු හා කුලී අයකර ගැනීම.

ඌ). අධිකාරිය වෙත සපයන ලද සේවාවන් හෝ අධිකාරිය වෙත කුලියට හෝ බද්දට දෙන ලද ගොඩනැගිලි, පරිශ්‍ර හෝ උපකරණ සම්බන්ධයෙන් ගාස්තු හෝ කුලී ගෙවීම.

එ). කාර්ය මණ්ඩලය පත් කිරීම, පුහුණු කිරීම, ඔවුන්ට වේතන හා වැටුප් ගෙවීම, නිවාඩු දීම සහ කාර්ය මණ්ඩලයේ සේවා අවසන් කිරීම ඇතුළු ඔවුන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම.

ඒ). කාර්ය මණ්ඩලය වෙත රාජකාරී ලැයිස්තුවක් සැපයීම, ඔවුන්ගේ වැඩ කටයුතු ඇගයීම හා ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

ඔ). අධිකාරියේ නිලධරයන්, සේවකයන් හා වෙනත් සේවා නියුක්තයන්ගේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රම හා වෙනත් යම් සුභසාධක යෝජනා ක්‍රමයක් පිහිටුවීම.

ඕ). අධිකාරියේ අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, උපකරණ හා වාහන ආනයනය කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ලබාගැනීම.

ක). අධිකාරයේ අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වියදම් ගෙවීම.

ග). ප්‍රාදේශීය ප්‍රභවයන්ගෙන් සහ ලංකාණ්ඩුව හරහා විදේශීය සහ ජාත්‍යන්තර ප්‍රභවයන්ගෙන් චංචල හා නිශ්චල දෙවර්ගයේම දේපල ප්‍රදාන, පරිත්‍යාග, රික්තවර්ණ, ද්‍රව්‍යාධාර, උපදේශාත්මක සේවා සහ මූල්‍යාධාර සහ වෙනත් යම් වර්ගයේ ආධාර පිළිගැනීම සහ ලබාගැනීම.

ජ). මේ ප්‍රඥප්තියේ වෙනත් විධි විධානවලට යටත්ව, අධිකාරියේ අභිප්‍රායයන් මුදුන් පමුණුවා ගත හැකි වන පරිදි, දේශීය හෝ විදේශීය හෝ සංවිධාන හෝ කාර්ය මණ්ඩලය සමඟ ඒකාබද්ධ ව්‍යවසාය හෝ හවුල් ව්‍යාපෘතිවලට ඇතුළත් වී, ඒවා ක්‍රියාත්මක කිරීම.

ට). අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණ, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බැංකු, මූල්‍ය සංවිධාන හෝ වෙනත් යම් ආණ්ඩුවේ හෝ පෞද්ගලික සංවිධානවලින් ණය හෝ අයිරා මාර්ගයෙන් ණයට ගැනීම.

ඩ). අධිකාරියේ මග පෙන්වීම යටතේ විවිධ කර්මාන්ත හා රැකියා උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමේ කාර්යය සඳහා ණය පහසුකම් සැපයීම, ප්‍රාග්ධන ආයෝජනවලට දායකවීම, පහසුකම් සහ වෙනත් ආම්පන්න ප්‍රදානය කිරීම.

<u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය දැනට ලබා ඇති සාර්ථකත්වය.</u>

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියෙහි අරමුණු හා සැසඳීමේදී ඊට අදාළව ආයතනය යම් සාර්ථකත්වයක් ලබා ඇත. එහෙත් ආයතනයෙහි ක්‍රියාත්මක ස්වරූපය ප්‍රඥප්තිය සම්පාදනයෙහිලා අදාළ වන ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාවේ අරමුණු තුළට ළඟා වී ඇතැයි යන කරුණ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැක. මන්ද දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය වර්තමාන ක්‍රියාත්මක තත්ත්වය සැලකීමේදී මුදල් ඉපයීමට සාපේක්ෂව සේවාවන් සඳහා වන ව්‍යාපෘතිය පුළුල් ය. එසේම දැනට ආයතනය විසින් පවත්වාගෙන යන විවිධ වැඩසටහන් යටතේ රියදුරු පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයක් තුළින් සමාජ ප්‍රතිලාභ උදාකළ හැකි වුවත්, එයම පමණක් ඉහත කී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම වස්ථාවේ 9 වැනි උපලේඛනයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ඡේදය පරමාර්ථය ඉෂ්ඨ වීමක් වශයෙන් සැලකිය හැකි නොවේ.

එසේම ආයතනික අරමුදල සංස්ථාපනයේදී ව්‍යවස්ථාවේ පරමාර්ථ සලකා අරමුදලෙහි වියදම් විස්තර වී නොමැත. දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක වීමෙන් කොපමණ ආදායම් ඉපැයුවේද, එම අදායම හෝ ඉන් කොටසක් දකුණු පළාත් සභා අරමුදලට මාරු කිරීම සඳහා කිසිඳු විධි විධානයක් ප්‍රඥප්තියට ඇතුළත් වී නොමැත.

එසේම, ප්‍රඥප්තිය යටතේ සඳහන් ආකාරයට ආයතනික සංයුක්තිය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විතය. මෙය ප්‍රායෝගිකව උචිත ද යන්න සැළකිය යුතු කරුණකි.

<u>දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය තවදුරටත් සාර්ථකත්වය උදෙසා කරනු ලබන යෝජනා හා නිර්දේශ.</u>

අ) ආයතනයෙහි බලතල තුළ හැකිතාක් ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි යොමු වීම.

ආ) අධිකාරිය විසින් 100% ක කොටස් අයිතියක් ඇති සමාගම් පිහිටුවීම වැනි ක්ෂේත්‍ර යටතේ ව්‍යාප්ත වෙමින් උපරිම මූල්‍ය වාසි ලඟා කර ගත හැකි ආයෝජන ස්වභාවයන් හඳුනාගැනීම, ක්‍රියාත්මක වීම.

ඇ) ඉහත "ඇ" නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි අවශ්‍ය සංශෝධන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

ඈ) අධිකාරියේ අරමුදලෙහි වියදම් ස්වරූපයන් විස්තර කරමින් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම.

ඉ) ආයතනයක සාමාජිකයන් දහතුන් දෙනෙකුගෙන් සමන්විත වීම වෙනුවට, වඩාත් ප්‍රායෝගික වූත්, සීමිත වූත් අවශ්‍යම සාමාජික සංඛ්‍යාවකින් සංයුතිය සකස්කරගැනීම සහ අවශ්‍ය නම් උපදේශක සභාවක් පවත්වාගෙන යාම වැනි කරුණු සඳහා ප්‍රඥප්තිය යටතේ සංශෝධනයක් සිදු කිරීම, හෝ එම ප්‍රඥප්තිය පරිච්ඡින්න කර නව ප්‍රඥප්තියක් පැනවීම.

## ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය.

ඌව පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පුළුල් බලතල සහිත ආයතනයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මත ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ සංස්ථාපනය කර ඇත. ඌව පළාතේ 2011 අංක 11 දරණ ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය යටතේ මෙම ආයතනය සංස්ථාපනය වී ඇත.

## ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශයෙහි කාර්යයභාරය.

(අ) ඌව පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට දායක වීම.

(ආ) පළාතේ විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මානව, භෞතික, සම්පත් හා උපදේශාත්මක සේවාවක් ලබාගැනීම.

(ඇ) පළාත තුළ හා ඉන් බැහැරට ක්‍රියාත්මක වෙමින් පළාත් සභාව වෙත ආදායම් උපයාදීම.

(ඈ) පළාත් තුළ රැකියා ජනිත කිරීමට දායක කර ගැනීම

(ඉ) පළාත තුළ ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය මානව හා භෞතික හා තාක්ෂණික දැනුම ලබාදෙන සංචිතයක් ලෙස ක්‍රියාකිරීම.

## ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යයෙහි සංවිධාන ව්‍යුහය.

ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශයට හත් දෙනෙකුගෙන් යුත් පාලක සභාවකින් පාලනය වෙයි. එහි සාමාජිකත්වය පහත පරිදි වෙයි.

අ) පරිපාලනය, ගණකාධිකරණය, ඉංජිනේරු විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් පිළිබඳ පළපුරුද්ද හා නිපුණතාවයන් දක්වා ඇතැයි ඌව පළාත් මෙම කාර්යාංශය අයත් අමාත්‍යාංශයේ අමාත්‍යවරයා සෑහීමකට පත් වන තුන්දෙනෙක්

ආ) ගොඩනැඟිලි ඉදිකිරීම්, මාර්ග, වාරිමාර්ග හා මූල්‍ය යන ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හතර දෙනෙක්

එසේම ඉහතින් සඳහන් කළ "අ" කාණ්ඩය යටතේ පත්වන සාමාජිකයන්ගෙන් එක් අයෙක් අමාත්‍යවරයා විසින් අදාළ පාලක සභාවේ සභාපතිවරයා වශයෙන් පතකරනු ලැබිය යුතුය.

තවද, කාර්යාංශය සඳහා සාමාන්‍යාධිකාරීවරයෙකු සිටිය යුතු අතර, ඔහු ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව පත්කරනු ලබන්නෙකි. ඔහු කාර්යාංශයෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේය.

<u>ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශයෙහි බලතල.</u>

අ) ඌව පළාත තුළ හෝ ඉන් බැහැර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන සිවිල් හෝ යාන්ත්‍රික හෝ විදුලි හෝ විද්‍යුත් හෝ ඕනෑම ආකාරයක ඉංජිනේරුමය ස්වභාවයක් ගන්නා සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් සැළසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම, ප්‍රගති පාලනය කිරීම, අධීක්ෂණය කිරීම, ඒ සඳහා අවශ්‍ය උපදෙස් දීම සහ එවැනි ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍යකරන වාර්තා සකස් කිරීම හා අවශ්‍ය පරිදි එම වාර්තා ඉදිරිපත් කිරීම.

ආ) යම් ලිඛිත නීතියක සඳහන් කොන්දේසිවලට යටත්ව ඉහත (අ) උප වගන්තියේ සඳහන් සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ඌව පළාත තුළ හෝ ඉන් බැහැර යම් තැනැත්තෙකු සමඟ අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කෙළින්ම හෝ හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් හෝ ඇතුළත් වීම, ඒවා ඉටුකරවා ගැනීම හා කරගෙන යාම.

ඇ) ඉහත (අ) උප වගන්තියේ සඳහන් යම් සංවර්ධන ව්‍යාපෘතියක්, වැඩසටහනක්, කර්න්තයක් හෝ කාර්යයන් නිම කිරීමට අපොහොසත් වන හෝ පැහැර හරින තැනැත්තෙකු හෝ තැනැත්තන් පිළිබඳව නීතිමය කටයුතු කිරීම හා එකී ව්‍යාපෘතිය, වැඩසටහන කර්මාන්තය හෝ කාර්යය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ඈ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සැළසුම් හා මූලධන ආයෝජන සැළසුම් ක්‍රියාත්මක කිරීම.

ඉ) ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ හෝ වෙනත් පළාත් සභාවක හෝ වෙනත් පළාත් සභාවකට අයත් ආයතනයක හෝ රජයට අනුබද්ධ ආයතනයක හෝ ඉල්ලීම අනුව ඒ ආයතනය වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන්, සැළසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ක්‍රියාත්මත කිරීම, සම්බන්ධීකරණය කිරීම හෝ උපදෙස් දීම හෝ අන්‍ය ආකාරයකින් ඊට සහාය ලබාදීම.

ඊ) මෙම කාර්යාංශය වෙනුවෙන් සපයනු ලබන කවර හෝ සේවාවක් සඳහා ගාස්තු අයකිරීම.

උ) මුදලින් හෝ ද්‍රව්‍යමය ස්වරූපයෙන් හෝ උපකරණ ලෙස හෝ ප්‍රධාන, ආධාර පරිත්‍යාග භාර ගැනීම හා කාර්යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඒවා උපයෝගී කර ගැනීම.

ඌ) යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලට ගැනීම හෝ එසේ මිලට ගත් දේපලක් බැහැර කිරීම.

ඔ) කාර්යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍යවන්නා වූ මානව හෝ භෞතික සම්පත් මිලට හෝ කුලී පදනම මත හෝ බද්දට හෝ වෙනත් ආකාරයකින් ගාස්තුවක් ගෙවීමේ පදනමක් මත සපයා ගැනීම.

ඕ) මේ ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් තම වගකීම් ඉටු කිරීම සඳහා කාර්යාංශයට අවශ්‍යවන මුදල්, අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය ඇතිව අමාත්‍යවරයා විසින් ලබාදෙන නියමයන්ට අනුකූලව අයිරාවක් මඟින් හෝ අන්‍ය ආකාරයකින් හෝ රාජ්‍ය බැංකුවකින් හෝ රජයට අනුබද්ධිත මූල්‍ය ආයතනයකින් ගැනීම.

එ) රාජයට හෝ රාජ්‍ය අනුබද්ධිත ආයතනයට හෝ පළාත් සභාවකට හෝ වෙනත් පළාත් සභාවකට අයත් ඉඩම්වල භුක්තිය භාර ගැනීම හා එම ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.

ඒ) කාර්යාංශය විසින් ස්වකීය බලතල කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි, ඉටු කිරීමෙහි හා කිරීමෙහිලා යම් සංවර්ධන ව්‍යාපෘති, කර්මාන්ත, වැඩසටහන් හෝ කාර්යයන් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට යෝජිත වැඩකටයුතුවලට ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ හෝ වෙනත් පළාත් සභාවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ මණ්ඩලයක අයිතිවාසිකම්, සම්බන්ධතා හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑම් ඇතිවේද අවස්ථාවෝචිත පරිදි ඒ අදාළ ආයතනය විමසා ඒවා සකස් කිරීම හෝ ක්‍රියාත්මක් කිරීම.

**<u>ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය දැනට ලබා ඇති සාර්ථකත්වය.</u>**

ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශය යටතේ ප්‍රධාන වැඩබිම් දෙකක් පවත්වාගෙන යන අතර, එහි ප්‍රධාන වැඩබිම දියතලාව කහගොල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබයි. කාර්යාංශයෙහි මේ වන විට ප්‍රධාන කාර්යය වී ඇත්තේ කාර්යාංශය සතු යන්ත්‍රෝපකරණ, වාහන කුලී පදනම මත බැහැර පාර්ශවයන්ට ලබාදෙමින් අදායම් උත්පාදනය කරයි. ඊට අමතරව වාහන නඩත්තු කාර්යයන් පවත්වාගෙන යාමේදී ඌව පළාත් සභාව සතු කාර්යාංශය විසින් නඩත්තුව හේතුවෙන් පළාත් සභා අරමුදලට පහසුවක් වී ඇත. එසේම ඌව පළාත් වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන නඩත්තු හා සේවා කටයුතු ද කාර්යාංශය විසින් සිදුකරනු ලබයි.

කෙසේවෙතත්, අදාළ ප්‍රඥප්තිය යටතේ අරමුණු හා බලතල සමඟ සැසඳීමේදී, වර්තමාන ක්‍රියාවලිය ඊට ආසන්න වී නොමැත. එසේම මෙවැනි කාර්යාංශයක් සංස්ථාපනයේදී පෞද්ගලික පාර්ශවයන් සමඟ ඒකාබද්ධ ව්‍යවස්ථාවන්ට යොමුවීමට විධිවිධාන සලසා ගැනීම, වැනි කරුණු ප්‍රඥප්තියෙහි බලතල යටතේ සළකා නොමැත. එසේම ඇතුළත්ව ඇති යම් බලතල සම්බන්ධයෙන් වන හරය කුමක්ද යන්න ද අපැහැදිලිය.

ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය, ප්‍රඥප්තියෙහි බලපැවැත්වීම උදෙසා ප්‍රධාන කරුණක් වූවත්, ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශ ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය, කාර්යාංශයෙහි වර්තමාන ක්‍රියාත්මක තත්ත්වයට අනුරූපී වී නොමැත.

එසේම, කාර්යාංශයෙහි අරමුදලට රැස්කළ යුතු ආදායම සහ කළහැකි වියදම් පිළිබඳ සංශෝධනයන් සිදුකිරීම් අවශ්‍යතාවය පවතී. කාර්යාංශයෙහි ආදායම් ඵලදායී ආයෝජන ස්වභාවයෙන් යෙදවීමට හැකිවන පරිදි විධිවිධාන සැළසී නොමැති අතරම, පළාත් සභා අරමුදලට උපයන ලද ආදායමෙන් කොටසක් බැහැර කිරීමට හැකිවන පරිදි විධිවිධාන සැළසී නොමැත.

## ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය පිළිබඳ තවදුරටත් සාර්ථකත්වය සඳහා යෝජනා හා නිර්දේශ.

අ) ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශය සඳහා ප්‍රඥප්තිය යටතේ දැනටමත් ලැබී ඇති බලතල ප්‍රඥප්තියෙහි අරමුණු උදෙසා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැළැස්මක් යටතේ කටයුතු කිරීමට උපදෙස් දීම හා අවශ්‍ය මඟ පෙන්වීම හා උපදේශනය ලබාදීම.

ආ) ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමයෙහි සඳහන් පරමාර්ථයට ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශය සඳහා පුළුල් බලතල සහිත ආයතනයක් බිහි කිරීම යන්නයි. එහෙත් ප්‍රඥප්තියෙහි මූඛ්‍ය අභිලාශය එමගින් ප්‍රකාශ වී යැයි සැළකිය නොහැක. එසේම බලතල විස්තර කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලැයිස්තුවෙහි 21 වන ඡේදයෙහි අභිලාශයන්ට විස්තර වී ඇති බලතල ප්‍රමාණවත් යැයි සැළකිය නොහැක. එසේම, කාර්යාංශයෙහි අරමුදල සම්බන්ධයෙන් ද ආදායම් වියදම් පිළිබඳ දැනට පවත්නා විධිවිධාන වලට සාපේක්ෂව වැඩිමනත් සාර්ථක විධිවිධාන ඇතුළත්වීමේ අවශ්‍යතාවය පවතියි. එබැවින්, ඊට අදාළ වගන්ති සංශෝධනය විය යුතු වේ.

එබැවින්, මෙම සියළුම කරුණු ආවරණය වීම පිණිස දැනට බලපැවැත්වෙන ඌව පළාත් 2011 අංක 11 දරණ ඉදිකිරීම් හා ඉංජිනේරු උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය සංශෝධනය කිරීමේ හෝ එය පරිච්ඡින්න කර නව ප්‍රඥප්තියක් සැදීමේ අවශ්‍යතාවය පවතී.

## ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන.

ඌව පළාතට ආවේනික වූ විභවතාවයන් හා නවීන තාක්ෂණය යොදා ගනිමින් අභියෝග ජයගත හැකි වන පරිදි ව්‍යවසායකයන්ට ක්‍රියාකාරීත්වය හා ආදායම් පුළුල් ලෙස බෙදී යන නිෂ්පාදන හා සේවා ව්‍යාපාර ප්‍රවර්ධනය මඟින් රැකියා නිර්මිත වෙළඳපොළක් ජනිත කරමින් ඌව පළාතේ හා රටේ ආර්ථික සංවර්ධනයට දායක වීමේ අරමුණ ඇතිව පවත්වාගෙන යාම සඳහා පිහිටුවන ලද ආයතනයකි. ඌව පළාතේ 2017 අංක 2 දරණ ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ප්‍රඥප්තිය යටතේ ආයතනය සංස්ථාපනය කර ඇත.

## ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහනෙහි ආයතනික කාර්යයභාරය.

ඌව පළාතට ආවේනික වූ විභවතාවයන් හා නවීන තාක්ෂණය යොදා ගනිමින් අභියෝග ජයගත හැකි වන පරිදි ව්‍යවසායකන්ට ක්‍රියාකාරීත්වය හා ආදායම් පුළුල් ලෙස බෙදී යන ව්‍යාපාර ප්‍රවර්ධන මඟින් ආර්ථික සංවර්ධනයට දායක වීම අධිකාරියෙහි ප්‍රධාන කාර්යය වෙයි. ඊට අතිරේකව පහත සඳහන් අරමුණු ද ඇත්තේය.

අ) ඌව පළාතේ ව්‍යාපාර ප්‍රවර්ධනය තුළින් දළ ජාතික නිශ්පාදිතය සඳහා පළාතේ දායකත්වය ඉහළ වටිනාකමකට ගෙන ඒම.

ආ) ඌව පළාතේ නිශ්පාදන සඳහා පවතින දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.

ඇ) ඌව පළාතේ ව්‍යවසායකයන්ට අවශ්‍ය තාක්ෂණික උපදේශන හා අනෙකුත් ආනුශාංගික සේවාවන් ලබා දීම.

ඈ) ආර්ථික සංවර්ධනයට ඉහළ සක්‍රීය දායකත්වයක් ලබා දෙන ඌව පළාතේ ව්‍යවසායකයින්ට නව ව්‍යවසාය සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම.

ඉ) පළාතේ පවතින විභවතාවයන් පරිසර හිතකාමී අයුරින් නිශ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම.

## ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහනෙහි සංයුතිය.

ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ආයතනයෙහි සංයුතිය භාරකාර මණ්ඩලයකින් සමන්විත වෙයි. එම භාරකාර මණ්ඩලය ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන අතර එහි පහත අයවලුන්ගෙන් සමන්විත වෙයි.

අ) ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය

ආ) ඌව පළාත් සභාවේ අමාත්‍යවරුන්

ඇ) ඌව පළාත් සභාවේ සභාපති

ඈ) ඌව පළාත් සභාවේ විපක්ෂ නායක

ඉ) ඌව පළාත් සභාවේ එකඟතාවයෙන් පත්කරන විපක්ෂ මන්ත්‍රීවරු දෙදෙනෙකු

ඊ) ඌව පළාතේ ප්‍රධාන ලේකම්

ට) ඌව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්

එසේම භාරකාර මණ්ඩලයෙහි සභාපති ඌව ප්‍රධාන අමාත්‍යවරයා වන අතර, ඌව ප්‍රධාන ලේකම් එහි ලේකම්වරයා වෙයි.

## ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහනෙහි බලතල.

අ. පළාත තුළ රැකියා විරහිත තරුණ තරුණියන් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීම.

ආ. විභවතාවයන් පවතින ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, ඒවා හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

ඇ. ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන්, තාක්ෂණික දැනුම හා පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

ඈ. සමීක්ෂණ, අධ්‍යයන සහ වැඩමුළු පැවැත්වීම යනාදී සංවර්ධන කටයුතු කිරීම.

ඉ. රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන යන අංශයන් හි සහභාගීත්වය ප්‍රවර්ධනයට කටයුතු සම්පාදනය කිරීම.

ඊ. වැඩසටහනේ පරිපාලන ව්‍යුහය තීරණය කිරීම සහ ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදලේ පරිපාලනය.

උ. ව්‍යවසායකයින්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම, සහ ව්‍යවසාය සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.

ඌ. වැඩසටහනේ ක්‍රියාකාරීත්වයට සම්බන්ධ රේඛීය ආයතන, සහභාගීත්ව ණය දෙන ආයතන සහ සහන සේවා සපයන ආයතන සමඟ සම්බන්ධීකරණය.

එ. වැඩසටහනේ මූල්‍ය පදනම ශක්තිමත් කිරීමට මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා යෝජනා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

ඒ. ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය සම්බන්ධ කාලීන වාර්තා සම්පාදනය කිරීම.

ඔ. වැඩසටහනේ අරමුණු ලඟා කර ගැනීමටහේතු වන හෝ ආනුශාංගික වන වෙනත් සියලු කටයුතු කිරීම.

## ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන දැනට ලබා ඇති සාර්ථකත්වය.

ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ දැනට සිදුවන ප්‍රධාන කාර්ය වන්නේ ව්‍යවසායකයන් පුහුණු කිරීම, චක්‍රීය ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමයි. මෙම ආයතනය පූර්වගාමී ප්‍රඥප්තියක් යටතේ 2000 වර්ෂයේදී පමණ ආරම්භ වී ඇති අතර එහෙත් 2006 වර්ෂය පමණ වන විට අක්‍රීය තත්ත්වයට පත්ව ඇත. නැවත 2017 වර්ෂයේ සම්මත කරන ලද ප්‍රඥප්තිය, යටතේ සැළකිය යුතු තරම් කාලයක් ගතකර නොමැත.

කෙසේ වෙතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලයිස්තුවේ 21 වන ඡේදයේ පරමාර්ථයෙහි එක්තරා කොටසකට සීමා වීමක් මෙම ප්‍රඥප්තිය යටතේ සිදුව ඇත. එනම් වාණිජ්‍ය ව්‍යවසායයන්හි පළාත් සභාව වෙනුවෙන් නිරතවීමට වඩා එසේ නිරතවූවන් ප්‍රවර්ධනය කිරීමක් පමණක් සිදුවීම. අදාල ප්‍රඥප්තිය යටතේ ඊට පෙර පැවති ප්‍රඥප්තියට සාපේක්ෂව සාර්ථක විධිවිධාන ඇතුලත්ව ඇත්තේ වුවත්, තවදුරටත් සැළකිය යුතු කරුණු නෛතික වශයෙන් හා ප්‍රායෝගික වශයෙන් පවතියි.

විශේෂයෙන්ම ආයතනය භාරකාර මණ්ඩලයක් හා කළමනාකරණ මණ්ඩලයක් යන සංයුතීන් දෙකක් යටතේ මෙහෙයවනු ලබයි. එහෙත් ආයතනය වෙනුවෙන් සංස්ථාපනය වනුයේ භාරකාර මණ්ඩලයයි. එනිසාම ආයතනික බලතල ඇත්තේ භාරකාර මණ්ඩලයටයි. එහෙත් භාරකාර මණ්ඩලය අවම වශයෙන් වසරකට රැස්විය යුත්තේ එක්වරයි. එහෙත් භාරකාර මණ්ඩලය වෙනුවෙන් එහි බලතල හා කාර්‍යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා හැසිරෙන කළමනාකරණ මණ්ඩලය තෙමසකට වරක් හෝ රැස්වී තීරණ ගත යුතුය.

<u>ඌව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන තවදුරටත් සාර්ථකත්වය සඳහා කරනු ලබන යෝජනා.</u>

විශේෂයෙන්ම දැනට බලාත්මක ප්‍රඥප්තිය යටතේ සැලකිය යුතු කාලයක් ආයතනය ක්‍රියාත්මක වී නොමැති තත්ත්වය යටතේ ක්‍රියාත්මක යාන්ත්‍රණය සම්බන්ධයෙන් ගැඹුරු නිරීක්ෂණයක් කළ නොහැක. එහෙත් ව්‍යවස්ථාවේ පරමාර්ථ මෙන්ම ප්‍රඥප්තියේ පරමාර්ථය පුළුල්ව සලකා ඒ අනුව අදාළ ප්‍රඥප්තියට අතිරේක බලතල ඇතුළත් කිරීම ද වැදගත් වෙයි.

එසේම ආයතනයෙහි නෛතික සංයුතිය පිළිබඳව හා එහි කළමනාකරණ මණ්ඩලයෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව තවදුරටත් සමාලෝචනය කිරීම වැදගත් වෙයි. ඒ සඳහා ප්‍රඥප්තිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පවතියි.

එසේම අරමුදල පාලනය සම්බන්ධයෙන් විධිවිධාන ඇතුලත් කිරීමේදී මූල්‍ය ආයෝජකයන්ට හා පළාත් සභා අරමුදලට මුදල් මාරු කිරීමට විධි විධාන ඇතුළත් කිරීමේ ප්‍රබල අවශ්‍යතාවයක් පවතින බව ද නිරීක්ෂණය විය. ඒ සඳහාද ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ.

<u>මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය</u>

මධ්‍යම පළාත් සභාවේ 2008 අංක 1 දරණ මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇත.

## ආයතනයෙහි කාර්යයභාරය.

2000 ජූලි මස සිට 2007 ජූනි මස දක්වා මධ්‍යම පළාතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ජර්මන් ආර්ථික සහයෝගිතා වැඩසටහන විසින් පළාතේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කළ සංවර්ධන ක්‍රමෝපායන් සහ වැඩසටහන් වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙනයාම හා කලාපය වෙතින් ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙහි මූලික අරමුණයි.

## මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙහි සංවිධාන ව්‍යුහය.

මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පහත අයවලුන්ගෙන් සමන්විත වේ.

අ) මධ්‍යම පළාතේ කලාපීය ආර්ථික සංවර්ධනය පිළිබඳ විශේෂඥයකු

ආ) මධ්‍යම පළාතේ දිස්ත්‍රික් ලේකම්වරයෙකු (වසර 3කට වරක් මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්වරු වරින් වර නියෝජනය වන පරිදි)

ඇ) මධ්‍යම පළාතේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්

ඈ) මධ්‍යම පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)

ඉ) මධ්‍යම පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

ඊ) මධ්‍යම පළාතේ රාජ්‍ය බැංකු ක්ෂේත්‍රයේ නියෝජිතයෙකු

උ) මධ්‍යම පළාතේ කර්මාන්ත හා වාණිජ මණ්ඩල සාමාජිකයෙකු

ඌ) මධ්‍යම පළාතේ පෞද්ගලික අංශයේ කර්මාන්ත ව්‍යාපාරිකයෙකු

ඒ) මධ්‍යම පළාතේ කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ හෝ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ පෞද්ගලික අංශයේ නියෝජිතයෙකු

## මධ්‍යම පළාත් කලාපීය සංවර්ධන ආයතනයන්හි බලතල

අ) මධ්‍යම පළාත තුළ විවිධ වූ නිෂ්පාදන හා සේවා සපයන්නන්ගේ භාණ්ඩ හා සේවාවල ගුණාත්මක බව ඉහළ නැංවීමට අදාළ තාක්ෂණික සේවා වැඩසටහනක් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම.

ආ) මධ්‍යම පළාතේ නිෂ්පාදකයින් හා සේවා සපයන්නන් ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපල වෙත සම්බන්ධ කර වීම.

ඇ) ගෝලීය වෙළෙඳපල රටාව තුල තරඟකාරී වෙළෙඳපල ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා ශක්තිමත් කර දළ දේශීය නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබාදීම.

ඈ) මධ්‍යම පළාත තුළ ආයෝජන හිතකාමී යාන්ත්‍රණයක් ස්ථාපනය කොට දේශීය හා විදේශීය ආයෝජිකයින් මෙම පළාතේ ආයෝජනය කිරීමට පෙළඹවීම හා ඒ සඳහා ආකර්ශනය කර ගැනීම.

ඉ) මධ්‍යම පළාතේ නිෂ්පාදන හා සේවාවලට අගය එකතු කිරීමේ ක්‍රියාවලිය අනුගත කිරීම සඳහා අවශ්‍ය වාතාවරණය සැකසීම.

ඊ) ආර්ථික සහයෝගිතා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ සියළුම සේවා කටයුතු පවත්වාගෙන යාම සහ එම ආයතනය යටතේ සංවර්ධනය කළ නිෂ්පාදන හා සේවා අංශයන් තවදුරටත් ශක්තිමත් කිරිම.

<u>ප්‍රඥප්තිය යටතේ සාර්ථකත්වයකට කරුණු යෙදේ ද යන්න හා එසේ නම් සාර්ථකත්වයේ ප්‍රමාණය.</u>

අදාළ ප්‍රඥප්තියෙහි සඳහන් විධිවිධාන අනුව මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය ඉතා පුළුල් වූ අරමුණක් යටතේ බිහිකරන්නට යෙදී ඇත. එහි පරමාර්ථය එතරම් පුළුල්වීමෙන්ම කාර්යභාරය නිශ්චිත ද යන ප්‍රශ්නය ද පැන නඟිනු ඇත. මෙවැනි වූ ආයතනයක් සංස්ථාපනයේදී අරමුණ වඩාත් පැහැදිලිතාවයකින් තිබීම, පරමාර්ථයන්ට අනුකූලව කටයුතු කිරීමට පහසු කරවයි. කෙසේ වෙතත්, මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙහි ප්‍රධාන කාර්යයක් වී ඇත්තේ ස්වයං රැකියා වැඩසටහන් ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

එසේම, බලතල අතරට අයත් යම් යම් කරුණු පළාත් සභා මට්ටමින් ස්වාධීනව ක්‍රියාත්මක කළ නොහැකි කරුණු වෙයි. ක්‍රියාත්මක කළ හැකි කරුණු තුළ පමණක් දැනට තුළ පමණක් දැනට ආයතනය ක්‍රියාත්මක වෙමින් පවතියි. ආයතනයෙහි ඉපයීම් ආයතනයෙහි අරමුණු උදෙසා යොදවා ඇති අතර, ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉපයීම් පළාතේ ජනතාවගේ උන්නතිය සඳහා යම්තාක් යොමු වීමෙන් පළාත් සභා අරමුදලට යම් පහසුවක් ඇති කරයි. එසේ හැරුණු කොට පළාත් සභා අරමුදල උදෙසා සෘජුව මුදල් උත්පාදනයක් මෙම ආයතනය මඟින් සිදු නොවේ.

**<u>මධ්‍යම පළාතේ කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙහි තවදුරටත් සාර්ථකත්වය වෙනුවෙන් කරන යෝජනා හා නිර්දේශ.</u>**

මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙහි සාර්ථකත්වය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා විය යුතු ප්‍රධාන අවශ්‍යතාවය, අදාළ ප්‍රඥප්තිය උචිත ආකාරයට ශක්තිමත් කරලීමයි. මන්ද, මධ්‍යම පළාතේ 2008 අංක 01 දරණ මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනික ප්‍රඥප්තිය ව්‍යවස්ථානුකූලව ශක්තිමත්වීම උදෙසා නිවැරදි විය යුතු කරුණු ගණනාවක් පවතියි.

එසේ නිවැරදි විය යුතු කරුණු නම්,

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1563/32 හා 2008 අගෝස්තු 22 දිනැති ගැසට් පත්‍රයෙහි මෙම ප්‍රඥප්තිය ප්‍රකාශ වී ඇති ආකාරයට එහි දීර්ඝ නාමයෙන් ආරම්භවී ගොඩනැගී ඇති ආකාරය ප්‍රඥප්ති කෙටුම්පත් කරන නියමයන්ට අනුකූල නොවීම හා එමඟින් කෙටුම්පත් දෝෂ ගණනාවක් හටගෙන තිබීම.
- ආයතනය නිසි ආකාරයෙන් සංස්ථාපනය වී නොතිබීම.
- ආයතනයෙහි අරමුණු හා බලතල නිශ්චිත නොවීම.
- ඇතුළත් වී ඇති යම් බලතල ව්‍යවස්ථාවේ පළාත් සභාවන්ට අදාළ බල සීමාවෙන් ඔබ්බට ව්‍යාප්ත වී තිබීම.
- ආයතනයෙහි කාර්ය මණ්ඩල සංයුතිය ප්‍රඥප්තියට ඇතුළත් වීමෙන් ප්‍රඥප්තිය සංශෝධනයකින් හැර පරිපාලන ව්‍යුහය ව්‍යාප්ත කර ගැනීමට නොහැකි වීම.
- ආයතනයෙහි අරමුදල ව්‍යවස්ථානුකූලව පිහිටුවා නොතිබීම.

යන ආදී කරුණු මූලිකව දැක්විය හැක.

එබැවින්, ඉහත සඳහන් කරුණු නිවැරදි කර ගනිමින් නිශ්චිත පරමාර්ථයන් පළාත් සභා ලැයිස්තුවෙහි 21වන ඡේදයෙහි පරමාර්ථයට අනුකූල වන පරිදි ඇතුළත් කර ගනිමින් නීත්‍යානුකූල සංස්ථාපනයකින් නැවත මෙම ආයතනය සංස්ථාපනය කරලීම වඩා වැදගත් වේ. ඒ සඳහා, අදාළ ප්‍රඥප්තියෙහි පවත්නා ව්‍යවස්ථානුකූල දෝෂ හා තාක්ෂණික දෝෂ ඉවත්වන පරිදි සකස්කර ගනු ලබන ප්‍රඥප්තියක් මඟින් ආයතනයෙහි ක්‍රියාකාරීත්වයට වඩාත් පහසු වනු ඇත.

එසේම, ප්‍රඥප්තියෙහි අරමුදල යටතේ පළාත් සභා අරමුදලට ඍජු දායකත්වයක් සඳහා විධිවිධාන සැලසී නොමැති වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවෙහි 21 වන ඡේදයේ සඳහන් අභිලාෂයන් පරිභාහිර වීමට හේතු විය හැකි බැවින් නැවත ප්‍රඥප්තිය කෙටුම්පත් කරනයේදී ඒ සම්බන්ධයෙන් ද සැළකිලිමත් වීම වැදගත් වෙයි. තවද, අදාළ ආයතනයෙහි පරිපාලන ව්‍යුහය ප්‍රඥප්තිය යටතේ විස්තර වීම, ආයතනයෙහි ව්‍යාප්තියට හානියක් විය හැකි තත්ත්වය යටතේ

එවැනි වූ කරුණු සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත්වෙමින් අදාළ ප්‍රඥප්තිය පරිච්ඡින්න කරමින් නව ප්‍රඥප්තියක් පැනවීම සිදුකිරීම නිර්දේශ කෙරේ.

එසේම, මෙවැනි ආයතනයක සංයුතිය නිශ්චය කිරීමේ දී ආයතනික පරමාර්ථයන්ට අනුකූල වන සංයුතියක් ඇතිකරගැනීම ද ඉතා වැදගත් වනු ඇත. නිශ්චිත සංයුතියට අතිරේකව අවශ්‍යනම් උපදේශක මණ්ඩලයක් පවත්වා ගත හැක. එම කරුණු ද නව ප්‍රඥප්තියක් කෙටුම්පත් කරනයේදී සැලකීම වැදගත් වේ.

තව ද, මෙවැනි ආයතනයක් පෞද්ගලික ව්‍යවසායන් සමඟ බද්ධ ව්‍යාපෘති කිරීම, ආදායම් ප්‍රවර්ධනයට වැදගත් වෙයි. එම කරුණු ද ඉදිරියේදී ප්‍රඥප්ති සැකසීමේදී වැදගත් වන බව ද පෙන්වා දිය යුතුය.

## පර්යේෂණ අධ්‍යයනයට පොදු නිරීක්ෂණ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි පළාත් සභා ලැයිස්තුවට අදාල 21 වන ජේදය යටතේ ලබා දී ඇති බලතල ප්‍රමාණ කරගනිමින් ඒ ඒ පළාත් සභා විසින් පනවන්නට යෙදී ඇති ප්‍රඥප්ති හා, ඒ යටතේ පිහිටුවන්නට යෙදී ඇති ආයතන සම්බන්ධ නිරීක්ෂණ ඉහතින් සඳහන් කරන්නට යෙදුණි.

මෙහිදී සැලකිය යුතු විශේෂ කරුණ වන්නේ නැගෙනහිර පළාතේ පළාත් සභාව සහ උතුරු පළාතේ පළාත් සභාව විසින් ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන ජේදයට අනුකූලව එකඳු ප්‍රඥප්තියක් හෝ පනවා නොමැති වීමයි.

එසේම අනෙකුත් පළාත් සභා යටතේ වුව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අරමුණු කළ ආකාරයටම ව්‍යාප්ත වෙමින් අදාල ප්‍රඥප්ති පනවා ඇතැයි යන්න සැලකිය නොහැක. මන්ද පනවා ඇති එවැනි එවැනි ප්‍රඥප්ති මඟින් සංස්ථාපනය කරන ලද ආයතනයන්හි මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ බොහෝ දුරට රැකියා උත්පාදනයයි.

එසේම ව්‍යවස්ථාවෙන් අරමුණු කළ පරමාර්ථයට, සංස්ථාපනය වූ අරමුණු සමාන වූ අවස්ථා නිරීක්ෂණය වූයේ ආයතන කිහිපයක් හා සම්බන්ධයෙන් පමණි.එමගින් තහවුරු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාල ජේදයෙහි නිශ්චිත පරමාර්ථයන් තේරුම්ගෙන අදාල ප්‍රඥප්ති සකස් කිරීමක් සිදුවී නොමැති බවයි. එසේම මෙම පරියේෂණ අධ්‍යයනය සිදුකිරීමේදී ඒ බව තහවුරු වූ තවත් කරුණක් වනුයේ, මේ හා සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා සිදුකරන ලද සම්මුඛ විවරණයන්ට සම්බන්ධ නිලධාරීන්ද, එවැනි ප්‍රඥප්තියක් ඇති බව දැන සිටියත් ඒ සඳහා බලය ලද ආකාරයන් සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයකින් සිටින බවයි.

පළාත් මට්ටමින් ආදායම් උත්පාදනයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලැබී ඇති මෙම ප්‍රතිපාදනය, ව්‍යවස්ථාවට ඇතුළත් සෙසු ආදායම් ප්‍රභවයන්ට සාපේක්ෂව සුවිශේෂිය. මන්ද අනෙකුත් ආදායම් ප්‍රභවයන් පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින්, හෝ නීතියක් යටතේ අවසර දෙන ප්‍රමාණයට සීමා වී තිබීමයි. එසේ වුවද මෙම ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවක් විසින් ව්‍යවස්ථාවේ සඳහන් සීමාවන් තුළ පළාත් සභාවට අනන්‍ය වන පරිදි ආදායම් උත්පාදනයන් උදෙසා ප්‍රඥප්ති සම්පාදනය කර ගත හැක. එහෙත් ඒ හා සම්බන්ධයෙන් නිසි අවබෝධයකින් පළාත් සභා ක්‍රියාත්මක වී ඇති බවට සෑහීමට පත් විය නොහැක.

එසේම පළාත් සභා යටතේ දැනටමත් සම්මත වී ඇති ප්‍රඥප්ති බොහෝ දුරට කෙටුම්පත්කරණ දෝෂයන්ගෙන් යුක්තය. ප්‍රඥප්ති කෙටුම්පත්කරණයේදී සැළකිය යුතු මූලධර්ම නොසලකා කෙටුම්පත් වී තිබීම, සංයුතිය නිසි ආකාරයෙන් නොවීම. අරමුදල නිසි ආකාරයෙන් පිහිටුවා නොතිබීම ආදී අඩුපාඩු අධ්‍යනයට ලක්කරන ලද සියළුම ප්‍රඥප්ති යටතේ පොදුවේ නිරීක්ෂණය විය.

තවද ප්‍රඥප්ති සම්පාදනයේදී පූර්වයෙන් වෙනත් පළාත් සභාවක් පනවන ලද ප්‍රඥප්තියක් එලෙසින්ම තවත් පළාත් සභා පනවා ගත් අවස්ථා ද විය. එමගින් තම පළාත් සභාවේ අනන්‍යතාවයට අනුකූල වීමක්

නොමැත. එමගින් සිදුව ඇත්තේ යම් කාර්යභාරයක් සහිත ආයතනයක් පවත්වාගෙන යාම පමණි. එබැවින් ව්‍යවස්ථාවේ හරයට අනුකූල වන ප්‍රඥප්ති සම්පාදනය පිළිබඳ යම් යම් පළාත් සභාවන්ට නිවැරදි නීතිමය අවබෝධයන් නොවූණ අවස්ථාද නිරීක්ෂණය විය.

<u>පළාත් සභා වල ආදායම් වර්ධනය කරගැනීමට අදාළ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම උදෙසා වන යෝජනා.</u>

1. පළාත් සභාවක් ස්වාධීනව ආදායම් වර්ධනය කර ගැනීම උදෙසා ක්‍රියාත්මක වීම ප්‍රඥප්ති යටතේ සිදුවිය යුතු බැවින් ද , ඒ සඳහා ප්‍රඥප්ති සම්පාදනයට ඇති හැකියාව, එවැනි වූ ප්‍රඥප්ති යටතේ විය යුතු අන්තර්ගතය කෙසේ විය යුතුද යන්න පිළිබඳ අවබෝධයක් සියළු පළාත් සභාවන්හි හඳුනාගත් ප්‍රධාන නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කිරීම. මේ සඳහා පළාත් මුදල් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් ආදායම් කොමසාරිස්වරුන්, පළාත් භාණ්ඩාගාර නිලධාරීන් සහ ලේකම්වරුන් හා පළාත් අමාත්‍යාංශ මට්ටමින් ලේකම්වරුන් හෝ නම් කරන ලද නිලධාරීන් සහභාගී කරවීම අතිෂයින් වැදගත් වෙයි.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛණයෙහි පළාත් සභා ලයිස්තුවේ 21 වන ඡේදය යටතට අදාලව ඉහතින් විශ්ලේෂණය කරන්නට යෙදුන ප්‍රඥප්ති සම්බන්ධයෙන් විය යුතු නිවැරදි කිරීම් සඳහා අදාල ප්‍රඥප්ති සංශෝධනය කිරීම හෝ එම ප්‍රඥප්ති පරිච්ඡින්න කර නව ප්‍රඥප්ති පැනවීමට අවශ්‍ය උපදේශනාත්මක සහය පළාත් සභා වෙත ලබා දීම.

3. පළාත් සභා ප්‍රඥප්ති යටතේ ව්‍යවස්ථානුකූලව ව්‍යාප්ත විය හැකි සීමාවන් සම්බන්ධයෙන් කිසියම් මාර්ගෝපදේශයක් මඟින් පළාත් සභා දේශපාලන අධිකාරිය මෙන්ම පරිපාලන බලධාරීන්ගේ අවධානය යොමු කිරීම මෙන්ම ඊට අදාල දැනුවත් කිරීම් සිදුකිරීම.

4. යම් යම් පළාත් සභා විසින් රැකියා අවස්ථා උත්පාදනය පමණක් අරමුණු කරගනිමින් ප්‍රඥප්ති සම්පාදනය කොට ඇත්ද යන්න කරුනු විමසීමේදී අවසානයේදී මතුවන තත්ත්වයක්ව පැවතීම. මන්ද සමාන කාර්යභාරයක් වෙනුවෙන් ප්‍රඥප්ති දෙකක් යටතේ විධිවිධාන සැලසුන අවස්ථාද වූ හෙයිනි. එයින් මූල්‍ය උත්පාදනයකට වඩා මූල්‍ය අනර්ථයකට කරුණු යෙදේ. එබැවින් ඒ සම්බන්ධයෙන් පළාත් සභාවන්හි අවධානය යොමු කරවීම වැදගත් වෙයි.

   උදා :- වයඹ සංවර්ධන ප්‍රඥප්තිය යටතේ වයඹ සංවර්ධන අධිකාරියට බොහෝ දුරට සමාන අරමුණක් වයඹ මානව සම්පත් අධිකාරිය ක්‍රියාත්මක වීම.

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 වන වගන්තිය යටතේ සඳහන් පළාත් සභා අරමුදලට ලැබිය යුතු ආදායම් "පළාත් සභාවේ වෙනත් සියළු ලැබීම්" යන්න දක්වා ඇත.

මේ යටතේ වන ලැබීම් යනු හුදෙක්ම පළාත් සභා විසින් සම්පාදිත ප්‍රඥප්ති යටතේ උපචිත ආදායම් විය යුතුය. එසේ වූවද පළාත් සභා විසින් මේ වන විට ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන උපලේඛණයෙහි පළාත් සභා ලැයිස්තුවෙහි 21 වන ඡේදයට අනුරූපීව පනවන්ට යෙදී ඇති ප්‍රඥප්ති

මඟින් රැස්කරන ලද ආදායමින් කොටසක් හෝ පළාත් සභා අරමුදලට බැර කිරීම උදෙසා විධිවිධාන සැලසී නොතිබිණි. එබැවින් ඒ පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රඥප්ති සම්පාදනයෙදී සැලකිය යුතු නෛතික කරුණු මෙන්ම ප්‍රායෝගික තත්ත්වයන් පිළිබඳවද දැනුවත්භාවය පළාත් සභා තුළ හඳුනාගත් නිලධාරීන් උදෙසා ලබා දීමේ ප්‍රබල අවශ්‍යතාවයක් ඇති බවත්, ඒ සඳහා ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය බවටත් යෝජනා කෙරේ.

කාලීන වශයෙන් ඉතා වැදගත් වූත්, හරවත් වූත්, අධ්‍යයනයක් වෙනුවෙන් මා තෝරා ගැනීම පිළිබඳව අතිශයින් ස්තුතිවන්ත වන අතර, මෙම පර්යේෂණ අධ්‍යයනය යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක තත්ත්වයට පත්කරලීමට උදෙසා කටයුතු සම්පාදනය වනු ඇතැයි හුදෙක්ම අපේක්ෂා කෙරේ.

## උප ලේඛණ අංක 01

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයෙහි පළාත් සභා ලැයිස්තුගත විෂය කාරණා

1. පොලිසිය සහ මහජන සාමය

සහ ජාතික සුරක්ෂිතභාවය ද යම් සන්නද්ධ හමුදා හෝ සිවිල් බලයට සහාය පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ පාලනය යටතේ වූ වෙනත් යම් හමුදා යොදා ගැනීම ද බැහැර කොට, සහ කොළඹ නගරය, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරය සහ ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් සීමාවන් නිශ්චය කොට නිම කරනු ලබන ඒ නගර වල තදාසන්න ප්‍රදේශයන් අත්හැර, පළමු වන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට පළාත ඇතුළත මහජන සාමය පැවැත්වීම සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම.

2. සැලසුම්

පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම.

3. අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා

III වන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට, අධ්‍යාපනය

4. පළාත් පාලනය

4:1 පළාත් පාලන ආයතනවල සංයුතිය, ස්වරූපය සහ ව්‍යුහය නීතියෙන් නියම කළ යුතුය යන ව්‍යතිරේකයට යටත්ව, පළාත් පාලන සහ ග්‍රාම පරිපාලන කාර්යය සඳහා මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන ආයතන;

4:2 නීතියෙන් පිහිටවනු ලබන පළාත් පාලන ආයතන (විසුරුවා හැරීමට හේතු පිළිබඳව යම් අර්ධ අධිකරණමය විභාගවලට සහ ඒ සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිකර්මවලට සහ නීතියෙන් විධිවිධාන සැලසිය හැකි විගණනයට අදාල යටත්ව) විසුරුවා හැරීමේ බලය ද ඇතුළුව ඒ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම;

4:3 පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේය. මහා නගර සභා ආඥා පනතේ සහ නගර සභා ආඥා පනත යටතේ මහ නගර සභාවලට සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේය. පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභාවලට තිබෙන්නේය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරා දීම කළ හැක්කේය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම පළාත් සභාවක් විසින් කළ නොහැක්කේය.

4:4 පවත්නා නීතිය යටතේ ග්‍රාමෝදය මණ්ඩල වෙත පැවරී ඇති බලතල ග්‍රාමෝදය මණ්ඩලවලට තිබෙන්නේය. පළාත් සභාවක් විසින් ග්‍රාමෝදය මණ්ඩල වලට අතිරේක බලතල පවරා දීම කළ හැකිය.

5. පළාත්වල නිවාස සහ ඉදිකිරීම.

5:1 ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව (ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති නොවන) පළාත්බද නිවාස සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ පසුවිපරම් කිරීම.

5:2 කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ පනත සහ ගෙවල් කුලී පනත, පළාතක් ඇතුළත ක්‍රියාත්මක කිරීම.

5:3 මේ ලැයිස්තුවේ දක්වා ඇති විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු.

6. (අ). ජාතික මහාමාර්ග ;

(ආ). ජාතික මහා මාර්ග වල ඇති පාලම් සහ තොටුපලවල් හැර, පළාත් ඇතුළත ඇති පාරවල්, පාලම් සහ තොටුපලවල්,

7. සමාජ සේවා සහ පුනරුත්ථාපනය.

7:1 පරිවාස සහ ළමා රක්ෂක සේවා ;

7:2 අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය ;

7:3 කායික, මානසික සහ සාමාජික වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය ;

7:4 අබල සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම.

8. පළාත ඇතුළත මෝටර් වාහන මගින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ සේවා සහ භාණ්ඩ ගෙන යාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම.

9. කෘෂිකර්මය සහ ගොවිජන සේවා.

9:1 පළාත් බද කාර්යය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය ද (අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම්වල පදිංචි කිරීමේ යෝජනා ක්‍රම, රජයේ ඉඩම් හා වැවිලි කෘෂි කර්මය හැර කෘෂි කාර්මික සේවාද ඇතුළුව, කෘෂිකර්මය ;

9:2 සුළු වාරිමාර්ග වැඩ කටයුතු පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම.

9:3 ජාතික කෘෂි කාර්මික පර්යේෂණ ආයතන ලෙස නාමෝද්දිෂ්ඨ ආයතන හැර කෘෂි කාර්මික පර්යේෂණ.

10. ග්‍රාම සංවර්ධනය

11. සෞඛ්‍යය

11:1 (ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්ය සඳහා පිහිටවනු ලබන රෝහල් හැර) මහජන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස සහ බෙහෙත් ශාලා පිහිටුවා පවත්වා ගෙන යාම;

11:2 මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පවුල් සෞඛ්‍ය, මාතෘ දාරක රක්ෂණය, ආහාර සහ ආහාර සෞඛ්‍යාරක්ෂණය, පාරිසරික සෞඛ්‍යය ;

11:3 පළාත් සඳහා සෞඛ්‍ය වර්ධන සැලසුම සහ වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම;

11:4 ඖෂධ ලබාදීම හැර, පළාත ඇතුළත ඉහත 1 හි සඳහන් සියළු ආයතන සඳහා පහසුකම් සැලසීම ;

11:5 ඉහත 1 හි සඳහන් ආයතන වලට අනුයුක්ත පිරිස් වලට ශ්‍රී ලංකාව ඇතුළත පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

12. දේශීය වෛද්‍ය කටයුතු - සිද්ධ සහ යුනානි

12:1 ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, එවැනි බෙහෙත් ශාලා වලට හා රෝහල් වලට ආධාර මුදල්;

12:2 ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම.

13.

13:1 පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන තානායම්; සහ

13:2 මේ ලැයිස්තුවෙහි යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වල කර්තව්‍ය විශේෂයෙන් සඳහන් කොට ඇත්තේද ඒ දෙපාර්තමේන්තු විසින් දැනට පාලනය කරනු ලබන සංචාරක බංගලා.

14. බඩු උකස් ගන්නන් - බැංකු විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාර හැර, බඩු උකස් ගන්නන්

15. වෙළඳපොලවල්, පොලවල්.

16. පළාත් ඇතුළත ආහාර සැපයීම සහ බෙදා හැරීම.

17. සමූපකාර

17:1 සමූපකාර ව්‍යාපාර සහ පළාත් තුළ ඇති සමූපකාර සමිති සංවිධාන, ලියාපදිංචිය, අධීක්ෂණය සහ විගණනය ;

17:2 සමූපකාර අධ්‍යාපනය සහ ප්‍රචාරක කටයුතු ද ඇතුළුව, පළාත් ඇතුළත සමූපකාර සංවර්ධනය ;

17:3 පළාත් බද සමූපකාර සේවා නියුක්තයන්ගේ කොමිෂන් සභා ;

17:4 පළාත් ඇතුළත සමූපකාර සමිතිවල සේවා නියුක්තයන් ංසේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඒ සේවා නියුක්තයන් හා සම්බන්ධ වෙනත් කාරණා.

18. ඉඩම - ඉඩම්, එනම් (II) වන පරිශිෂ්ඨයෙහි දක්වා ඇති ප්‍රමාණයට ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් බුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම් වල පදිංචි කරවීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම.

19. වාරිමාර්ග

පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියළු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම.

20. සත්ත්ව පාලනය

පළාත් ඇතුළත පශු සම්පත් සංරක්ෂණය කිරීම, රැකගැනීම සහ වැඩි දියුණු කිරීම හා සත්ව රෝග වැළැක්වීම.

21. සංවර්ධනය සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට යටත්ව, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යවසාය හා ව්‍යාපෘති කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය සංස්ථා වලට ඇති බලයට හානියක් නොමැතිව, පළාත් ඇතුළත ප්‍රවර්ධනය කිරීමට පිහිටුවීමට හා ඒවායේ නිරත වීමට ඇති බලය (පළාත් ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පරීක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පළාත් සඳහා කාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ඒ පිළිබඳ සම්බන්ධීකරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ).

22. වරිත ශෝධනාගාර, බෝස්ටල් ආයතන සහ ඒ සමාන ස්වභාවයේ වෙනත් ආයතන සහ ඒවායේ රඳවාගෙන සිටින තැනැත්තන්, එවැනි ආයතන ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වෙනත් පළාත් සමඟ වැඩපිළිවෙල.

23. මත් බීම සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම හා විකිණීම.

24. පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ජාතික අනුස්මරණ සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර, භූමදාන සහ භූමදාන බිම්, ආදාහන සහ ආදාහන බිම්.

25:1 පළාත් සභාවක් විසින් පාලනය කරන සහ මුදල් සපයන පුස්තකාල, කෞතුකාගාර සහ වෙනත් ඒ හා සමාන ආයතන ;

25:2 ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්මේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පෞරාණික සහ ඓතිහාසික ස්මාරක සහ වාර්තා.

26. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට පළාත් ඇතුළත පතල් හා ඛණිජ සම්පත් විධිමත් කිරීම.

27. වෙළෙඳ සංස්ථා, බැංකු, රක්ෂණ හා මූල්‍ය සංස්ථා හෝ පළාතට සීමා වූ අරමුණු ඇති සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම.

28. සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ, සාහිත්‍ය, විද්‍යා, ආගමික සහ වෙනත් සමිති හා සංගම් විධිමත් කිරීම.

29:1 ප්‍රදර්ශනය හා ප්‍රසිද්ධ රඟදැක්වීම් සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම හැර, රඟමඬල් සහ රඟදැක්වීම, සංගීතය, සිනමාහල්, ප්‍රසංග සහ විනෝද කටයුතු ;

29:2 ක්‍රීඩා දිරි ගැන්වීම සහ වැඩි දියුණු කිරීම (ජාතික ක්‍රීඩා සංගම් හැර).

30. බලපත්‍ර ගාස්තු සහ බදු නියම කිරීම හැර ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා.

31. පළාත් ණය.

32. මේ ලැයිස්තුවෙහි සඳහන් කාරණා අතුරින් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති වලට විරුද්ධව සිදුකරනු ලබන වැරදි.

33. යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු හැර, මේ ලැයිස්තුවෙහි සඳහන් කවර හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු.

34. (ජාතික විදුලිබල පද්ධතිය පෝෂණය කිරීම සඳහා උත්පාදනය කරනු ලබන ජල විදුලි බලය හා බලය හැර) විදුලිබල ශක්ති උත්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් ඇතුළත වැඩ බිම් සහ පහසුකම් සංවර්ධනය කිරීම, සංරක්ෂණ කිරීම සහ පාලනය කිරීම.

35. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට, මුදල් ණයට ගැනීම.

36:1 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියෙන් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, තොග සහ සිල්ලර විකිණීම සම්බන්ධයෙන් පිරිවැටුම් බදු;

36:2 ජාතික ලොතරැයි සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ලොතරැයි නොවන ලොතරැයි සහ තැගි තරග බදු සහ ඔට්ටු බදු ;

36:3 බලපත්‍ර බදු, අරක්කු රා රේන්ද, මැදීම් බලපත්‍ර ගාස්තු සහ මත්පැන් බලපත්‍ර ගාස්තු ;

36:4 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් නියම කරනු ලැබිය හැකි යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම් වලට යටත්ව මෝටර් වාහන බලපත්‍ර ගාස්තු ;

36:5 ඖෂධ සහ වෙනත් රසායන ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළඳ බලපත්‍ර බදු ;

36:6 ඉඩම් සහ මෝටර් රථ වැනි දේපල පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ;

36:7 රේන්ද ගාස්තු එකතු කිරීම ;

36:8 අධිකරණ විසින් පනවනු ලබන දඩ ;

36:9 වෛද්‍ය ආඥා පනත යටතේ අය කරනු ලබන ගාස්තු ;

36:10 මෝටර් වාහන ගමනාගමන පනත යටතේ අය කරනු ලබන ගාස්තු ;

36:11 මෙම ලැයිස්තුවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගාස්තු ;

36:12 වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත යටතේ ගාස්තු ;

36:13 ඉඩම් සංවර්ධන ආඥා පනත සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් ගාස්තු ;

36:14 අධිකරණයේදී ඉදිරිපත් කෙරෙන ලේඛණ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ද ; ඇතුළු අධිකරණ ගාස්තු ;

36:15 පඩි සහ මිමි ආඥා පනත යටතේ නියමිත ගාස්තු ;

36:16 ආදායම් තක්සේරුව සහ එකතු කිරීම ඇතුළු ඉඩම් ආදායම සහ ආදායම් කාර්යය සඳහා ඉඩම් වාර්තා සමීක්ෂණය සහ පවත්වාගෙන යාම ;

36:17 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් අවසර දෙන ප්‍රමාණයට රජයේ දේපල ද ඇතුළු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් බදු ;

36:18 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම් වලට යටත්ව, බණිජ අයිතිවාසිකම සම්බන්ධයෙන් බදු ;

36:19 මත්ද්‍රව්‍ය සන්තකය, ප්‍රවාහනය, මිලට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු ;

36:20 පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ යටතේ අවසර දෙන ලද ප්‍රමාණයට පළාත්වල කාර්ය සඳහා ආදායම් ලබාගනු පිණිස පළාත ඇතුළත වෙනත් අයබදු ගැනීම ;

37. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ අවසර දී ඇති ප්‍රමාණයට, පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම.

උපලේඛණ 11

## වයඹ පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| අනු අංකය | ප්‍රඥප්තිය |
|---|---|
| 1. | වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 01 දරණ වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) පිළිබඳ ප්‍රඥප්තිය |
| 2. | වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 08 දරණ වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තිය |
| 3. | වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 10 දරණ වයඹ පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය |
| 4. | වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 11 දරණ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තිය |
| 5. | වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය |
| 6. | වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 01 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය |
| 7. | වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 03 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය |
| 8. | වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 02 දරණ වයඹ ජනකලා පදනම ප්‍රඥප්තිය |
| 9. | වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 03 දරණ බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය |
| 10. | වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 04 දරණ ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 11. | වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 09 දරණ වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය |
| 12. | වයඹ පළාතේ පළාත් සභාවේ 1993 අංක 01 දරණ වයඹ සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 13. | වයඹ පළාතේ පළාත් සභාවේ 1994 අංක 01 දරණ වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 14. | වයඹ පළාතේ පළාත් සභාවේ 1994 අංක 03 දරණ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය |
| 15. | වයඹ පළාතේ පළාත් සභාවේ 1994 අංක 04 දරණ අධිකරණ නඩු කැඳවීමේ ප්‍රඥප්තිය |
| 16. | වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය |
| 17. | වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරණ වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 18. | වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 04 දරණ වයඹ සත්ත්ව පාලන ප්‍රඥප්තිය |
| 19. | වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 01 දරණ වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය |
| 20. | වයඹ පළාතේ පළාත් සභාවේ 2001 අංක 01 දරණ වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 21. | වයඹ පළාතේ පළාත් සභාවේ 2003 අංක 04 දරණ වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 22. | 2004 අංක 03 දරණ සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය |
| 23. | වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරණ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය (දෙමළ) |
| 24. | වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරණ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය |
| 25. | වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරණ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය |
| 26. | වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක 02 දරණ කෘෂිකර්ම ප්‍රඥප්තිය |
| 27. | වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරණ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය |
| 28. | වයඹ පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරණ වාරිමාර්ග ප්‍රඥප්තිය |
| 42. | වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක 03 දරණ සමාජ සේවා ප්‍රඥප්තිය |
| 43. | වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරණ මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය |

සබරගමුව පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| අනු අංකය | ප්‍රඥප්තියේ නම සහ අංකය |
|---|---|
| 01 | 1989 අංක 06 දරණ සබරගමුව පළාත් සභාවේ (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ) ප්‍රඥප්තිය |
| 02 | 1990 අංක 03 දරණ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තිය |
| 03 | 1990 අංක 04 දරණ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය |
| 04 | 1990 අංක 06 දරණ සබරගමුව පළාත් සභා මුදල් ප්‍රඥප්තිය |
| 05 | 1990 අංක 08 දරණ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය |
| 06 | 1991 අංක 02 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය |
| 07 | 1991 අංක 03 දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය |
| 08 | 1992 අංක 01 දරණ සබරගමුව පළාත් සභාවේ බස්රථ මගින් මගී ප්‍රවාහන කිරීමේ සේවා කටයුතු ප්‍රඥප්තිය |
| 09 | 1993 අංක 02 දරණ සබරගමුව පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය |
| 10 | 1993 අංක 05 දරණ සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල් පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය |
| 11 | 1994 අංක 01 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය |
| 12 | 1994 අංක 03 දරණ සමූපකාර සමිති ප්‍රඥප්තිය |
| 13 | 1994 අංක 04 දරණ සමාජ සේවා අරමුදල ප්‍රඥප්තිය |
| 14 | 1994 අංක 07 දරණ පෙර පාසැල් ප්‍රඥප්තිය |
| 15 | 1995 අංක 02 දරණ අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය |
| 16 | 1998 අංක 02 දරණ පුස්තකාල සේවක මණ්ඩල ප්‍රඥප්තිය |
| 17 | 2006 අංක 04 දරණ ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 18 | 2006 අංක 05 දරණ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 19 | 2007 අංක 03 දරණ සමූපකාර සමිති ප්‍රඥප්තිය |
| 20 | 2008 අංක 04 දරණ සබරගමුව පළාත් මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය |
| 21 | 2009 අංක 02 දරණ සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය |

| | |
|---|---|
| 22 | 2010 අංක 01 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 23 | 2010 අංක 02 දරණ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 24 | 2014 අංක 01 දරණ සබරගමුව සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 25 | 2014 අංක 02 දරණ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය |
| 26 | 2014 අංක 04 දරණ ළමා නිවාස ප්‍රඥප්තිය |
| 27 | 2016 අංක 01 දරණ පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තිය |

<u>මධ්‍යම පළාත් සභාව සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්ති වලට අදාළ තොරතුරු</u>

| අනු අංකය | ප්‍රඥප්තියේ නම |
|---|---|
| 01 | 1990 අංක 03 අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 02 | 1990 අංක 06 සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය |
| 03 | 1990 අංක 07 පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය |
| 04 | 1990 අංක 09 ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 05 | 1990 අංක 10 සමූපකාර සමිති ප්‍රඥප්තිය |
| 06 | 1990 අංක 11 කෘෂිකර්ම ප්‍රඥප්තිය |
| 07 | 1990 අංක 17 මුදල් ප්‍රඥප්තිය |
| 08 | 1990 අංක 18 ආයුර්වේද ප්‍රඥප්තිය |
| 09 | 1991 අංක 01 පළාත් පාලන කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය |
| 10 | 1992 අංක 02 මුදල් ප්‍රඥප්තිය |
| 11 | 1993 අංක 03 සමූපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය |
| 12 | 1993 අංක 05 නිවාස සංවර්ධන ප්‍රඥප්තිය |
| 13 | 1995 අංක 02 පුස්තකාල ප්‍රඥප්තිය |
| 14 | 2000 අංක 01 මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය |
| 15 | 2001 අංක 01 කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 16 | 2001 අංක 02 උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතනවලට හැරවීමට විධිවිධාන සැළසීමේ ප්‍රඥප්තිය |
| 17 | 2003 අංක 02 මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 18 | 2006 අංක 01 සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය |
| 19 | 2008 අංක 01 කලාපීය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තිය |
| 20 | 2014 අංක 04 බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය |
| 21 | 2015 අංක 02 ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 22 | 2015 අංක 03 මුල් ළමා විය සංවර්ධන ප්‍රඥප්තිය |

## ඌව පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| අනු අංකය | ප්‍රඥප්තිය |
|---|---|
| 1. | 1989-2 දරණ සමාජ සුභසාධන පුනරුත්ථාපන අරමුල් ප්‍රඥප්තිය |
| 2. | ඌව පළාතේ අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 3. | ඌව පළාතේ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය |
| 4. | 1990-8 දරණ ඌව පළාතේ මුදල් ප්‍රඥප්තිය |
| 5. | 1990-9 දරණ ඌව පළාතේ මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය |
| 6. | 1990-10 දරණ ඌව පළාතේ ආගමික හා සංස්කෘතික සංවර්ධන අරමුදල් ප්‍රඥප්තිය |
| 7. | 1991- ඌව පළාතේ පළාත් පාලන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය |
| 8. | 1991-2 දරණ ඌව පළාතේ හින්දු සංස්කෘතික කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය |
| 9. | 1991-3 දරණ ඌව පළාතේ හින්දු සංස්කෘතික කටයුතු පිළිබඳ අරමුදල් ප්‍රඥප්තිය |
| 10. | 1991-5 දරණ ඌව පළාතේ සමූපකාර සමිති සහ සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 11. | 1992-1 දරණ ඌව නවෝදා අරමුදල් ප්‍රඥප්තිය |
| 12. | 1992-3 දරණ බස් රථ මඟින් මඟී ප්‍රවාහන කිරීම පිළිබඳ ප්‍රඥප්තිය |
| 13. | 1995-2 දරණ අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය |
| 14. | 1996-1 ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය |
| 15. | ඌව පළාතේ ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 16. | 2000-1 දරණ ඌව ව්‍යවසාය සංවර්ධන ප්‍රඥප්තිය |
| 17. | ඌව පළාතේ කෘෂිකාර්මික නිෂ්පාදන මිළදී ගැනීම හා අලෙවිකරණ ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රඥප්තිය. |
| 18. | 2001-1 දරණ ඌව පළාතේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය |
| 19. | 2001 අංක 05 දරණ ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තිය |
| 20. | ඌව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 21. | 2003 අංක 03 දරණ විකල්ප බලශක්ති කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය |
| 22. | 2005 අංක 01 දරණ ඌව පළාත් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය |
| 23. | 2010 අංක දරණ ඌව පළාත් සභාවේ මාර්ග ප්‍රඥප්තිය |
| 24. | ඌව පළාත් සභාවේ 2010 අංක 04 දරණ ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 25. | ඌව පළාත් සභාවේ 2010 අංක 05 දරණ ඌව පළාත් ගෙවල් කුළී ප්‍රඥප්තිය |
| 26. | ඌව පළාත් සභාවේ 2010 අංක 06 දරණ ඌව පළාත් නිවාස සංවර්ධන ප්‍රඥප්තිය |
| 27. | ඌව පළාත් සභාවේ 2010 අංක 07 දරණ ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 28. | ඌව පළාත් සභාවේ 2010 අංක 08 දරණ ඌව පළාත් සමාජ සේවා ප්‍රඥප්තිය |
| 29. | ඌව පළාත් සභාවේ 2011 අංක 01 දරණ ඌව පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 30. | ඌව පළාත් සභාවේ 2011 අංක 02 දරණ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය |
| 31. | ඌව පළාත් සභාවේ 2011 අංක 03 දරණ ඌව පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තිය |
| 32. | ඌව පළාත් සභාවේ 2011 අංක 04 දරණ ඌව පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 33. | ඌව පළාත් සභාවේ 2011 අංක 05 දරණ ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය |
| 34. | ඌව පළාත් සභාවේ 2011 අංක 06 දරණ ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය |
| 35. | ඌව පළාත් සභාවේ 2011 අංක 07 දරණ කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය |
| 36. | ඌව පළාත් සභාවේ 2011 අංක 08 දරණ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්තිය |
| 37. | ඌව පළාත් සභාවේ 2011 අංක 09 දරණ ඌව පළාත් කර්මාන්ත සංවර්ධන ප්‍රඥප්තිය |
| 38. | ඌව පළාත් සභාවේ 2011 අංක 10 දරණ සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය |

| | |
|---|---|
| **39.** | ඌව පළාත් සභාවේ 2011 අංක 11 දරණ ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය |
| **40.** | ඌව පළාත් සභාවේ 2013 අංක 01 දරණ ළමා සංවර්ධන ප්‍රඥප්තිය |
| **41.** | ඌව පළාත් සභාවේ 2014 අංක 02 දරණ මූල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය |
| **42.** | ඌව පළාත් සභාවේ 2016 අංක 01 දරණ ඌව පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |

**උතුරු පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු**

| | |
|---|---|
| 01. | උතුරු පළාත් සභාවේ 2014 අංක 01 දරන මුදල් ප්‍රඥප්තිය |
| 02. | උතුරු පළාත් සභාවේ 2014 අංක 02 දරන මුද්දර ගාස්තු ප්‍රඥප්තිය |
| 03 | උතුරු පළාත් සභාවේ 2015 අංක 01 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය |
| 04. | උතුරු පළාත් සභාවේ 2015 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 05. | උතුරු පළාත් සභාවේ 2017 අංක 03 දරන බණිජ බද්ද ප්‍රඥප්තිය |

දකුණු පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| | |
|---|---|
| 01. | 1989 අංක 02 දරණ දුගී දුප්පත්කම දුරලීමේ ප්‍රඥප්තිය. |
| 02. | 1990 අංක 01 දරණ ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 03. | 1990 අංක 02 දරණ දකුණු පළාත් සභාවේ පළාත් පාලන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය |
| 04. | 1990 අංක 03 දරණ මුදල් ප්‍රඥප්තිය |
| 05. | 1990 අංක 04 දරණ දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තිය. |
| 06. | 1990 අංක 06 දරණ දකුණු පළාත් සභාවේ පළාත් පාලන ( කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය |
| 07. | 1990 අංක 07 දරණ දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය |
| 08. | 1991 අංක 01 දරණ දකුණු පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය |
| 09. | 1992 අංක 01 දරණ දකුණු පළාත් සභාවේ බස් රථ මගින් මගී ප්‍රවාහන කිරීම පිළිබඳ ප්‍රඥප්තිය |
| 10. | 1992 අංක 04 දරණ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 11. | 1994 අංක 04 දරණ දකුණු පළාත් සභාවේ මුද්දර ගාස්තු හරවීමේ ප්‍රඥප්තිය. |
| 12. | 1994 අංක 05 දරණ අධිකරණ දඩ පැනවීමේ ප්‍රඥප්තිය |
| 13. | 1995 අංක 01 දරණ දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය |
| 14. | 1996 අංක 01 දරණ දකුණු පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 15. | 1996 අංක 02 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය |
| 16. | 1998 අංක 01 දරණ සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 17. | 2000 අංක 01 දරණ රුහුණු සංචාරක කාර්යාංශ ප්‍රඥප්තිය |
| 18. | 2001 අංක 02 දරණ ආගමික, සාහිත්‍ය හා කලා සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය |
| 19. | 2002 අංක 01 දරණ කාර්මික සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 20. | 2002 අංක 02 දරණ සමාජ සේවා ප්‍රඥප්තිය |
| 21. | 2006 අංක 01 දරණ පුස්තකාල සේවා ප්‍රඥප්තිය |
| 22. | 2007 අංක 02 දරණ විකල්ප බලශක්ති පිළිබඳ ප්‍රඥප්තිය |
| 23. | 2007 අංක 04 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය |
| 24. | 2008 අංක 02 දරණ දකුණු පළාත් පෙර පාසල් ප්‍රඥප්තිය |
| 25. | 2008 අංක 03 දරණ දකුණු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය |
| 26. | 2008 අංක 05 දරණ පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 27. | 2008 අංක 06 දරණ පළාත් අනත් හා අත්හළ ළමා නිවාස පිළිබඳ ප්‍රඥප්තිය |
| 28. | 2009 අංක 01 දරණ දකුනු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය |
| 29. | 2012 අංක 02 දරණ ආයුර්වේද, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය |
| 30. | 2013 අංක 01 දරණ පළාත් බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය. |

නැගෙනහිර පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| | |
|---|---|
| 01. | නැගෙනහිර පළාත් සභාවේ 2008 අංක 01 දරන මුදල් ප්‍රඥප්තිය |
| 02. | නැගෙනහිර පළාත් සභාවේ 2009 අංක 02 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී ප්‍රඥප්තිය |
| 03 | නැගෙනහිර පළාත් සභාවේ 2010 අංක 01 දරන පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශ ප්‍රඥප්තිය |
| 04. | නැගෙනහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන මුද්දර ගාස්තු මාරු කිරීම් ප්‍රඥප්තිය |
| 05. | නැගෙනහිර පළාත් සභාවේ අංක 01 දරන උසාවි දඩ මුදල් ප්‍රඥප්තිය |
| 06. | නැගෙනහිර පළාත් සභාවේ 2013 අංක 02 දරන නිවාස අධිකාරී ප්‍රඥප්තිය |
| 07. | නැගෙනහිර පළාත් සභාවේ 2015 අංක 01 දරන සංචාරක කාර්යාංශ ප්‍රඥප්තිය |

බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිවලට අදාළ තොරතුරු

| | |
|---|---|
| 01. | 1989 අංක 04 දරණ බස්නාහිර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 02. | 1990 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය |
| 03 | 1990 අංක 03 දරණ බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය |
| 04. | 1990 අංක 04 දරණ බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය |
| 05. | 1990 අංක 05 දරණ බස්නාහිර පළාතේ අධ්‍යාපන ප්‍රඥප්තිය |
| 06. | 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය |
| 07. | 1990 අංක 07 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන බල මණ්ඩල (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය |
| 08. | 1991 අංක 01 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන (කාර්යය මණ්ඩල) ප්‍රඥප්තිය |
| 09. | 1991 අංක 03 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනික නිවාස ප්‍රඥප්තිය |
| 10. | 1991 අංක 04 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන අයතනවල අධීක්ෂණය කිරීමේ බලතල පවරාදීමේ ප්‍රඥප්තිය |
| 11. | 1991 අංක 07 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය |
| 12. | 1992 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය |
| 13. | 1993 අංක 01 දරණ බස්නාහිර පළාතේ ක්‍රීඩා ප්‍රඥප්තිය |
| 14. | 1994 අංක 01 දරණ බස්නාහිර පළාතේ සමුපකාර සේවා කොමිෂන් සභා ප්‍රඥප්තිය |
| 15. | 1994 අංක 02 දරණ බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය |
| 16. | 1994 අංක 03 දරණ බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය |
| 17. | 1994 අංක 03 දරණ බස්නාහිර පළාතේ උසාවි දඩ මුදල් හා දඩ පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය |
| 18. | 1998 අංක 02 දරණ බස්නාහිර පළාතේ පුස්තකාල ප්‍රඥප්තිය |
| 19. | 1998 අංක 03 දරණ බස්නාහිර පළාතේ සමුපකාර ප්‍රඥප්තිය |
| 20. | 1999 අංක 09 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය |
| 21. | 2000 අංක 06 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ ප්‍රඥප්තිය |
| 22. | 2000 අංක 08 දරණ බස්නාහිර පළාතේ සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය |
| 23. | 2002 අංක 06 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තිය |
| 24. | 2006 අංක 03 දරණ බස්නාහිර පළාතේ සමාජ සේවා ප්‍රඥප්තිය |
| 25. | 2007 අංක 01 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය |
| 26. | 2008 අංක 01 දරණ බස්නාහිර පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය |
| 27. | 2008 අංක 06 දරණ බස්නාහිර පළාතේ විකල්ප විදුලිවල ප්‍රඥප්තිය |
| 28. | 2010 අංක 01 දරණ බස්නාහිර පළාතේ සෞන්දර්යය නිකේතන පාලන අධිකාරී ප්‍රඥප්තිය |
| 29. | 2010 අංක 03 දරණ බස්නාහිර පළාතේ ගම්පහ ජනාධිපති ශිල්ප කළා ශාලිකාව සහ සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රීඩාංගනය පාලන අධිකීරි ප්‍රඥප්තිය |
| 30. | 2010 අංක 04 දරණ බස්නාහිර පළාතේ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය |
| 31. | 2010 අංක 06 දරණ බස්නාහිර පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය |
| 32. | 2010 අංක 009 දරණ බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය |

| | |
|---|---|
| 33. | 2010 අංක 10 දරණ බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරි සඳහ නිවාස හා ජංගම දුරකතන පහසුකම් ලබාදීම සඳහා වන ප්‍රඥප්තිය |
| 34. | 2011 අංක 05 දරණ බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා සහ සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය |
| 35. | 2012 අංක 01 දරණ බස්නාහිර පළාතේ කෘෂි සේවා අධිකාරී ප්‍රඥප්තිය |
| 36. | 2012 අංක 02 දරණ බස්නාහිර පළාතේ ඛණිජ බදු ප්‍රඥප්තිය |
| 37. | 2012 අංක 03 දරණ බස්නාහිර පළාත් සභාවේ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය |
| 38. | 2012 අංක 04 දරණ බස්නාහිර පළාතේ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය |
| 39. | 2013 අංක 01 දරණ බස්නාහිර පළාත් සභාවේ පෙර පාසල් ප්‍රඥප්තිය |
| 40. | 2013 අංක 02 දරණ බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය |
| 41. | 2013 අංක 03 දරණ බස්නාහිර පළාතේ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය |
| 42. | 2014 අංක 03 දරණ බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය |
| 43. | 2015 අංක .. දරණ බස්නාහිර පළාතේ බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තිය |